2017

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ තුළින් ප්‍රගතිය කරා
விஞ்ஞானம், தொழில்நுட்பம் மற்றும் ஆராய்ச்சியினூடான சாதனைகள்
Achievements through Science, Technology and Research

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

விஞ்ஞான, தொழில்நுட்பவியல் மற்றும் ஆராய்ச்சி அமைச்சு

Ministry of Science, Technology and Research

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

2017

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ තුළින් ප්‍රගතිය කරා

පටුන

පිටු අංකය

හැඳින්වීම 1

පැතිකඩ 2

අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන්

- තාක්ෂණ පැවරුම් වැඩසටහන 4
- විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන් 8

අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන්

- නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී.ක්ලාක් ආයතනය (ACCIMT) 28
- කාර්මික තාක්ෂණ ආයතනය (ITI) 32
- ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) 38
- ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) 42
- ජාතික විද්‍යා පදනම (NSF) 47
- ජාතික පර්යේෂණ සභාව (NRC) 51
- ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC) 56
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) 59
- අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) 63
- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC) 66
- ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC) 71
- ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය 77

මූල්‍ය ප්‍රගතිය 80

හැඳින්වීම

ශ්‍රී ලංකාව සෞඛ්‍යාරක්ෂණය සහ අධ්‍යාපනය වැනි ඇතැම් ක්ෂේත්‍රයන්හි විශිෂ්ට මට්ටමක් ළඟාකරගෙන ඇති නමුදු, දැනුම මත පදනම් වූ ආර්ථිකයක්ද, ඵලදායී ආර්ථික වර්ධනයක්ද සහතික කිරීමට සමත් යටිතලයන් ද ඇතුළත් වූ තාක්ෂණික ප්‍රගමනයන්හි වර්ධනයක් අත්කර ගැනීමේ අවශ්‍යතාව තවදුරටත් පවතී. තාක්ෂණික ප්‍රගමනයන් සඳහා මං පැදෙනුයේ නවෝත්පාදන පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම හරහාය. නවෝත්පාදනය අර්ථ දක්වා ඇත්තේ වෙනස්වීම සඳහා ප්‍රතිචාර දැක්වීමට සහ ඒ හා අනුගත වීමට ඇති හැකියාව ලෙසය. ගෙවීගිය වසර කිහිපය තුළ නව ව්‍යාපාරයන් සහ ව්‍යාවසායකත්වයන් බිහිවීමේ වර්ධනය වන ප්‍රවණතාවක් පැවතියද ඒවා ගෝලීය මට්ටම කරා ළඟා වීමෙන් තොරව තවදුරටත් දේශීය මට්ටමින් පවතිනු පෙනේ. ගෝලීය වෙළඳපළ සමඟ තරඟ කිරීමේදී , පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්ට අමතරව මෙරට විසින් ව්‍යාපාර සහ ක්‍රියාවලි ක්ෂේත්‍රය හා අදාළව නව තාක්ෂණයන් සහ නවෝත්පාදපන චින්තනයන් අනුගමනය කිරීම වැදගත් වේ.

පර්යේෂණ හා සංවර්ධන, නවෝත්පාදන හා නව නිපැයුම් සහ නිෂ්පාදන සැලසුම් නිර්මාණ ඉංජිනේරු ශිල්පය හරහා ජාතික සංවර්ධන අරමුණු සඳහා දායකත්වය දැක්වීමේදී සැලකිය යුතු කාර්යභාරයක්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය (MOSTR) වෙත පැවරී ඇත. මෙය හඳුනාගනිමින්, ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ සහ නවෝත්පාදන පිළිබඳ අවධානය යොමු වූ කර්මාන්ත පර්යේෂණ සහයෝගීතාවයන් ප්‍රවර්ධනය කිරීමටත්, තාක්ෂණික ව්‍යවසායකත්වයන් සඳහා මූල්‍යමය සහ තාක්ෂණික සහාය ලබාදීම හරහා ඒ සඳහා හිතකර පරිසරයන් නිර්මාණය කරදීමටත් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් විශේෂයෙන් පියවර ගනු ලැබේ. එමෙන්ම ජෛව තාක්ෂණය, නිනිති තාක්ෂණය, රොබෝ විද්‍යාව, කෘත්‍රිම බුද්ධිය යනාදි නැගී එන තාක්ෂණයන් වැඩිදියුණු කිරීමට සහ ඒ හා අනුගත වීමටත් විශේෂ අවධානය යොමු කෙරේ. විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත (STEM අධ්‍යාපනය) විෂයන් ප්‍රවර්ධනය, අදාළ රේඛීය අමාත්‍යාංශ හා සහයෝගීතාවයෙන් තාක්ෂණය මත පදනම් වූ විෂයමාලාවක් සංවර්ධනය කිරීම වැනි විවිධ මූලාරම්භයන් හරහා සෑම මට්ටමකින්ම විද්‍යාව ප්‍රචලිත කරවීමට පියවර ගැනේ. සාරාංශයක් ලෙස ගත්කළ අමාත්‍යාංශය විසින් පර්යේෂණ කර්මාන්ත සහයෝගීතාවයන් සහ ආර්ථික වර්ධනය උදෙසා තාක්ෂණය පදනම් කරගත් ඉඩ ප්‍රස්ථා නිර්මාණය කිරීම අතර සබඳතාවක් ගොඩනැංවීමට ඉහළම ප්‍රමුඛතාව අඛණ්ඩව ලබාදීම සිදුකොට ඇත.

රජය විසින් පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයන්හි සිදු කෙරෙන ආයෝජනයන් සඳහා සෑමවිටම ලැබෙනුයේ අඩු ප්‍රමුඛතාවක් බවට මතයක් පවතී. එනම්, UNESCO වාර්තාවකට අනුව, කලාපීය රටවල් විසින් දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.41% ක් මේ සඳහා වෙන් කරන මුත්, ශ්‍රී ලංකාව විසින් වෙන් කෙරෙනුයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.1 ක් පමණි. තවද ශ්‍රී ලංකාව විසින් වඩා විශාල ආර්ථික ප්‍රතිලාභ අත්කර ගැනීමට සහ අධි තාක්ෂණික අපනයනයන් සඳහා, නැගී එන තාක්ෂණයන් යොදා ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව දැඩි ලෙස අවධානය යොමුකොට නොමැති බවටද චෝදනාවක් පවතී. මෙම සාම්ප්‍රදායික ප්‍රවේශයන්, පරිවර්තනයකට ලක්කරමින්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ඍජු මාර්ගෝපදේශකත්වය යටතේ, නැගී එන තාක්ෂණයන් සහ අධි තාක්ෂණික අපනයනයන් පිළිබඳ අවධානය යොමුකෙරෙන විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට හැකියාව ලැබී ඇත. මේ සඳහා, සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතිය, යෝජිත ශ්‍රී ලංකා ජෛව තාක්ෂණය ආයතනය ස්ථාපනය කිරීම, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් තාක්ෂණ බීජෞෂණ පහසුකම් ලබාදීම, නවෝත්පාදන කඩිනම් කරවීමේ අරමුදල් ලබාදීමේ යාන්ත්‍රණය යනාදිය ඇතුළත් වේ.

වඩා සංකීර්ණ නිෂ්පාදන හැකියාවන් අත්කර ගැනීමේදී ඒ සඳහා පෞද්ගලික අංශයන්, කර්මාන්ත සංගම්, රාජ්‍ය පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල යනාදිය අතර සවිමත් සහයෝගීතාවයන් ගොඩනංවා ගැනීම අවශ්‍ය කෙරේ. මෙය අවබෝධ කරගනිමින් සෑම පාර්ශවයක් විසින්ම භාවිතා කළ හැකි උසස් තත්ත්වයේ විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරිම සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සුවිශාල ආයෝජනයන් සිදුකර තිබේ. මෙයට අමතරව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හා සහයෝගීතාවයෙන්, සමාජීය නවෝත්පාදන විද්‍යාගාරයක් මෑතකදී ආරම්භ කරනු ලැබ ඇති අතර ඒ හරහා නව අදහස්, ප්‍රතිපත්තීන් සහ ක්‍රමෝපායයන්, පාලනය කරනු ලැබූ පරිසරයක් තුළ අත්හදා බැලීමට, තහවුරු

කිරීමට සහ නවෝත්පාදනයනට අවකාශ සැලසෙනු ඇති අතර ආරම්භයේ සිටම පුරවැසියන් වෙත තොරතුරු ලබාදීමටද හැකියාව උදාවනු ඇත. මෙම යාන්ත්‍රණය හරහා, විවිධ සමාජ කණ්ඩායම් අතර ඒකරාශී කරගැනීමේ හැඟීම ප්‍රවර්ධනය කෙරෙන අතර එහිදී නව ප්‍රතිපත්තීන් සහ අදහස්, ඒවා ක්‍රියාත්මක කරනු පිණිස යෝජනා කිරීමට පෙර ඇගයීමට හා ඒ සඳහා එකඟත්වය පළ කිරීමට, ජන සමාජයට අවස්ථාව උදාවේ.

විද්‍යාත වැඩසටහනෙහි අඛණ්ඩ වැඩිදියුණු කිරීම කෙරෙහිද අමාත්‍යාංශයේ අවධානය යොමුවිණි. පෙර වර්ෂයේදී ආරම්භ කරනු ලැබූ විද්‍යාත නිෂ්පාදන සහතිකකරණය, විද්‍යාත ව්‍යවසායකයින් බිහි කිරීම සහ මූල්‍ය සහ අලෙවිකරණ පහසුකම් සඳහා ප්‍රවේශයන් නිර්මාණය කරදීම යනාදී මූලාරම්භයන් කිහිපයක් අඛණ්ඩව ඉදිරියට රැගෙන යන ලදි. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින්, තාක්ෂණ බිජෞෂණ සේවා මධ්‍යස්ථානයක් (TISC) නිර්මාණය කිරීමේ කාර්යයෙහි දැනට නිරතව සිටින අතර මෙය තෝරාගනු ලැබූ විද්‍යාත සම්පත් මධ්‍යස්ථාන හරහා නියාමක පරිමාණයෙන් ක්‍රියාත්මක කරවීම සඳහා පියවර ගැනෙනු ඇත.

ඉන්දියාව, චීනය, බෙලරුසියාව, ස්ලොවේනියාව, ජපානය හා පකිස්ථානය යන රටවල් සමඟ සිදුකළ ද්විපාර්ශවික සාකච්ඡාවක් හරහා සිය ජාත්‍යන්තර සහයෝගීතා ප්‍රයත්නයන් ශක්තිමත් කර ගැනීමටද අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබිණි. ඉන්දියාව, චීනය සහ පකිස්ථානය සමඟ ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් දැනටමත් සිදු කෙරෙමින් පවතී. චීනය සමඟ සහයෝගීතාවයෙන් ඒකාබද්ධ ජෛව තාක්ෂණ විද්‍යාගාරයක් ස්ථාපනය කිරීමට කටයුතු කෙරේ.

2016 ඔක්තෝම්බර් සිට 2017 සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයක් විසින් දියත් කරනු ලැබූ ප්‍රතිපත්තිමය මූලාරම්භයන් හා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්හි භෞතිකමය සහ මූල්‍යමය ප්‍රගතිය මෙම වාර්තාවට ඇතුළත් වේ.

පැතිකඩ

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 44 (1) (අ) වගන්තිය හා අනුකූලව අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදුකරනු ලැබූ විෂයයන් හා කාර්යයන් පැවරීම ප්‍රකාර විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය වෙත පහත විෂයයන් කාර්යයන් සහ ආයතනයන් පැවරේ.

විෂයයන් හා කාර්යයන්:

1. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ විෂයයට අදාළව සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථාවන් යටතට පමුණුවා ඇති විෂයයන්ට අදාළව ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් සම්පාදනය, නිරීක්ෂණය, සුපරීක්ෂණය සහ ඇගයීම.
2. ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සිදුකෙරෙන පර්යේෂණයන්හි නව සොයාගැනීම් හා අනුගත වන පරිදි දේශීය පර්යේෂණයන් සහ සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
3. විද්‍යාත්මක, කාර්මික සහ සංවර්ධන ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා පියවර ගැනිම.
4. පර්යේෂණ ආයතනයන් වෙත පර්යේෂණ සැලසුම් කිරීම සහ පැවැත්වීම සඳහා පහසුකම් සපයාදීම.
5. නිනිති තාක්ෂණ සහ ජෛව තාක්ෂණය ඇතුළත්ව නව පර්යේෂණයන් සහ අනාවරණය කරගැනීම තුළින් ලද සොයාගැනීම් සහ දැනුම පිළිබඳ තොරතුරු, ව්‍යාපාරික ප්‍රජාවද ඇතුළත්ව අදාළ පාර්ශවයන් වෙත ලබාදීම.
6. ප්‍රමිතීන් ස්ථාපනය සහ පරිපාලනය හා සම්බන්ධිත ක්‍රියාකාරකම්
7. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණ ආයතනයන් විසින් පවත්වනු ලබන පර්යේෂණ වැඩසටහන් සඳහා තාක්ෂණික සහායය ලබාදීම.
8. නව සොයාගැනීම් වෙත ප්‍රජාවන් යොමුකිරීම සඳහා මාර්ගෝපදේශකත්වය ලබාදීම සහ අභිප්‍රේරණය කිරීම සඳහා පියවර ගැනීම
9. ඉදිකිරීම් කර්මාන්තය ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම
10. අමාත්‍යාංශය යටතට පමුණුවා ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලු විෂයයන් හා අදාළ කරුණු
11. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් අධීක්ෂණය කිරීම

ආයතනයන්:

1. නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය
2. කාර්මික තාක්ෂණ ආයතනය
3. ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
4. ජාතික මූලික අධ්‍යයන ආයතනය
5. ජාතික විද්‍යා පදනම
6. ජාතික පර්යේෂණ සභාව
7. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම
8. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
9. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
10. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
11. ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ (පෞද්) සමාගම
12. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරය සපුරාලීමේදී, පහතින් සඳහන් කර ඇති දැක්ම සහ මෙහෙවර හා අනුකූලව අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ.

පෙර දැක්ම

2020 වර්ෂයේදී විද්‍යාව හා තාක්ෂණයෙන් උසස් රටක් බවට ශ්‍රී ලංකාව පත්කිරීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනයට අත්‍යවශ්‍ය වූ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීම හා ආර්ථික ක්‍රියාදාමයන් පුළුල් කිරීම සඳහා, විද්‍යාත්මක පර්යේෂණ සංවර්ධනය සහ තාක්ෂණ පැවරුම් ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමට සහ ප්‍රචලිත කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියත්මක කිරීම.

පැවරී ඇති කාර්යයන් සපුරාලනු පිණිස, 1029 දෙනෙකුගෙන් සමන්විත කාර්යමණ්ඩලයක් අමාත්‍යාංශය සඳහා අනුමත වී ඇති අතර දැනට 1004 දෙනෙකුගෙන් සමන්විත කාර්යමණ්ඩලයක් හරහා අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ. අමාත්‍යංශයේ දැනට සිටින කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් අතුරින් 796 දෙනෙක් දිවයින පුරා පිහිටුවා ඇති විද්‍යාතා මධ්‍යස්ථාන 266 ක සේවයේ යෙදී සිටිති.

2017 වර්ෂය සඳහා අමාත්‍යාංශය සහ එහි ආයතන සඳහා සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීම රුපියල් මිලියන 3930.23 ක් වන අතර 2017 සැප්තැම්බර් අවසානය වන විට රුපියල් මිලියන 1373.58 ක් වියදම් කර ඇත.

අයවැය යෝජනා හරහා අනුමත වූ, විශේෂ ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.3 ක ප්‍රතිපාදන 2017 වසර තුළදී අමාත්‍යාංශය වෙත වෙන්කර දී ඇත. මෙම සියලු යෝජනා සැකසීමේදී, සැලසුම් නිර්මාණයේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ඉහළ මට්ටමේ තාක්ෂණික දැනුමක් අවශ්‍ය කෙරෙන බැවින්, අවශ්‍ය තාක්ෂණික තොරතුරු සමඟ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කරනු පිණිස සැලකිය යුතු කාලයක් වැය කිරීමට සිදුවිණි. මේ හේතුවෙන්, වෙන්කර දී ඇති සමස්ත අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයම භාවිතයට ගැනීමට අමාත්‍යාංශයට නොහැකි විණි. කෙසේ වුවද, සිවිල් ඉදිකිරීම් සංරචකය ඇතුළත් වන සියලුම ව්‍යාපෘතීන්ට පාහේ, මූලික ගෙවීම් සිදු කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබිණි. අමාත්‍යාංශය විසින්, ලබන වසරේදී මෙම සමස්ත ඉදිකිරීම් ක්‍රියාවලිය වේගවත් කරවීමේ කඩිනම් සැලසුමක් වැඩිදියුණු කරනු ලැබ ඇති අතර වත්මනදී, මෙම සැලසුම හා අනුකූලව කටයුතු කෙරේ. මෙම කාර්යය සඳහා අදාළ ක්‍රියාකාරි සැලසුම්ද දැනටමත් වැඩි දියුණු කරනු ලැබ ඇත. අමාත්‍යාංශයේ සහ ආයතනයන්හි, ක්‍රියාකරකම්හි ප්‍රගතිය කලින් කලට සුපරීක්ෂණය කෙරෙන අතර ප්‍රතිඵල මත පදනම් වූ කාර්යසාධනයක් සහතික කරනු පිණිස අභ්‍යන්තර විගණනයන්ද නිතිපතා සිදු කෙරේ.

I කොටස
අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන්

1. තාක්ෂණ පැවරුම් වැඩසටහන (විදාතා වැඩසටහන)

1.1 පසුබිම

2000 වසරේදී ආරම්භ කරනු ලැබූ විදාතා තාක්ෂණ පැවරුම් වැඩසටහන, ග්‍රාමීය ආර්ථිකය ඉහළ නංවමින්, ජාතික ආර්ථිකය සංවර්ධනය සඳහා එමඟින් ලැබෙන දායකත්වය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් ආරම්භ කරන ලදි. මෙම වැඩසටහන යටතේ, විද්‍යාඥයින් සහ ඉංජිනේරුවන් සතු විද්‍යාත්මක දැනුම සහ පර්යේෂණ නවෝත්පාදනයන් දිවයින පුරා ව්‍යාප්ත වූ විදාතා මධ්‍යස්ථාන (VRC) ජාලයක් හරහා, ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් වෙත බිම් මට්ටමින් ලබා දේ. ග්‍රාමීය ජනතාවගේ නිර්මාණශීලී සහ කුසලතා හැකියාවන්, ඔවුන්ගේම ආර්ථික සංවර්ධනය සඳහා දායක කරගැනීමට මේ හරහා අපේක්ෂා කෙරේ. මේ සඳහා ග්‍රාමීය ප්‍රජාවගේ තත්ත්වයෙන් උසස් නිෂ්පාදන, වෙළඳපල වෙත හඳුන්වාදීම හරහා ග්‍රාමීය ජනතාව වෙත ස්ථාවර ආදායමක් සහතික කිරීමද මෙම වැඩසටහන තුළින් අපේක්ෂිතය.

මෙම අරමුණ සපුරාගැනීම පිළිබඳ අවධානය යොමුකරමින්, අමාත්‍යාංශය විදාතා සම්පත් මධ්‍යස්ථාන 266 ක්, 850 ක පමණ පිරිස් බලයෙන් යුතුව, දිවයින් පුරා ස්ථාපනය කිරීමට පියවර ගෙන ඇත. මෙම විදාතා සම්පත් මධ්‍යස්ථාන බහුතරයක් සඳහා, බේකරි උදුන, යෝගට් ඉන්කියුබේටරය, එළවළු වියළන යන්ත්‍රය සහ පොල්තෙල් නිස්සාරන යන්ත්‍රය යනාදිය සපයාදී ඇත. මෙම විදාතා සම්පත් මධ්‍යස්ථානයන්, විද්‍යා හා තාක්ෂණ නිළධාරියෙකු හා ක්ෂේත්‍ර සම්බන්ධීකාරක, පරිගණක ක්‍රියාකරු සහ කාර්යාල සහායක ඇතුළත් සහායක කාර්ය මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වේ.

1.2 ප්‍රගතිය

1.2.1 තාක්ෂණ පැවරුම් හා දැනුම්වත් කිරීම

විදාතා සම්පත් මධ්‍යස්ථාන විසින් සමාජීය අවශ්‍යතාවයන් මත පදනම්ව, තාක්ෂණ පැවරුම් වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව මෙම කාලච්ඡේදය තුළ, ආහාර, ද්‍රව්‍ය, රසායනික සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි වැඩසටහන් 3415 ක් පවත්වන ලදි. තාක්ෂණ පැවරුම් වැඩසටහන්හි සාරාංශයක් පහත දක්වා ඇත.



තාක්ෂණ පැවරුම් වැඩසටහන්ව වලට අමතරව විවිධ තාක්ෂණයන් පිළිබඳව ප්‍රජාව දැනුම්වත් කිරීම මෙන්ම විද්‍යාත්මක තොරතුරු අවශ්‍ය කෙරෙන ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් ලබා දීමට විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන මඟින් පියවර ගනු ලැබේ. ඒ අනුව, මෙම කාලච්ඡේදය තුළ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 1911 ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. පසුගිය වසර තුන ඇතුළත පවත්වනු ලැබූ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පහතින් දක්වා ඇත.



විශේෂ අවධානය යොමු වූ ව්‍යාපෘති

නව තාක්ෂණයන් ප්‍රචලිත කරවීම සහ සමාජයේ දිනෙන් දින මතුව එන අවශ්‍යතාවයන් සඳහා විසඳුම් ලබාදීම අරමුණු කරගනිමින්, ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමාගේ මාර්ගෝපදේශකත්වය යටතේ, විශේෂ අවධානයක් යොමුකෙරෙන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට, විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන විසින් පියවර ගනු ලැබිණි.

මෙම කාලච්ඡේදය තුළ එලෙස ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතීන් පහතින් දක්වා ඇත.

1.2.2 විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපතීන්

ව්‍යාපෘති නාමය	විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
හඳුන්කූරු නිෂ්පාදනය	නාත්තන්ඩිය, සන්දිලිපායි සහ මහර	34
අභ්‍යාස පොත් නිෂ්පාදනය	මඳුරුවල	10
ඉටිපන්දම් නිෂ්පාදනය	ගම්පහ	06
යාන්ත්‍රිකව තලගුලි නිෂ්පාදනය	මහර	01
යෝගට් නිෂ්පාදනය සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම	දොම්පේ	01
කිරි ආශ්‍රිත නිෂ්පාදන	මන්නාරම නගරය	06
බිම්මල් බීජ නිෂ්පාදනය	මාවනැල්ල	110
"අපේ මෙහෙවර ඔබේ දැනට" කෙටි පණිවිඩ සේවය මත පදනම් වූ තොරතුරු බෙදා ගැනීම	ඉපලෝගම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල සාමාන්‍ය ජනතාව
දැල් නිවාස තුළ සිදුකෙරෙන කැපුම් මල් වගාව	පඩුවස්නුවර - නැගෙනහිර	
පන් ආශ්‍රිත නිෂ්පාදන	අඟුණුකෙළෙපැලැස්ස	07
බොරෝන් ප්‍රතිකර්මය යෙදූ උණබට	අඟුණුකොළපැලැස්ස	6

වැල් දොඩම් වගාව සහ පැළ තවාන	ඕකේවෙල	75
විදාතා කුටිය සඳහා අලෙවි පහසුකම්	තුම්පනේ	58
සත්ත්ව ආහාර නිෂ්පාදන	මීණිපේ	01
ජෛව වායු ඒකකය	නොච්චියාගම	01
පාවහන් නිෂ්පාදනය	මිල්ලනිය	05

විදාතා ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම හා ඔවුන්ට සිය නිෂ්පාදනයන් අලෙවි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම, විදාතා වැඩසටහන විසින් දැනටමත් ආරම්භ කර ඇති කාර්යයන් වේ. මෙම කාලච්ඡේදය තුළ එවැනි නව ව්‍යවසායකයින් 46 දෙනෙකු ලියාපදිංචි කරනු ලැබීණි. ඔවුන් මුහුණ පා සිටින ඔවුන්ගේ නිෂ්පාදන හා සම්බන්ධිත තාක්ෂණික ගැටලු සඳහා විසඳුම් ලබා දෙනු පිණිස, කොළඹ, ගම්පහ, කළුතර, රත්නපුර, කෑගල්ල, මහනුවර, බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි තාක්ෂණ සායන පවත්වන ලදි. මෙම සායන සඳහා ව්‍යාවසායකයින් 612 ක් පමණ සහභාගී විණි. ඔවුනට විශේෂිත වූ ගැටලු සඳහා විසඳුම් ලබාදීමේදී, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, කාර්මික තාක්ෂණ ආයතය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය යන ආයතනයන්ගේ වැඩිදුර සහායය හිමිවිණි. චීනයේ පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර කැන්ටන් වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගීත්වය දක්වනු පිණිස විදාතා ව්‍යාවසායකයින් පස් දෙනෙකු, දැනටමත් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තෝරාගෙන ඇත.



කාර්මික තාක්ෂණ ශ්‍රවණාගාරයේදී පැවති තාක්ෂණ සායනය

1.2.3 විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීම

දැනුම මත පදනම් වූ ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, විද්‍යා , තාක්ෂණ හා නවෝත්පාදන අංශයේ විවිධ අංග සම්බන්ධ අත්දැකීම් සහ දැනුම හුවමාරු කර ගැනීමේ අවකාශ සලසාදෙමින් “ජාතික විදාතා ජාලය වෙබ් අඩවිය, භාෂා ත්‍රිත්වයෙන්ම පළ කරනු ඇත. ප්‍රභාෂ්වර නම්, මෙම කාර්යය සඳහා වෙන් වූ බ්ලොග් පිටුවක්ද ක්‍රියාත්මක වේ. (http://vidathanet.Blog.spot.com/p/vidatha.html.) පසුගිය වර්ෂ පහ තුළ, විවිධ තේමාවන් යටතේ පළවූ බ්ලොග් ලිපිවල සාරාංශයක් පහතින් දක්වා ඇත.



විදාතා ජාලය පුළුල් කිරීමේ අරමුණින් මෙම කාලච්ඡේදය තුළ පාදුක්ක සහ කන්තලේ විදාතා සම්පත් මධ්‍යස්ථාන දෙකක් විවෘත කරන ලදි.

කන්තලේ විදාතා සම්පත් මධ්‍යස්ථානය

පාදුක්ක විදාතා සම්පත් මධ්‍යස්ථානය

වෙනත් සංවර්ධන මූලාරම්භයන්

- තාක්ෂණය මත පදනම් වූ විදාතා නිෂ්පාදනයන් සඳහා වෙළඳපළ ප්‍රවේශ පහසුකම් ලබාදීමේ අරමුණින් පවත්වනු ලබන විදාතා හරිත කඩමණ්ඩිය, කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කයන්හි පවත්වනු ලැබිණි.
- ජනාධිපති ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කෙරෙන "තිරසර යුගයක තෙවසර ඇරඹුම" වැඩසටහන යටතේ කොට්ඨාස මට්ටමින් රුක් රෝපණ වැඩසටහන් 15 ක් ක්‍රියාත්මක කරන ලදි.

1.3 2018 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකරකම්

- විදාතා සම්පත් මධ්‍යස්ථාන හරහා තාක්ෂණය පවරාදීම
    - තාක්ෂණ පැවරුම් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්
    - ආහාර, ඖෂධීය ශාක, කෘෂිකර්මය සහ විද්‍යුත් ක්ෂේත්‍රයේ නියාමක පරීක්ෂා විද්‍යාගාරයන් ස්ථාපනය කිරීම
    - ඇසුරුම්කරණය පොලිතීන් සඳහා විකල්ප වැනි ගම් මට්ටමින් ක්‍රියාත්මක ප්‍රජා අවශ්‍යතාවයන් ඉලක්ක කරගත් විශේෂ ව්‍යාපෘතීන්
    - තාක්ෂණ සායන
    - විදාතා හා තාක්ෂණ නිළධාරීන් හරහා බිම් මට්ටම දක්වා විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත STEM අධ්‍යාපන වැඩසටහන පුළුල් කිරීම

2. විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන්

2.1 පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ සිදුකළ අයෝජනයන්

ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව යටතේ හඳුනාගනු ලැබ ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සපයනු පිණිස, අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ පර්යේෂණ සම්මන්ත්‍රණ 11 ක් සංවිධානය කරන ලදි.

(I) ''ස්වභාවික නිෂ්පාදනයන්හි ප්‍රවේණි විද්‍යාව සහ ඖෂධ අනාවරණය කර ගැනීම'' පිළිබඳ පළමු ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, කොළඹ විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨය හා සහයෝගීතාවයෙන් ''පිළිකා සහ ප්‍රදාහයන් පිළිබඳ මූලික සහ පරිවර්තිත පර්යේෂණ'' යන තේමාව යටතේ, 2017 ජූලි 10, 11 දිනයන්හිදී කොළඹදී පවත්වන ලදි.

(II) ''ගෝලීය පරිසර තුළ වෙනස් වන බලවේග: අභියෝග සහ අවස්ථා පිළිබඳ දසවැනි ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල සම්මන්ත්‍රණය සමඟ සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලැබීණි.

(III) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨයේ සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලැබූ තේ, ශෂ්‍ය විද්‍යාව සහ පිරිසැකසුම යන අංශයන්හි ප්‍රගමනයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2017 අගෝස්තු 12, 13, දිනයන්හිදී පවත්වන ලදි.

(IV) රජරට විශ්වවිද්‍යාලයේ නව වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය - 2017, අමාත්‍යාංශයේ සම සංවිධානත්වයෙන් 2017 අගෝස්තු 31 දින පවත්වන ලදි.

(V) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි (PGIS) සම සංවිධානකත්වය යටතේ ''පෘථිවි සහ පරිසර විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ගණිතය සහ සංඛ්‍යානය, ජීව විද්‍යා, භෞතික විද්‍යා සහ විද්‍යා අධ්‍යාපනය'' යන තේමාව යටතේ, 2017 සැප්තැම්බර් 8, 9 දිනයන්හිදී සම්මන්ත්‍රණයක් මහනුවරදී පවත්වන ලදි.

(VI) ''ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය සමඟ සහයෝගීතාවයෙන්, බහුවිෂයානුබද්ධ පර්යේෂණ - 2017'' පිළිබඳ හතර වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සංවිධානය කරනු ලැබිණි. මෙම වැඩසටහන 2017 සැප්තැම්බර් 21 සිට 23 දක්වා හික්කඩුවේදී පවත්වන ලදි. සම්මන්ත්‍රණයේ ප්‍රධාන තේමාව වූයේ ''තිරසර සංවර්ධනය සඳහා සුවිශාල බලපෑම් පර්යේෂණ'' යන්නයි.

(VII) 22 වන ජාත්‍යන්තර වන සංවර්ධන සහ පාරිසරික සම්මන්ත්‍රණය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වන සංවර්ධන සහ පාරිසරික විද්‍යා අංශයේ සම සංවිධායකත්වය යටතේ, 2017 නොවැම්බර් 10, 11 දිනයන්හිදී පැවැත්වීමට නියමිතය.

(VIII) ජාතික සංවර්ධනය උදෙසා විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදනයන්හි විද්‍යාඥයින් සතු කාර්යභාරය: සම්ප්‍රදායික දැනුම භාවිතය සහ ඛනිජ සම්පත් සඳහා වටිනාකම් එක් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයක්, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය හා සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලැබ 2017 සැප්තැම්බර් 15 දින කොළඹදී පවත්වනු ලැබිණි.

(IX) ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) හා සහයෝගීතාවයෙන්, ''පාසල්හි විද්‍යා ක්‍රියාකාරකම් ඉහළ නැංවීම'' සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් (පළාත් වැඩසටහන්) සංවිධානය කෙරේ. මෙම වැඩසටහන් මාලාවේ පළමු වැඩසටහන, 2017 ඔක්තෝම්බර් 10 සහ 11 යන දිනයන්හිදී, වයඹ පළාතේ ඉබ්බාගමුව අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයේදී පවත්වනු ලබයි.

(X) ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම (CAUST 2017) පිළිබඳ පස් වෙනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනය හා සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලැබිණි. මේ හරහා, ආයුර්වේද සහ ශාක ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ට පර්යේෂකයින්,

විද්වතුන්, වෛද්‍යවරුන්, සාම්ප්‍රදායික සහ වෛද්‍ය වෘත්තිකයින්, නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් හට සිය දැනුම සහ අත්දැකීම් බෙදා හදා ගැනීමට, වේදිකාවක් සැපයිණි. මෙම වැඩසටහන 2017 ඔක්තෝබර් 27 සිට 29 දක්වා පැවැත්විණි.

(XI) යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සමඟ සහයෝගීතාවයෙන් ''වියළි කලාපීය කෘෂිකර්මය - 2017 (ICDA – 2017'' පිළිබඳ තුන් වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සංවිධානය කරනු ලැබිණි. මෙම වැඩසටහන, 2017 නොවැම්බර් 1 සහ 2 දිනයන්හිදී යාපනයේදී පැවැත්වීමට නියමිතය.

2.2 විද්‍යාව ප්‍රචලිත කිරීම

STEM අධ්‍යාපන සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත (STEM) අධ්‍යාපනය සංවර්ධනය අරමුණු කරගනිමින් වැඩසටහන් මාලාවක් සංවිධානය කරනු ලැබ ඇත.

STEM අධ්‍යාපනය සංවර්ධනය උදෙසා, සියලු පාර්ශවකරුවන් අතර පොදු එකඟතාවයක් ගොඩනංවා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුමක් සැකසීම අරමුණු කරගනිමින්, 2017 ජනවාරි 26 සිට 28 දක්වා, නර්ඩ් මධ්‍යස්ථානයේදී වැඩසටහන් පවත්වන ලදි. මෙම වැඩසටහන හරහා ඉලක්ක කරගනු ලැබූ පිරිස වූයේ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (විද්‍යා) සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ අදාළ ආයතනයන්හි නිළධාරීන්ය.

ඒ අනුව, STEM අධ්‍යාපනය ඉහළ නැංවීම සහ ප්‍රචලිත කරවීම සඳහා, පළාත් මට්ටමේ සම්මන්ත්‍රණ තුනක් (දින තුනක් බැගින්) අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලැබිණි.

මෙම සම්මන්ත්‍රණය හරහා ඉලක්කගත පිරිස වූයේ දිවයින් පුරා විද්‍යා අධ්‍යාපන නිළධාරීන් සහ විද්‍යා අධ්‍යාපනය පිළිබඳ ගුරු උපදේශකයින්ය. සෑම සම්මන්ත්‍රණයක් සඳහාම, නිනිති තාක්ෂණය, ජෛව තාක්ෂණය, කෘත්‍රිම බුද්ධිය, අභ්‍යවකාශ තාක්ෂණය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ උසස් තත්ත්වයේ විද්‍යාගාර යටිතලයන් පිළිබඳ සංවාද මණ්ඩප සහ කාර්මික තාක්ෂණ ආයතනය, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය සහ ස්ලින්ටෙක් වෙත සිදුකළ ක්ෂේත්‍ර අනාවරණයන්ද ඇතුළත් විණි.

- මින් පළමු සම්මන්ත්‍රණය 2017 ජුනි 28 සිට ජුලි 01 දක්වා, කොළඹදී පවත්වනු ලැබූ අතර, මේ සඳහා වයඹ සහ උතුරු මැද පළාත්හි විද්‍යා අධ්‍යාපන නිළධාරීන් සහ ගුරු උපදේශකයින් 150 දෙනෙකුගේ සක්‍රීය සහභාගීත්වය ලැබිණි.

- STEM අධ්‍යාපන සංවර්ධනය උදෙසා සංවිධානය කරනු ලැබූ දෙවන සම්මන්ත්‍රණය, 2017 ජුලි 04 සිට 07 දක්වා, සබරගමුව, දකුණු සහ බස්නාහිර පළාත්හි, පළාත් සහ කලාප මට්ටමේ විද්‍යා අධ්‍යාපන නිළධාරීන් සහ ගුරු විද්‍යා උපදේශකයින් 150 දෙනෙකු සඳහා, කොළඹදී පවත්වන ලදි.

- STEM අධ්‍යාපන සංවර්ධනය අරමුණු කරගත් තුන්වන සම්මන්ත්‍රණය, 2017 ජූලි 12 සිට 15 දක්වා, නැගෙනහිර, උතුරු සහ ඌව පළාත්හි, පළාත් සහ කලාපීය මට්ටමේ විද්‍යා අධ්‍යාපන නිළධාරීන් සහ ගුරු විද්‍යා උපදේශකයින් 150 දෙනෙකුගේ සක්‍රිය සහභාගීත්වයෙන්, භාෂණ පරිවර්තන පහසුකම් සහිතව, කොළඹදී පවත්වන ලදි.



"විද්‍යා" පුවත්පත් අතිරේකය

පාසල් සිසුන් සහ සාමාන්‍ය ජනතාව සඳහා ප්‍රයෝජනවත් විද්‍යාත්මක දැනුම බෙදා හැරීම අරමුණු කරගනිමින්, සෑම මසකම අවසන් බදාදා දින, දිනමිණ තිනකරන් සහ ඩේලි නිව්ස් ප්‍රවෘත්ති පත්‍රයන් සමඟ භාෂා ත්‍රිත්වයෙන් "විද්‍යා" පුවත් පත් අතිරේකය ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ප්‍රදර්ශන

- කැළණිය විශ්වවිද්‍යාලයේ, විද්‍යා පීඨය සමඟ සහයෝගීතාවයෙන් 2017 ඔක්තෝබර් 2 සිට 9 දක්වා, "විද්‍යා -2017" ප්‍රදර්ශනය සම සංවිධානය කරනු ලැබිණි. මෙම ප්‍රදර්ශනයෙහි තේමාව වනුයේ "විද්‍යාවේ පරිණාමය - විශ්වයේ උපතේ සිට කෘතිම බුද්ධිය දක්වා" යන්නයි. මෙම ප්‍රදර්ශනය සඳහා දිවයින පුරා විවිධ ප්‍රදේශයන්හි සිට පැමිණි විශාල පිරිසකගේ සහභාගීත්වය ලැබුණු අතර අපේක්ෂිත මට්ටම ඉක්ම වූ සාර්ථකත්වයක් ළඟා කර ගැනීමට හැකිවිණි.

වැඩමුළු සහ සම්මන්ත්‍රණ

- "ශ්‍රී ලංකාව, නවෝත්පාදනයෙන් පෙරට" පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළුවක්, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් උදෙසා, 2017 පෙබරවාරි 17 සහ 18 යන දිනයන්හිදී මහනුවරදී පවත්වනු ලැබිණි. අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි මාණ්ඩලික නිළධාරීන් මෙම වැඩමුළුව සඳහා සහභාගී වෙමින් දායකත්වය දක්වන ලදි.

- "ශ්‍රී ලංකාවේ ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය" පිළිබඳ සම්මන්ත්‍රණයක්, 2017 ජුනි 23 සහ 24 දිනයන්හිදී, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදි. පවත්නා නෛතික රාමුව, ශ්‍රී ලංකාවේ බිම් ගොඩ කිරීමේ ක්‍රමය, කසළ කළමනාකරණයේ මූල්‍ය ශක්‍යතාවයන්, පරිභෝජනය කරනු ලැබූ ප්ලාස්ටික් අපද්‍රව්‍ය සහ ප්‍රොලිප්‍රො, ප්‍රතිචක්‍රීකරණය සහ කසළ කළමකාකරණයේදී පෞද්ගලික අංශය වෙත පැවරෙන කාර්යභාරය යනාදිය මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් වූ අතර පාර්ශවකරුවන් අතර පොදු එකඟතාවයක් ඇති කරගන්නා ලදි.

- "විද්‍යාව, තාක්ෂණය සහ නවොත්පාදනය: ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රමෝපායීකරණය" පිළිබඳ සාකච්ඡාමය සම්මන්ත්‍රණයක් සංවිධානය කරනු ලැබ 2017 ඔක්තෝම්බර් 10 දින පවත්වනු ලැබිණි. මෙම සම්මන්ත්‍රණයෙහි මාතෘකාව වූයේ, "ඵලදායී ආර්ථික නායකත්වයේදී, වෘත්තිකයින්ගේ කාර්යභාරයයි". (විශ්වවිද්‍යාල අධ්‍යාපන ප්‍රජාව, විද්‍යාත්මක ප්‍රජාව, ඉංජිනේරුවන්, වෛද්‍ය වෘත්තිකයින්, කළමනාකරණ සහ ව්‍යාපාරික වෘත්තිකයින් සහ සමාජ විද්‍යාඥයින් මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගී විණි.)

මෙම සම්මන්ත්‍රණයෙහි ප්‍රතිඵලයක් ලෙස, රජයේ ආයතන විසින් සිය ප්‍රතිපත්ති ක්‍රියාකාරී වැඩසටහන්වලදී, වෘත්තිමය කණ්ඩායම් සඳහා වැඩි අවස්ථා විවර කර දෙනු ඇතැයි අපේක්ෂිතය.

ලෝක විද්‍යා දිනය

නොවැම්බර් 10 දිනට යෙදෙන ලෝක විද්‍යා දිනය හා සමගාමීව, "ජාතික විද්‍යා දිනය" සහ "ජාතික විද්‍යා සතිය" සැමරීම සඳහා වැඩමුළු මාලාවක් සංවිධානය කෙරේ. විශ්වවිද්‍යාල සිසුන්, පාසල් සිසුන් සහ සාමාන්‍ය ජනතාව උදෙසා විද්‍යා ප්‍රදර්ශන විද්‍යා චිත්‍රපටි උළෙල, විද්‍යා පාගමන සහ පාසල් සිසුන් සඳහා සාකච්ඡා සැසි, දීප ව්‍යාප්ත මට්ටමින් පවත්වනු ලැබේ.

2017 නොවැම්බර් 10 දින ලෝක විද්‍යා දිනය සැමරීමට සහ නොවැම්බර් 10 සිට 17 දක්වා විද්‍යා සතිය ලෙස ප්‍රකාශයට පත්කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය අනුව, දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාකාරකම් මාලාවක් සැලසුම් කොට ඇති අතර, ජාතික විද්‍යා පා ගමන, විද්‍යා ප්‍රදර්ශන, විද්‍යා චිත්‍රපටි උළෙල සහ විද්‍යා සාකච්ඡා ඒ සඳහා ඇතුළත් වේ.

1.4. විද්‍යා චිත්‍රපට උළෙල

ලෝක විද්‍යා දිනය සහ ජාතික විද්‍යා සතිය හා සමගාමීව,

1. මහජනතාව
2. විශ්වවිද්‍යාල සිසුන්, පාසල් සිසුන්
3. ප්‍රාථමික මට්ටම (අවු:05-10) සහ ද්විතියික මට්ටම (අවු:11-18)

සඳහා විද්‍යා චිත්‍රපටි තිරගත කෙරේ.

ජාත්‍යන්තර විද්‍යාත්මක ලෝකය සමඟ විද්‍යාත්මක විනෝදාස්වාදක අත්දැකීම බෙදා ගැනීමේ අවස්ථාව, ශ්‍රී ලාංකිකයන් වෙත ලබාදීම සහ ශ්‍රී ලාංකීය ජන සාමාජය තුළ ඉලක්කගත විවිධ කණ්ඩායම් අතර විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම අරමුණු කරගනිමින්, මෙම විද්‍යා චිත්‍රපට උළෙල සංවිධානය කරනු ලැබ ඇත. මෙම ප්‍රයත්නයේදී, අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සමඟ අත්වැල් බැඳගනිමින්, විද්‍යා තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය කටයුතු කරයි.

2.3. ද්විපාර්ශ්වීය සහයෝගීතාවයන්

නව අවබෝධතා ගිවිසුම් සඳහා අත්සන් තැබීම, අත්සන් තබනු ලැබූ අවබෝධතා ගිවිසුම්, සහ ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදිය හරහා, වෙනත් රටවල් සමඟ සිය ද්විපාර්ශවික සහයෝගීතා සවිමත් කරගනු පිණිස අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබ ඇත. එලෙස ඇතිකර ගනු ලැබූ ද්විපාර්ශ්වික සහයෝගීතාවන්හි ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් පහතින් දක්වා ඇත.

රටෙහි/ ආයතනයෙහි නම	ක්‍රියාත්මක කිරීම් හි තත්ත්වය
කියුබානු ජනරජයේ විද්‍යා, තාක්ෂණ සහ පරිසර අමාත්‍යාංශය	2016 නොවැම්බර් 02 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදි. ඒකාබද්ධ කමිටුවෙහි ප්‍රථම හමුව 2018 ජනවාරි මසදී කියුබාවේ හවානා නුවරදී පැවැත්වෙනු ඇත.
පාකිස්ථානු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය	ඒකාබද්ධ කමිටුවේ ප්‍රථම හමුව, 2016 නොවැම්බර් මසදී පවත්වන ලදි.දෙරට විසින්ම ඒකාබද්ධ පර්යේෂණ සඳහා යෝජනා කැඳවා ඇති අතර අනුමැතිය සඳහා ඇගයීමට ලක්කෙරේ.
ඉන්දියානු විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව	2016 අගෝස්තු මසදී සහයෝගීතා වැඩසටහන් අත්සන් තබන ලදි. පර්යේෂණ සහයෝගීතාවයන්හි සොයාගැනීම් සහ ප්‍රතිඵලයන් ප්‍රදර්ශනය සඳහා සහ අනාගත සහයෝගීතාවයන් ඇතිකර ගැනීම සඳහා, 2017 මැයි 29 සහ 30 යන දිනයන්හිදී සම්මන්ත්‍රණයක් පවත්වන ලදි. ආහාර, පෝෂණය සහ සෞඛ්‍ය, මුහුදු ජල මට්ටමේ ඉහළයාමේ ප්‍රතිපලයන් සඳහා සූදානම් වීම සහ ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ගොන්ඩ්වානා භූ විද්‍යාව, යන තේමා යටතේ පර්යේෂණ පත්‍රිකා 14ක් මෙම සම්මන්ත්‍රණය අතරතුරදී ඉදිරිපත් කරනු ලබයි. දෙරට විසින්ම ඒකාබද්ධ පර්යේෂණ- 2017 සඳහා යෝජනා කැඳවීම සිදුකෙරුනු අතර පර්යේෂණ යෝජනා 18 ක් සහ ඒකාබද්ධ වැඩමුළු 2 ක් මූල්‍යාධාර ලබාදීම සඳහා අනුමත කෙරිණි.
ඉරානය- විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන	2017 ජනවාරි මසදී අවබෝධතා ගිවිසුම අත්සන් තැබිණි. ඒකාබද්ධ කමිටුවෙහි ප්‍රථම හමුව, 2017 ඔක්තෝම්බර් මස කොළඹදී පැවැත්වීමට යෝජිතය.
න්‍යෂ්ටික පර්යේෂණ පිළිබඳ යුරෝපීය සංවිධානය	උච්ච ශක්ති භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාවය සඳහා ජාත්‍යන්තර සහයෝගීතා ගිවිසුමක් සඳහා 2017 පෙබරවාරි මසදී අත්සන් තැබිණි. ප්‍රතිලාභ සැලැස්මක් කෙටුම්පත් කරනු ලැබූ අතර මෙහෙයුම් කමිටුවක් පත්කරනු ලැබිණි. අයදුම් කිරීමේ ක්‍රියාවලියේදී, CERN හිදී සිදුකෙරෙන උසස් මට්ටමේ අත්හදා බැලීම්හි නිරතවීමේ අවස්ථාව ලබාදෙන සහයෝගීතාවයන් ස්ථාපනය කර ගැනිණි.
රුසියානු සමූහාණ්ඩුවේ අධ්‍යයන හා විද්‍යා අමාත්‍යාංශය	2017 මාර්තු මසදී අවබෝධතා ගිවිසුම සඳහා අත්සන් තැබිණි. ඉන් අනතුරුව ROSCOSMOS (NASA හා සමාන ආයතනයකි) සහ සමාරා විශ්වවිද්‍යාලය සමඟ අභ්‍යාවකාශ විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳව, අවබෝධතා ගිවිසුම් සඳහා ACCIMT ආයතනය විසින් අත්සන් තැබිණි.

2.4. වෙනත් මූලාරම්භයන්

ශ්‍රී ලංකාවේ ප්‍රථම තිරසර මානව සංවර්ධනය සඳහා වන ඉදිරි දැක්ම සහ නවෝත්පාදන ජාතික සමුළුව, 2016 මැයි මසදී, UNDP සහ අනෙකුත් බහු ආංශික හවුල්කරුවන්ගේ එකමුතුවෙන් පවත්වන ලදි. මෙම සමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාව සඳහා නවෝත්පාදන විද්‍යාගාරයක් ස්ථාපනය කිරීමයි. මෙම නවෝත්පාදන විද්‍යාගාරයෙහි ප්‍රධාන අරමුණ වනුයේ රජයේ සංවර්ධන න්‍යාය පත්‍රය හා අනුකූලව ජාතික තීරණ සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය තුළට නවෝත්පාදනයන් රැගෙන ඒමයි. ඒ හරහා ආර්ථික, සමාජීය සහ දේශපාලනික විපර්යාසයන්හි දේශීය සහ ගෝලීය ක්‍රියාවලි සඳහා සාර්ථකව මුහුණදීමයි. යම් අදහසක්, හෝ විසඳුමක් ක්‍රියාත්මක කිරීමේදී නීතියෙන් ගැලවී යා හැකි මාර්ග නොතිබීම සහතික කරනු වස්, දී ඇති කාලසීමාවක් ඇතුළත ඒවා අංගසම්පූර්ණ ලෙස පරීක්ෂා කිරීමේ හැකියාව මෙම විද්‍යාගාරය සතුවනු ඇත.

එවැනි මූලාරම්භයන්හි වැදගත්කම හඳුනාගත් අමාත්‍යාංශය විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ 2017 සැප්තැම්බර් මසදී UNDP සමඟ ශ්‍රී ලංකා සමාජීයීය නවෝත්පාදන විද්‍යාගාරය ස්ථාපනය සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදි. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ, සීග්‍රයෙන් වෙනස් වෙමින් යන කලාපීය සහ ගෝලීය ප්‍රවණතා හා අනුගත වනු පිණිස වත්මන් නවෝත්පාදන ව්‍යුහය වැඩිදියුණු කෙරෙන යාන්ත්‍රණයක්/ වේදිකාවක් ස්ථාපනය කිරීමයි. මෙමගින් වඩාත් හොඳ ව්‍යවහාරයන් සොයාගන්නා පර්යේෂණ සහ අත්හදා

බැලීමේ පහසුකම් සලසන අතර සංවර්ධන විසඳුම් සහ මූලාරම්භයන් තක්සේරු කිරීම සඳහා පෙර දැක්ම සහ නවෝත්පාදන ප්‍රවේශයන් යොදා ගැනීමටද මේ හරහා හැකියාව ලැබෙනු ඇත.මෙම විද්‍යාගාරය ආරම්භයේදී කාර්මික තාක්ෂණ ආයතන පරිශ්‍රය තුළ ස්ථාපනය කෙරෙනු ඇති අතර විද්‍යාගාරයෙහි ක්‍රියාකාරකම් ආයතන ගත කිරීම සඳහා යෝග්‍ය යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ඇත.

IDEA මණ්ඩලය ප්‍රවර්ධනය කිරීමටත්, එය වඩා පාරිභෝගිකයින්ට සමීප කරවීමටත්, සැලසුම් කරනු ලැබූ, සමාජීය නවෝත්පාදන විද්‍යාගාරයෙහි පුරවැසියන් සම්බන්ධ කරගැනීමේ අංග ඇසුරින් වැඩි ප්‍රතිලාභ අත්කර ගැනීමටත් අරමුණු කරගනිමින් අමාත්‍යාංශය විසින් UNDP සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදි.

2.4.2. නොබැඳි ජාතීන්ගේ සංගමයේ විද්‍යා හා තාක්ෂණ පාලක සභාවේ 14 වන හමුව (NAM S&T)

2017 සැප්තැම්බර් 05, 06 යන දිනයන්හිදී මැලේසියාවේදී පැවති නොබැඳි ජාතින්ගේ සංගමයේ විද්‍යා හා තාක්ෂණ පාලක සභාවේ 14 වන හමුව සඳහා අමාත්‍යාංශය ලේකම්ගේ නායකත්වයෙන් යුත් දූත පිරිසක් සහභාගී විණි. මෙම හමුවේදී, පාලක සභාවේ උපසභාපති ධූරයට ශ්‍රී ලංකාව ජන්දයෙන් තේරී පත්වූ අතර ඒ අනුව 2020 දී පාලක මණ්ඩලයේ 15 වන සභාව පැවැත්වීම සඳහා සත්කාරක රට ලෙස ශ්‍රී ලංකාව තෝරාගනු ලැබිණි

2.4.3 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය

ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුමක් සැකසීමේ ප්‍රධාන අරමුණින් ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය සංවිධානය කරන ලදි. උපදේශන ක්‍රියාවලියකින් අනතුරුව කෙටුම්පත් සකසා අවසන් කරනු ලැබ ඇත. එය අවශ්‍ය කටයුතු සඳහා, පාරිසරික කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය බලකාය වෙත ළඟදීම ඉදිරිපත් කෙරෙනු ඇත.

2.4.4 සමාජ මෙහෙවර උදෙසා විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය (STS Forum) සහ ශ්‍රී ලංකාව නව්‍යකරණයෙන් පෙරට

ප්‍රථම වරට පවත්වනු ලැබූ සමාජ මෙහෙවර උදෙසා විද්‍යා හා තාක්ෂණ (STS) සම්මන්ත්‍රණය දේශීය සහ ජාත්‍යන්තර විද්‍යාඥයින් සහ විශේෂඥයින් 650 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් 2016 සැප්තැම්බර් මසදී, අතිගරු ජනාධිපති තුමන්ගේ සහ අග්‍රාමාත්‍ය තුමන්ගේ ප්‍රධානත්වයෙන්, කොළඹදී පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණයේ ප්‍රතිඵලයක් ලෙස සූර්ය බලශක්තිය, ජෛව තාක්ෂණය, රොබෝ විද්‍යාව, ප්‍රවේණි විද්‍යාව වැනි නැගී එන තාක්ෂණයන්, ශ්‍රී ලංකාව නවෝත්පාදනය කරවීම යන තේමාව යටතේ යෝජනා කෙරිණි. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත, ශ්‍රී ලංකාව නව්‍යකරණයෙන් පෙරට යන තේමාව යටතේ පහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරවීම සඳහා රාජ්‍ය අරමුදල් වෙන් කර දෙනු ලැබේ.

2.4.5 සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වනුයේ, සූර්ය බලශක්තිය හා ආශ්‍රිත තාක්ෂණයන් පිළිබඳ නිපුණතා සහිත 2000 කට ආසන්න තරුණ පිරිසකින් සමන්විත ලෝක මට්ටමේ කාර්ය බලකායක් පුහුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ ශක්තිමත් සූර්ය බලශක්ති කර්මාන්තයක් සහ වාණිජ මට්ටමේ සූර්ය පැනල නිෂ්පාදන පහසුකමක් ස්ථාපනය කිරීම සඳහා සූර්ය පැනල මූලාකෘති නිපදවීමේ පර්යේෂණ හා පුහුණු පහසුකම් සංවර්ධනය කිරීමත්ය.

නිපුණතා සංවර්ධන සහ තෘතීය පුහුණු අමාත්‍යාංශය හා එක්ව සූර්ය බලශක්තිය පිළිබඳ විෂයමාලාවක් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබී ඇති අතර, සූර්ය පැනල සවිකිරීමෙහි නියුක්තව සිටින පෞද්ගලික අංශයේ කර්මාන්තයන් හා සහයෝගීතාවයෙන්, ප්‍රායෝගික අත්දැකීම් සහිතව සිසුන් පුහුණු කිරීම අපේක්ෂිතය. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පුහුණුව ලැබූ සියලු සිසුන් සඳහා NVQ 4 හා සමාන සහතිකයක් පිරිනැමෙනු ඇත.

ඉදිරි වර්ෂයන්හීදී මිනිය හැකි අන්දමේ ප්‍රගතියක් ලෙස, රට තුළ සූර්ය පැනල කර්මාන්තය ස්ථාපනය කරනු පිණිස, අමාත්‍යාංශය විසින් දැනටමත් දේශීය සහ ජාත්‍යන්තර කර්මාන්තයන් සමඟ සාකච්ඡාවන් පවත්වා ඇත. මෙම ව්‍යාපෘතිය, රුපියල් මිලියන 240 ක මුළු වියදමක් යටතේ කැළණිය, රුහුණු, යාපනය සහ පේරාදෙණිය යන විශ්වවිද්‍යාලයන්හි සහයෝගිතාවයෙන් වසර පහක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක කෙරේ. මේ සඳහා අවශ්‍ය කෙරෙන පර්යේෂණ හා සංවර්ධන පහසුකම් SLINTEC, NERDC සහ NIFS ආයතන වෙතින් සපයාදෙනු ඇත. මෙම කාලච්ඡේදය තුළ, කොළඹ දිස්ත්‍රික්කයේ හඳුනාගත් පාසල්හි සිසුන් සඳහා සූර්ය බලශක්ති ප්‍රදර්ශනය කර පෙන්වීම් සහිත, පාසල් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

2.4.6. ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක දෙකකින් යුක්තය. ඒවා නම්, අතිනවීන තාක්ෂණයන්ගෙන් සමන්විත මධ්‍යගත ජෛව තාක්ෂණ පහසුකම (යෝජිත ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය - SLIBTEC) සහ ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය යනාදියයි. ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ අයතනය යනු ජෛව තාක්ෂණ කර්මාන්තයන් සඳහා සියලු විද්‍යාගාර සහ බීජෞෂණ සහසුකම් සපයාදෙනු ලබන රාජ්‍ය - පෞද්ගලික සමාගමක් ලෙස පිහිටුවනු ලබන්නක් වන අතර ජෛවතාක්ෂණ නවෝත්පාදන උද්‍යානය යනු කර්මාන්තයට තමන්ගේම නිෂ්පාදන පහසුකමක් ස්ථාපනය කර ගැනිමට ඉඩ පහසුකම් වෙන්කර දීම සඳහා ස්ථාපනය කරනු ලබන්නකි. මෙම ව්‍යාපාතියේ ප්‍රධාන අරමුණු වනුයේ, නව නිපැයුම්කරුවන් සඳහා බීජෞෂණ පහසුකම් සපයාදීම හරහා ජෛව තාක්ෂණ කර්මාන්තය සීඝ්‍රවත් කරනු පිණිස නවෝත්පාදන සංස්කෘතියක් සංවර්ධනය කිරීම සහ ජෛව තාක්ෂණ උපාධිධාරීන්/ පශ්චාත් උපාධිධාරීන් සහ ක්‍රියාවලි/ නිෂ්පාදන ඉංජිනේරුවන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීමත්ය. නව්‍ය ජෛව තාක්ෂණ කර්මාන්තය හරහා ගෝලීය වෙළඳපළ අවශතාවයක් සපුරාලීම සහ රට තුළ විවිත්‍රවත් ජෛව තාක්ෂණ කුඩා හා පරිමාණ ව්‍යාවසායක සංස්කෘතියක් සංවර්ධනය කිරිමට පහසුකම් සලසාදීම මේ හරහා සිදුවනු ඇත.



මෙම කාලච්ඡේදය තුළදී, අමාත්‍යාංශය විසින්, යෝජිත SLIBTEC ආයතන ගොඩනැගිල්ලෙහි සැලසුම් නිර්මාණය සඳහා උපදේශකවරයෙකු සහ ගෘහ නිර්මාණ සැලසුම් ශිල්පියෙකු යෙදවීමට කටයුතු කරනු ලැබූ අතර, අති නවීන පර්යේෂණ පහසුකම් සහිත විද්‍යාගාර ගොඩනැගිලෙහි සැලසුම් නිර්මාණ කාර්යය දැනට සිදුකෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු වියදම රුපියල් මිලියන 6850 ක් වන අතර වසර පහක කාලයක් දක්වා ඉදිකිරිම් කටයුතු සිදුකෙරෙනු ඇත.

යෝජිත ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය

2.4.7. යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI)

ගෝලීය තරඟකාරි තත්ත්වයට මුහුණදීමට අවශ්‍ය ප්‍රමිතීන් සහිත උසස් තාක්ෂණ නිෂ්පාදන සැලසුම් නිර්මාණ සමාගම් පැවතීම හරහා, නැගී එන තාක්ෂණයන්ගෙන් ආර්ථිකයන් බොහෝ සේ ප්‍රතිලාභ අත්කර ගනී. වෙළඳපළෙහි තරඟකාරී ව්‍යාපාරයන් ගොඩනැංවීමට දායකවීම හරහා මෙම නිෂ්පාදනයන් ආර්ථික සංවර්ධනය සඳහා සිය දායකත්වය ලබාදෙනු ඇත. මෙය හඳුනාගනිමින්, MEDI මූලාරම්භය යටතේ නිෂ්පදාන සැලසුම් නිර්මාණ ඉංජිනේරු විද්‍යා උද්‍යානයක් ස්ථාපනය කිරිම සඳහා රුපියල් මිලියන 500 ක අරමුදල් භාණ්ඩාගාරය විසින් වෙන් කර දී ඇත. මෙම මූලාරම්භයෙහි සමස්ත අරමුණ වනුයේ අපගේ උසස් තාක්ෂණික අපනයනයන් වර්ධනය කරවීම සහ අපගේ දේශීය නිෂ්පාදනයන් වෙත අගය එක් කිරීමත්ය. මෙම මූලාරාම්භය සංරචක දෙකකින් සමන්විතය. ඒවා නම්, ප්‍රමිතීන්, පුහුණුව, මූලාකෘතිකරණ සහ පරීක්ෂා පහසුකම (STPT) සහ දීර්ඝ කාලීන ණය පහසුකම (LTLF) යනාදියයි. STPT හරහා, ව්‍යුහගත සංවර්ධන ප්‍රවේශයන්, ප්‍රමිති පුහුණුව, බීජෞෂණ මූලාකෘතිකරණ සහ පරීක්ෂණ පහසුකම් භාවිතයෙන් ජාත්‍යන්තර සහතිකකරණ තත්ත්වයන් ලබා ගැනීම සඳහා නිෂ්පාදන සැලසුම් නිර්මාණ ඉංජිනේරු (PDE) සමාගම් සඳහා පහසුකම් සැපයීම සිදු කරයි. මේවායින් බොහෝමයක් ආරක්ෂාව පදනම් කර ගත් පද්ධතීන් වීමත් සෑම PDE සමාගමක් විසින් විශාල මුදලක් මේ සඳහා වැය කිරීම වැළැක්වීමත් සඳහා මෙම ක්‍රියාමාර්ගය ගනු ලැබ ඇත. ඒ අනුව මෙම STPT පහසුකම, PDE සමාගම් සඳහා සංකල්ප මූලාකෘති, නිෂ්පාදන වැඩිදියුණු කිරීමටත්, නිෂ්පාදන සහතිකකරණය සඳහා අවකාශ ලබා දෙන, පූර්ණ රාජ්‍ය අරමුදල් යටතේ ක්‍රියාත්මක පහසුකමක් ලෙසත් ක්‍රියාත්මක කරනු ඇත.

දීර්ඝ කාලීන ණය පහසුකම (LTLF) බැංකු පද්ධතියක් හරහා ක්‍රියාත්මක කෙරෙනු ඇති අතර, එහිදී ගෝලීය මට්ටමේ සපුරාලන නිෂ්පාදනයන් වැඩිදියුණු කරගැනීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීය හැකිවන පරිදි, දීර්ඝ සහන කාලයක් සහිත අඩු පොළී ණය පහසුකම් ලබා ගැනීමට PDE සමාගම් වෙත සහායය ලබා දේ.

STPT පහසුකම, නර්ඩ් මධ්‍යස්ථානයේ මැදිහත්වීම යටතේ ස්ලින්ටෙක් පරිශ්‍රය තුළ ස්ථාපනය කිරීමට අමාත්‍යාංශය විසින් දැනටමත් පියවර ගෙන ඇත. LTLF පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා, යෝග්‍ය බැංකුවක් තෝරාගනු පිණිස යෝජනා ඉල්ලීම් (RFPs) කැඳවීමට දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා ඇත. මෙම ව්‍යාපෘතිය ජපානයේ ''Beans'' ව්‍යාපෘතිය, ඉන්දියාවේ ''Tech Mahindra'' සහ ඉතාලියේ ''Polomechatronica'' ව්‍යාපෘතිය හා සමාන ආකෘතියක් සහිත ව්‍යාපෘතියකි.

2.4.8 ව්‍යාපාර ආරම්භයන් සඳහා සහාය ලබා දීමට බීජෞෂණ පහසුකම්

වඩා සාම්ප්‍රදායික ව්‍යාපාර බීජෞෂණ පද්ධතීන්ගෙන් වෙනස් වූ ලොවපුරා පැතිරී යන බීජෞෂණ මධ්‍යස්ථාන විසින් තාක්ෂණය වෙත නැඹුරුතාවයක් දක්වන ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාර ආරම්භයේදී සහ සිය සමාගම් හි මුල් සංවර්ධන මට්ටම් වලදී, වැඩ කිරීම සඳහා අවකාශය, පහසුකම් බෙදා ගැනීම සහ ව්‍යාපාර සහායක සේවා පරාසයක් යනාදිය සපයා දීම හරහා සහායය ලබා දේ. සංක්ෂිප්තව ගත්කල බීජෞෂණ මධ්‍යස්ථාන මූලික ආයෝජකයින්, ව්‍යපාර ප්‍රාග්ධන ආයෝජකයින් සහ ව්‍යවසායකයින්ට පිහිට විය හැකි අනෙකුත් පුද්ගලයින් ස්ථාන ගතව සිටින ස්ථානයකි. බොහෝ දෙනෙකු ගිණුම් කරණ සහායය, කාර්යාලීය ඉඩපහසුකම් සහ නෛතික මාර්ගෝපදේශ වැනි සම්පත් ද ලබා දීමට ඉදිරිපත් වේ. මෙම ව්‍යාපාරික යටිතල පහසුකම් පැවතීම හේතුවෙන්, වඩාත් වැදගත් වන අංගය, එනම් මධ්‍ය/ප්‍රධාන ව්‍යාපාරය වෙත අවධානය යොමු කිරීමට, ආරම්භක ව්‍යාපාරයන් සඳහා මේ හරහා ඉඩ ප්‍රස්ථාව ලැබේ. තාක්ෂණය පදනම් කරගත් ව්‍යවසායකත්වයන් හරහා රටක ආර්ථික සංවර්ධනයේ දී පර්යේෂණ වාණිජකරණයෙහි වැදගත් කම හඳුනා ගනිමින්, ව්‍යාපාර ආරම්භයන් සඳහා සහාය ලබා දීමට අමාත්‍යාංශය වෙත භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් කර දී ඇත. දැනට අමාත්‍යාංශය විසින් තාක්ෂණ බීජෞෂණ මධ්‍යස්ථාන ස්ථාපනය සඳහා රුහුණු සහ පේරාදෙණිය විශ්වවිද්‍යාල සහ නර්ඩ් මධ්‍යස්ථානය සමඟ එක්ව කටයුතු කරනු ලැබේ. විද්‍යාගාර මට්ටමේ සිය පර්යේෂණයන් වැඩිදියුණු කිරීම උදෙසා, කර්මාන්ත සහ විශ්වවිද්‍යාල සඳහා මෙම බීජෞෂණ මධ්‍යස්ථාන සේවාවන් විවෘත කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතිය, අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

2.4.9 නවෝත්පාදන සඳහා කඩිනම් මූල්‍යන යාන්ත්‍රණය

දැනටමත් මූලාකෘතියක් වැඩිදියුණු කරනු ලැබ ඇති සහ මූල්‍යමය සහායය යටතේ වාණිජකරණය සිදුකළ හැකි, නවෝත්පාදනයන් සඳහා සහායය ලබාදීමේ අරමුණින්, නවෝත්පාදන සඳහා කඩිනම් මූල්‍යන යාන්ත්‍රණයක් හඳුන්වාදීමට, රජය විසින් අරමුදල් වෙන්කර දෙනු ලැබිණි. වාණිජකරණය සඳහා සිදුකළ යුතු සුවිශාල ආයෝජනයන් හේතුවෙන්, රටෙහි බොහෝමයක් නවෝත්පාදනයන් විද්‍යාගාර මට්ටමට සීමා වී ඇති බව විශ්වාස කෙරේ. මෙම තත්ත්වය සඳහා විසඳුමක් ලබාදීමේ අරමුණින්, සවිස්තරාත්මකව ඇගයීමේ ක්‍රියාවලියක් සහිත කඩිනම් මූල්‍යන යාන්ත්‍රණයක් භාවිත කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් ශ්‍රී ලංකා නව

නිපැයුම්කරුවන්ගේ කොමිසම හා සහයෝගීත්වයෙන් මෙම අමාත්‍යාංශය විසින් වැඩිදියුණු කරනු ලැබ ඇත. මූලායන යාන්ත්‍රණය මෙහෙයවීම සඳහා නවෝත්පාදකයින් වෙතින් යෝජනා කැඳවීමට දැනටමත් පියවර ගනු ලැබ ඇත.

2.4.10 ප්‍රවේණි වෛද්‍ය විද්‍යා සහ සංඛ්‍යාංක සෞඛ්‍ය පිළිබඳ ආයතනය ස්ථාපනය කිරීම



උසස් තාක්ෂණික සේවා අපනයනය සඳහා සුවිශාල විභවතාවයක් පැවතියද, ප්‍රවේණි විද්‍යාව සහ සෞඛ්‍යාරක්ෂණය එක් වූ පෞද්ගලික වෛද්‍ය විද්‍යාව සඳහා අතීතයේදී සහායයක් ලැබී නොමැත. ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියානු කලාපයේ ප්‍රථම වරට ඉදිකෙරෙන මෙම ආයතනය හරහා ශ්‍රී ලංකාවේ ජනගහණය සහ වෙනත් නැඟී එන ආර්ථිකයන් වෙත බලපෑමක් එල්ල කරන බෝ නොවන රෝග වැනි ඉතා වැදගත් සෞඛ්‍යාරක්ෂණ ගැටළු සඳහා සුහුරු විසඳුම් සොයාගැනීමට කටයුතු කෙරෙන ලෝක මට්ටමේ සංඛ්‍යාංක සෞඛ්‍ය පිළිබඳ ආයතනයක් රටෙහි ස්ථාපනය කෙරෙනු ඇත. තවද මෙමඟින් ප්‍රවේණි විද්‍යාත්මක අධ්‍යයනයන් මත පදනම්ව සෞඛ්‍යාරක්ෂණ ගැටළු හඳුනාගැනීම පිළිබඳවද අවධානය යොමු කෙරෙනු ඇත. අමාත්‍යාංශය විසින් සංකල්ප පත්‍රිකාව වැඩිදියුණු කරනු ලැබ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ඔවුන්ගේ අදහස් විමසීම සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත.

2.4.11 ජාතික විද්‍යා මධ්‍යස්ථානය

සමාජයේ සෑම කොටසක් අතරම විද්‍යාව ප්‍රචලිත කිරීමේ අරමුණින් ලෝක මට්ටමේ අති නවීන විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා රාජ්‍ය අරමුදල් වෙන් කරනු ලැබ ඇත. මෙම විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමට යෝජිත හෝමාගම, පිට්පන පිහිටි භූමි භාගය මෙම කාර්යය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනටමත් වෙන් කර දී ඇත. මේ වන විට අමාත්‍යාංශය විසින් විද්‍යා මධ්‍යස්ථානයේ විවිධ තේමාවන් හඳුනා ගැනීමේ සහ සැලසුම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී. යෝජිත විද්‍යා මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂය වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

2.5 2018 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- ජාත්‍යන්තර සහයෝගීතාවයන්
- රටවල් සමඟ එළැඹී ද්විපාර්ශවික අවබෝධතා ගිවිසුම් සහ සහයෝගීතා වැඩසටහන් අඛණ්ඩව ඉදිරියට රැගෙන යාම
- සමාජය උදෙසා විද්‍යා හා තාක්ෂණ (STS) දෙවන සම්මන්ත්‍රණය
- බෙලරුසියාව, දකුණු අප්‍රිකාව, ස්ලොවේනියාව,ඉක්වදෝරය, මැලේසියාව, නේපාලය, ලැට්වියාව, කටාර්, ඉන්දුනිසියාව, ජර්මනිය, ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ එකඟතාවයන්/ අවබෝධතා ගිවිසුම් සඳහා එළැඹීමට කටයුතු කිරීම.
- ඒකාබද්ධ කමිටු රැස්වීම් වලදී එකඟත්වය පළවූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සමාජීය නවෝත්පාදන විද්‍යාගාරය ක්‍රියාත්මක කිරීම
- තාක්ෂණ හුවමාරු පහසුකම ස්ථාපනය කිරීම පිළිබඳ හතරවන BIMSTEC විශේෂඥ කණ්ඩායම් හමුව
- පර්යේෂණ හා සංවර්ධන
- ජාතික පර්යේෂණ සංවර්ධන රාමුව මඟින් හඳුනාගත් මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම
- තිරසර සංවර්ධන අරමුණු හා අනුකූල පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්
- හඳුනාගනු ලැබූ වැදගත් ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සංවර්ධනයන් සඳහා පහසුකම් සැලසීම
- විද්‍යාව ප්‍රචලිත කිරීම හා ද්විතියික පාසල්හි STEM අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
- තාරකා විද්‍යාව සහ තාරකා භෞතික විද්‍යාව පිළිබඳ 12 වන ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරඟය (IOAA 2018)
- ජාතික විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් පෙරට 2018-2020 ආර්ථික වර්ධනය උදෙසා විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන (STI) ක්ෂේත්‍රයේ ක්‍රමෝපායික ආයෝජනයන් සිදු කිරීම

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින්, ගරු අමාත්‍යතුමන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ 2016 වර්ෂයේදී සමාජ මෙහෙවර උදෙසා විද්‍යා හා තාක්ෂණ (STS) සම්මන්ත්‍රණය පැවැත්වීමට පියවර ගනු ලැබූ අතර, දේශීය සහ ජාත්‍යන්තර මට්ටමේ විශේෂඥයින් සහ විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික විද්‍යාඥයින්, පර්යේෂකයින්, 650 කට අධික පිරිසක් සහභාගී වූ මෙම සම්මන්ත්‍රණය අතිගරු ජනාධිපතිතුමන්ගේ සහ ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබිණි. මෙම සම්මන්ත්‍රණයේදී සිදුකළ සාකච්ඡාවන් සහ බුද්ධිමය සංවාද පදනම් කරගනිමින්, ''ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් පෙරට'' යන සංකල්පය යටතේ නව මූලාරම්භයන් රැසක්, අමාත්‍යාංශය විසින් ආරම්භ කරනු ලැබ ඇත. මෙම සංකල්පය යටතේ ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ රටෙහි විද්‍යාත්මක ප්‍රගමනය උදෙසා නැගී එන තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමටත්, නැගී එන තාක්ෂණයන් අතර සහක්‍රියාවන් වැඩිදියුණු කිරීම හරහා, විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රයෙහි සිදුකළ ආයෝජනයන් සාධරණීකරණය කිරීමත්ය. මේ යටතේ හඳුනාගනු ලැබ ඇති ප්‍රධාන නැගී එන තාක්ෂණයන් අතරට, නිනිති තාක්ෂණය, ජෛව තාක්ෂණය, අභ්‍යවකාශ තාක්ෂණය, ජාන විද්‍යාව, සූර්ය බලශක්තිය, රොබෝ විද්‍යාව සහ කෘත්‍රිම බුද්ධිය ඇතුළත් වේ.

පාසල් සිසුන්, විද්වතුන්, සාමාන්‍ය ජනතාව ඇතුළත් වූ සියලු පාර්ශ්වකරුවන් අතර මෙම සියලු තාක්ෂණයන් ප්‍රචලිත කරවීම සඳහා, අති නවීන ජාත්‍යන්තර මට්ටමේ ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට සහ විද්‍යා, තාක්ෂණ, ගණිත සහ ඉංජිනේරු (STEM) අධ්‍යාපනය ප්‍රචලිත කිරීමට, මෙම සංකල්පය යටතේ සැලසුම්කොට ඇත.

2020 වර්ෂය වන විට සපුරා ගැනීමේ අරමුණු ඇතිව, අමාත්‍යාංශය විසින් සැලසුම් කරනු ලැබූ ප්‍රධාන කාර්යයන් පහතින් දක්වා ඇත.

නිනිති තාක්ෂණය



Proposed expansion of SLINTEC

ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය, මේ වන විට අති නවීන පර්යේෂණ විද්‍යාගාර පහසුකම් සහිතව ක්‍රියාත්මක වේ. 2015 මාර්තු මසදී ඇමෙරිකානු හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින්, නව ඉදිකිරීම් සඳහා වන ''බලශක්ති සහ පාරිසරික සැලසුම් නිර්මාණ නායකත්වය'' (LEED) යටතේ ප්ලැටිනම් සහතිකය ස්ලින්ටෙක් වෙත ප්‍රදානය කරනු ලැබ ඇත. LEED සහතිකකරණය යටතේ තිරසර සැලසුම් නිර්මාණය ප්‍රදර්ශනය කර පෙන්වන නිදර්ශකයක් ලෙස. නිනිති තාක්ෂණ විශිෂ්ටත්ව මධ්‍යස්ථානය හඳුනාගැනේ.

කෙටි කාලසීමාවක් තුළ (වසර 08 ක්) පේටන්ට්

බලපත්‍ර 11ක් ලබා ගැනීමට ස්ලින්ටෙක් වෙත හැකියාව ලැබී ඇත. මින් නවයක් එක්සත් ජනපදයේ පේටන්ට් බලපත්‍ර කාර්යාලයෙන්ද, දෙකක් ශ්‍රී ලංකා පේටන්ට් බලපත්‍ර කාර්යාලයෙන්ද ලබා ගෙන ඇත. ඊට අමතරව පේටන්ට් බලපත්‍ර තුනක් අලෙවි කර ඇත. බුද්ධි ප්‍රතිගලනයට ප්‍රතිචාර දක්වමින්, ස්ලින්ටෙක් ස්ථාපනය කිරීම හරහා විදේශයන්හි වෙසෙන ආචාර්ය උපාධි සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික විද්‍යාඥයින් 11 දෙනෙක්, නැවත මෙරටට ගෙන්වා ගැනීමට හැකියාව ලැබී ඇත. නවීන පර්යේෂණ පහසුකම් පිළිබඳව ශිෂ්‍යයින් පුහුණු කිරීම සඳහා, දර්ශනපති සහ ආචාර්ය උපාධි පිරිනමනු ලබන ස්ලින්ටෙක් ඇකඩමිය මැතක දී දියත් කරනු ලැබිණි.

ස්ලින්ටෙක් විසින් නිනිති තාක්ෂණය පිළිබඳ උසස් පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් සහ උසස් තාක්ෂණයන් ප්‍රවර්ධනය කරමින්, දේශීය සහ ජාත්‍යන්තර පර්යේෂකයින් සඳහා නේවාසික පහසුකම්ද සහිතව සිය අති නවීන විද්‍යාගාර පහසුකම් පුළුල් කිරීමේ කාර්යයෙහි නිරතව සිටින අතර 2020 වර්ෂයේදී මෙම කාර්යය සම්පූර්ණ කර මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතය.

යෝජිත ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය (SLIBTEC) සහ ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය

2016 අයවැය දේශනයේදී, ජෛව තාක්ෂණ උද්‍යානයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කරනු ලැබූ අතර, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ, යෝජිත ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය (SLIBTEC) සහ ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය ආරම්භ කිරීමට අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබිණි. උද්‍යානය සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබාගනු වස් 2016 වර්ෂයේදී ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින්, ජාතික ජෛව තාක්ෂණ නවෝත්පාදන සංගමය (NBIA) දියත් කරන ලදි.

මේ වන විට අමාත්‍යාංශය විසින් ජෛව තාක්ෂණ අංශය සඳහා නවීන මධ්‍යගත පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් සහිත යෝජිත ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය ඉදිකිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටින අතර මෙම යෝජිත SLIBTEC සඳහා ශාක ජෛව තාක්ෂණය, ජාන විද්‍යාව සහ අණුක ජීව විද්‍යාව, ප්‍රෝටීන විද්‍යාව

පිළිබඳ සහ පරිවෘත්තිය ක්‍රියා පිළිබඳ පර්යේෂණ පහසුකම් ඇතුළත් වනු ඇත. මෙයට අමතරව ව්‍යාපාර ආරම්භයන් සහ ව්‍යාපාරික බීජෞෂණාගාර, නව නිපැයුම් සහ ජාලකරණ අවකාශයන් යනාදිය සඳහා මෙමගින් පහසුකම් සපයා දෙනු ඇත.

රැකියා නිර්මාණය සඳහා අවස්ථා උදාකර දෙමින් අපගේ උසස් තාක්ෂණික අපනයනයන් ඉහළ නැංවීම සඳහා පහසුකම් සපයා දෙනු ලබන ජෛව තාක්ෂණ නිෂ්පාදනයන් පිළිබඳ ආයෝජනයන් සිදුකරනු පිණිස දේශීය සහ ජාත්‍යන්තර කර්මාන්තයන් සඳහා ආයෝජන පහසුකම්, ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය විසින් සපයා දෙනු ඇත. මේ වන විට, අමාත්‍යාංශය විසින්, මෙම අරමුණු සපුරාගනු පිණිස සුදුසු ව්‍යාපාරික සැලැස්මක් සංවර්ධනය කිරීමේ කාර්යයෙහි නියුක්තව සිටී.

2020 වර්ෂය වන විට, පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සඳහා පහසුකම් සහ ජෛව තාක්ෂණය මත පදනම් වූ ආයෝජනයන්ද සහිතව උසස් තාක්ෂණික නවෝත්පාදන උද්‍යානයක් ස්ථාපනය කිරීමට අපේක්ෂිතය.

සූර්ය බලශක්තිය

අමාත්‍යාංශය විසින්, විශ්වවිද්‍යාල හතරක් සමඟ සහයෝගීතාවයෙන්, සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතියක් මේ වන විට ක්‍රියාත්මක කෙරෙන අතර මෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ නිපුණතා සහිත

ශ්‍රම බලකායක් ගොඩනංවනු පිණිස 2000 කට ආසන්න තරුණ පිරිසක් සඳහා පුහුණුව ලබාදීමයි. මෙම කාර්යය සඳහා සම්බන්ධව කටයුතු කරන විශ්වවිද්‍යාල හතර වනුයේ කැළණිය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි. මෙම විශ්වවිද්‍යාල සඳහා අවශ්‍ය පර්යේෂණ සහ සංවර්ධන සේවා සහායය ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ ජාතික මූලික අධ්‍යයන ආයතනය යන ආයතන වෙතින් සැපයෙනු ඇත. මෙයට අමතරව, ඇමෙරිකා එක්සත් ජනපදයේ, සිවනාන්දන් ලැබෝරටරීස් සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ චිකාගෝහි ඉලිනොයිස් විශ්වවිද්‍යාලය විසින්, ශ්‍රී ලංකා රජයට කිසිදු පිරිවැයක් දැරීමට සිදු නොවන පරිදි, සූර්ය කෝෂ සහ සූර්ය පැනල මූලාකෘති පරීක්ෂාව සඳහා උපදේශන සේවාව සහ සහායයද ලබාදෙනු ඇත.

තරුණ පිරිස් පුහුණු කොට ඔවුන් සඳහා පිළිගත් සහතිකයක් ප්‍රදානය කිරීමේ අරමුණින්, NVQ 4 හා සමානව පිළිගැනෙන පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා, වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ එක්ව, විෂය මාලාවක් සංවර්ධනය කිරීමේ කාර්යයෙහි අමාත්‍යාංශය විසින් නියුක්තව සිටී.

ගෝලීය තරඟකාරී තත්ත්වයන්ට මුහුණ දිය හැකි ශක්තිමත් සූර්ය බලශක්ති කර්මාන්තයක්, රට තුළ ස්ථාපනය කිරීමේ අරමුණ සපුරා ගනු පිණිස සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය සඳහා පර්යේෂණ සහ පුහුණු පහසුකම් සපයාදෙමින්, 2020 වර්ෂය වන විට අපගේම නිපුණතා සහිත ශ්‍රම බලකායක් සහිතව සූර්ය පැනල නිෂ්පාදන කර්මාන්තයක් ස්ථාපනය කිරීමට මේ හරහා අපේක්ෂා කෙරේ.





අභ්‍යවකාශ තාක්ෂණය

රටෙහි විද්‍යාත්මක ක්ෂේත්‍රය ප්‍රගමනය උදෙසා, අභ්‍යවකාශ තාක්ෂණයන් යොදා ගන්නා අයුරු පිළිබඳ ගවේෂණයන්හි නිරතව සිටින ප්‍රධානතම ආයතනය වන නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක්

ආයතනය විසින්, අභ්‍යාවකාශ තාක්ෂණය ප්‍රවර්ධනය අරමුණු කරගනිමින් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සඳහා, ශ්‍රී ලංකාවේ ප්‍රථම නිනිති චන්ද්‍රිකාව දියත් කිරීම, අභ්‍යාවකාශ තාක්ෂණය පිළිබඳ ජාතික ධාරිතාවන් ප්‍රවර්ධනය, පෘථිවි නිරීක්ෂණ දත්ත ලබා ගැනීමේ සහ බෙදාහැරීමේ ජාතික මධ්‍යස්ථානය සහ BIRDS–3, ඒකාබද්ධ ගෝලීය බහු-ජාතික බර්ඩ්ස් චන්ද්‍රිකා ව්‍යාපෘතිය යනාදිය ඇතුලත් වේ. මෙම සියළු වැඩසටහන්, ජාත්‍යන්තර ආයතන හා සමීප සහයෝගීතාවයෙන් සිදුකෙරෙන අතර එම ආයතන අතරට රුසියාවේ සමාරා රාජ්‍ය ගුවන් අභ්‍යාවකාශ විශ්වවිද්‍යාලය (SSAU), ROSCOSMOS - රුසියානු අභ්‍යාවකාශ නියෝජිතායතනය, කියුටෙක්, ජපානය සහ චීනයේ දුරස්ථ සංවේදන සහ සංඛ්‍යාංක පෘථිවි ආයතනය (RADI) යන ආයතන ඇතුලත් වේ

ශ්‍රී ලංකාවේ අභ්‍යාවකාශ තාක්ෂණය මත පදනම් වූ කර්මාන්ත අංශයක් වැඩිදියුණු කිරීමට මඟ විවර කෙරෙන, අභ්‍යාවකාශ තාක්ෂණයන් පිළිබඳ උසස් තාක්ෂණ සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම, මෙම මූලාරම්භයන් හරහා අපේක්ෂිතය. නිනිති චන්ද්‍රිකාවන් සැලසුම් නිර්මාණය, වැඩිදියුණු කිරීම, ගොඩනැංවීම සහ පරික්ෂාවට ලක් කිරීම යන කාර්යයන් පිළිබඳ හැකියාවන් සහිත ඉංජිනේරුවන් සහ විද්‍යාඥයින් සමූහයක් සංවර්ධනයට ද මෙම මූලාරම්භයන් හරහා හැකියාව ලැබෙනු ඇත.



2020 වන විට 3U නිනිති චන්ද්‍රිකාවක් සැලසුම් නිර්මාණය, සංවර්ධනය සහ දියත් කිරීම

චීනය සහ ශ්‍රී ලංකාව අතර දත්ත සබඳතාවය සහ අදාළව ජාලකරණ පරීක්ෂාව පිළිබඳ චීනය සමඟ ඇතිකරගනු ලබන එකඟතාවය

SSAU හි දී නිනිති චන්ද්‍රිකාවන් හි සැලසුම් නිර්මාණය සහ වැඩිදියුණු කිරීම පිළිබඳ විශේෂිත තාක්ෂණික පුහුණුව



BIRDS–3 හවුල් ගෝලීය බහු රාජ්‍ය බර්ඩ්ස් චන්ද්‍රිකා ව්‍යාපෘතිය 2020 දී දියත් කිරීමට 1 Cube චන්ද්‍රිකාව සැලසුම් නිර්මාණය ACCIMT හි ඉදි කෙරෙන BIRDS–3 භූමි සේවා ස්ථානයෙහි ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙමින්



පෘථිවි නිරීක්ෂණ දත්ත ලබා ගැනීමේ සහ බෙදා හැරීමේ ජාතික මධ්‍යස්ථානය

ජාතික විද්‍යා මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ, හෝමාගම, පිටිපන ප්‍රදේශයේ අති නවීන, ජාත්‍යන්තර මට්ටමේ ජාතික විද්‍යා මධ්‍යස්ථානයක්, ඉදිකිරීමේ කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කොට ඇත. මෙම ජාතික මූලාරම්භයෙහි ප්‍රධාන අරමුණ වනුයේ සියලු වයස් මට්ටම් වල පුද්ගලයින් සඳහා සහ ළමා අවධියේ සිට විද්‍යාත්මක දැනුම්වත් කිරීම් සිදු කිරීම සඳහා විනෝදාස්වාදාත්මක යටිතලයන් සහ විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනයයි.

මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින්, දැනටමත් මේ සඳහා අවශ්‍ය කෙරෙන බිම් කොටස වෙන් කරදී ඇත. ජාතික විද්‍යා මධ්‍යස්ථානයෙහි විවිධ ගැලරි සඳහා යෙදිය යුතු අදාළ තේමාවන් පිළිබඳ සාකච්ඡාවන් සිදු කෙරෙමින් පවතී. ජාතික විද්‍යා මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂයේදී ආරම්භ කෙරෙනු ඇති අතර 2020 වර්ෂය වන විට, විද්‍යාත්මක සහ නවෝත්පාදන චින්තනයන්ට මහ හෙළි කෙරෙන පළමු ජාත්‍යන්තර මට්ටමේ ජාතික විද්‍යා මධ්‍යස්ථානය සමාජයේ සියලු කොටස් සඳහා විවෘත වනු ඇත.

යාන්ත්‍ර විද්‍යාව හරහා සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය

නිෂ්පාදන සැළසුම් නිර්මාණ ඉංජිනේරු (PDE) සමාගම් විසින් ගෝලීය වෙළඳපළෙහි ආකර්ශනයට හේතු වන පරිදි, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදන සැලසුම් නිර්මාණය සහ සහතික කිරීම සිදු කිරීම හරහා, සීඝ්‍ර ආර්ථික වර්ධනයක් අත්කර ගත හැකි වේ. හොන්ඩා, ෆෝඩ්, බෝයිං යනු, ස්ථාපිත

තාක්ෂණයන්, ද්‍රව්‍ය සහ උපාංග භාවිතයට ගනිමින් වෙළඳපළ වෙත නිෂ්පාදනයන් රැගෙන ඒම සඳහා කටයුතු කරන එවැනි PDE සමාගම් (පර්යේෂණ හා සංවර්ධන සමාගම් නොවන) කිහිපයකි. මෙයට අමතරව, සුහුරු යන්ත්‍ර නිෂ්පාදන කර්මාන්ත ශාලාවන්හි, නිෂ්පාදනය කෙරෙන එම සුහුරු යන්ත්‍රයන් (විවිධ රොබෝවරුන්) පදනම් කරගනිමින් සිව්වන කාර්මික විප්ලවය පැන නැගී ඇත්තේ සත්‍ය වශයෙන්ම මෙම යුගය සුහුරු යන්ත්‍ර යුගය බවට පත් කරමිණි. ශ්‍රී ලංකාව තුළ මෙවැනි සමාගම් ඉතා අඩු සංඛ්‍යාවක් පවතින හෙයින්, ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් ප්‍රයෝගයෙන් මුදවාගනු පිණිස මෙවන් සමාගම් නිර්මාණය සඳහා රාජ්‍ය අංශයේ මූල්‍යමය හා වෙනත් සහායයන් ලබාදීම පූර්ව අවශ්‍යතාවයක්ව පවතී. මෙය හඳුනාගත් ශ්‍රී ලංකා රජය විසින් 2017 අයවැය දේශනයේදී යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යාව හරහා සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භයක් (MEDI) ස්ථාපනය සඳහා රුපියල් මිලියන පන්සියයක මුදලක් ලබා දීමට ප්‍රතිඥාවක් ලබාදී ඇත. මෙම මූලාරම්භයෙහි මූලික අරමුණු වනුයේ අපගේ ආර්ථිකය සහ උසස් තාක්ෂණික අපනයනයන් ඉහළ නැංවීමත්, දේශීයව සහ ගෝලීයව බලපත්‍ර යටතේ නිෂ්පාදනය සඳහා සුහුරු යන්ත්‍ර සැලසුම් නිර්මාණය කිරීම හරහා අපගේ ආනයනයන් අවම කරවීමයි.

අමාත්‍යාංශය විසින්, යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යාව සම්බන්ධ PDE සමාගම් සඳහා නිෂ්පාදන සැලසුම් නිර්මාණ ඉංජිනේරු උද්‍යානයක් (PDEP) ස්ථාපනය කිරීමට නියමිත අතර එය සංරචක දෙකකින් සමන්විත වේ. එනම් දීර්ඝ කාලීන ණය පහසුකම (LTLF) සහ හවුල් සේවා සැපයෙන ප්‍රමිතීන් පිළිබඳ පුහුණුව, මූලාකෘතිකරණය සහ පරීක්ෂණ පහසුකම් (SPTF) යන සංරචකයන්ය. යෝජිත (MEDI) මූලාරම්භයේ (SPTF) සංරචකය, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය හරහාත්, LTLF සංරචකය, අමාත්‍ය මණ්ඩලය විසින් දැනටමත් අනුමැතිය ලබාදී ඇති බැංකුවක් හරහාත් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකාවේ උසස් ඉලෙක්ට්‍රොනික විද්‍යාව මත පදනම් වූ නිෂ්පාදන සංවර්ධනයන්



රොබෝ විද්‍යාව සහ කෘත්‍රිම බුද්ධිය (AI)

රොබෝ විද්‍යාව සහ කෘත්‍රිම බුද්ධිය යන අංශයන්හි ලබා ඇති විද්‍යාත්මක ප්‍රගතීන්, අමාත්‍යාංශය විසින් මැදිහත්වීම සිදුකර ඇති ප්‍රමුඛතම ක්ෂේත්‍රයන් ලෙස හඳුනාගනු ලැබ ඇත. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කරනු ලැබ, දැනට කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයේ කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන රොබෝ විද්‍යාත්මක යෙදවුම් සඳහා වන විශිෂ්ටත්ව මධ්‍යස්ථානයක් (CERA) මෙම අරමුණු සපුරා ගැනීම සඳහා දැනටමත් ස්ථාපනය කරනු ලැබ ඇත. නැගී එන තාක්ෂණයන් හා සමඟ මුහුවූ එක් අවස්ථාවක් ලෙස මෙය සැලකිය හැකිය.

පවත්නා සම්පත් සහ රජයේ අරමුදල් උපරිම අයුරින් පරිහරණය කරනු වස්, මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් ප්‍රවර්ධනය කරනු පිණිස කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය සමඟ සහයෝගීතාවයකට එළැඹීමට අමාත්‍යාංශය අදහස් කරන අතර ඒ සඳහා මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා සහාය ලබා දෙමින්, කර්මාන්ත අංශයන්හි රොබෝ විද්‍යාත්මක වේදිකාවන් ස්ථාපනය සඳහා හැකියාව උදාවනු ඇත.

CERA ස්ථාපනය කිරීමේ මූලික අරමුණ වූයේ, ශ්‍රී ලංකාවට ගෝලීය වෙළඳපළෙහි සිදුවන විපර්යාසයන්ට මුහුණ දීමට හැකිවන පරිදි, සහ දේශීය කර්මාන්තයන් කෙරෙහි, වැඩිවන ජනගහනයේ බලපෑම අවම කෙරෙන පරිදි, රොබෝ විද්‍යාව සහ කෘත්‍රිම බුද්ධිය වැනි නැගී එන තාක්ෂණයන් හඳුන්වා දීමය.

2020 වර්ෂය වන විට නිෂ්පාදනය දක්වා වූ රොබෝ විද්‍යාව පිළිබඳ වේදිකාවන් කර්මාන්ත ක්ෂේත්‍රය තුළ නිර්මාණය කිරීමට අපේක්ෂිතය. මේ පිළිබඳව කඩිනමින් ක්‍රියාමාර්ග ගැනෙන ක්ෂේත්‍රයන් දෙකක් වනුයේ පේෂකර්ම සහ බඩු ගබඩා කිරීමේ ක්ෂේත්‍රයන්ය.

අමාත්‍යාංශය විසින්, මේ වන විට, ජාත්‍යන්තර සහයෝගීතාවයන් සමග සබඳතාවයක් නිර්මාණය කර ගැනීමෙහි නියුක්තව සිටින අතර, 2016 වර්ෂයේදී පවත්වනු ලැබූ සමාජ මෙහෙවර උදෙසා විද්‍යාව හා තාක්ෂණ (STS) සම්මන්ත්‍රණය ප්‍රතිඵලයක් ලෙස මෙම කාර්යය සඳහා ජපානයෙන් සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂිතය.

CERA හි ස්ථාපනය කරනු ලැබ ඇති රොබෝ යන්ත්‍ර

II කොටස

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි සංවර්ධන වැඩසටහන්

එක් එක් ආයතනයක් වෙත පැවරී ඇති කාර්යයන් මත පදනම්ව, පර්යේෂණ හා සංවර්ධන, මානව සම්පත් සවිය, විද්‍යාව ප්‍රචලිත කිරීම, සහතිකකරණය සහ ප්‍රතීතනය, ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව සහ වෙනත් සංවර්ධන මූලාරම්භයන් යන විවිධ අංග යටතේ, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි ප්‍රගතිය විස්තර කරනු ලැබේ.

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT)

1. පසුබිම

ශ්‍රී ලංකාව සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීම, කඩිනම් කරවීම සහ නවීන තාක්ෂණ ක්ෂේත්‍රයන්හි අනාගත අධ්‍යනයන් ප්‍රවර්ධනය කිරීම නවීන තාක්ෂණය පිළබඳ ආතර් සී. ක්ලාක් ආයතනයෙහි ප්‍රධාන කාර්යභාරය වේ. මේ සඳහා සන්නිවේදනය සහ ඒ හා සම්බන්ධිත විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව, අභ්‍යවකාශ තාක්ෂණය, රොබෝ තාක්ෂණය, ප්‍රකාශ විද්‍යාව සහ නව ද්‍රව්‍ය ඇතුළත් වේ.

2. ප්‍රගතිය

2.1 මානව සම්පත් සවිය

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ කාර්යයන් සපුරාලීමේදී පහතින් දක්වා ඇති මානව සම්පත් පදනම හරහා ක්‍රියාත්මක වේ.



2.2 පර්යේෂණ යොමුව

පැවරී ඇති කාර්යයන් හා අනුකූලව, ආතර් සී. ක්ලාක් ආයතනයේ පර්යේෂණ යොමුව ප්‍රධාන වශයෙන් විද්‍යුත්, ඉලෙක්ට්‍රෝන විද්‍යා, අභ්‍යවකාශ තාක්ෂණය සහ තාරකා විද්‍යාව යන අංශයන් කෙරෙහි යොමුවී ඇත. තාරකා විද්‍යාව පිළිබඳ පර්යේෂණයන්ට අමතරව අනෙකුත් සියල්ල ව්‍යවහාරික පර්යේෂණයන් වේ. පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි සාරාංශයක් පහතින් දක්වා ඇත.



2.3 පර්යේෂණ වාණිජකරණය

රැහැන් රහිත ආරක්ෂිත දත්ත ලඝුර (Wireless Seared Data Logger) පිළිබඳ පර්යේෂණයක් මහජන උපයෝගීතා කොමිසම වෙත වාණිජකරණය සිදුකිරීමට ආතර් සී. ක්ලාක් ආයතනයට හැකියාව ලැබිණි.

රැහැන් රහිත ආරක්ෂිත දත්ත ලඝුර

මෙම කාලච්ඡේදය තුළදී, ආරක්ෂිත ආවේක්ෂණ පද්ධතීන් සඳහා එක් දේශීය පේටන්ට් බලපත්‍රයක් 2017 වර්ෂයේදී ලබාගැනීමට ආතර් සී. ක්ලාක් ආයතනයට හැකියාව ලැබිණි.

ආතර් සී. ක්ලාක් ආයතනයේ විද්‍යාඥයින්ගේ සහ ඉංජිනේරුවන්ගේ ධාරිතාවයන් වැඩිදියුණු කිරීම සහ දැනුම නිර්මාණය වර්ධනය කිරීම සඳහාත්, දේශීයව සහ ජාත්‍යාන්තරව පිළිගත් ජර්නලයන්හි පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීමට ආතර් සී. ක්ලාක් ආයතනය විසින් පියවර ගනු ලැබ ඇත. පසුගිය වසර තුන තුළ එලෙස පළ කළ ප්‍රකාශනයන්හි සාරාංශයක් පහත දක්වා ඇත.



2.4 තාක්ෂණික සේවාවන් සැපයීම

පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්ට අමතරව, විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා තොරතුරු හා තාක්ෂණය පදනම් කරගත් විසඳුම් යනාදී ක්ෂේත්‍රයන් ප්‍රධාන කොට කාර්මික ක්ෂේත්‍රය වෙත, තාක්ෂණික සේවා සැපයීමට ආතර් සී. ක්ලාක් ආයතනය විසින් පියවර ගනු ලැබ ඇත. පසුගිය වසර තුන තුළ සපයනු ලැබූ තාක්ෂණික සේවාවන් සහ උපයාගත් අදායමෙහි සාරාංශයක් පහතින් දක්වා ඇත.



පසුගිය වසර තුන තුළ උපයාගත් අදායමෙහි සාරාංශය



2.1. මූල්‍යමය ආයෝජන

අභ්‍යවකාශ තාක්ෂණය, තාරකා විද්‍යාව, විද්‍යුතය, ඉලෙක්ට්‍රොනික් විද්‍යාව යනාදිය හා අදාළව නවීන තාක්ෂණයන් පිළිබඳ රජය විසින් සිදුකළ මූල්‍යමය ආයෝජනයන් පහත වගුවෙහි දක්වා ඇත.



3. 2018 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- 3 U නිනිති තාක්ෂණ චන්ද්‍රිකාවක් නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම සහ දියත් කිරීම
- ගුවන් නියමු පුහුණුව සඳහා Fixed wing UAV සහ දුරස්ථ සංවේදනය සඳහා වැඩිදුර සංවර්ධනය කිරීම
- අවේක්ෂණ යෙදවුම් සඳහා ඩ්‍රෝන යන්ත්‍රයක් වැඩිදියුණු කිරීම
- පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබාගැනීම සහ බෙදාහැරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් - Roscosmos (රුසියාව) සහ RADI (චීනය) පුරවැසි පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා වෙතින් දත්ත ලබාගැනීම සඳහා භූමි සේවා ස්ථාන දෙකක් ස්ථාපනය කිරීම.
- ශ්‍රී ලංකාවේ අභ්‍යවකාශ තාක්ෂණ හැකියාවන් අත්කර ගැනීම සහ වැඩිදියුණු කිරීම
- වායුගෝලීය තාක්ෂණයන්, අභ්‍යවකාශ තාක්ෂණයන් සහ යෙදවුම්, රොබෝ විද්‍යාව සහ ජෛවවෛද්‍ය ඉංජිනේරු විද්‍යාව යන අංශයන්හි මානව සම්පත් ධාරිතා සංවර්ධනය
- කෙටි පණිවිඩ සේවය සහ වෙබ් තාක්ෂණයන් ඒකාබද්ධ කිරීම
- තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති සහ තාරකා විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකරකම්

කාර්මික තාක්ෂණ ආයතනය (ITI)

1. පසුබිම

ආහාර, ඖෂධ ද්‍රව්‍ය සහ පරිසරය යන සිව් ක්ෂේත්‍රයන් පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් ආර්ථික වර්ධනය සහ මානව සුබසාධනය සඳහා වන තාක්ෂණයන් අතර මනා සමතුලිතතාවයක් පවත්වා ගැනීම සඳහා පරිශ්‍රම දරණ බහුවිෂයානුබද්ධ කාර්මික පර්යේෂණ ආයතනයක් ලෙස සිය භූමිකාව අඛණ්ඩව පවත්වා ගැනීමට කාර්මික තාක්ෂණ ආයතනය සමත්ව ඇත. කාර්මික තාක්ෂණ ආයතනය මගින් සපයනු ලබන සේවාවන් අතර කර්මාන්ත ක්ෂේත්‍රයේ වත්මන් අවශ්‍යතා සපුරාලීම සඳහා තරඟකාරී කාර්මික සේවා සැපයීම, දේශීය සම්පත් ඇසුරෙන් උසස් සහ තිරසාර වටිනාකම් ලබාගනු වස් මධ්‍ය සිට දීර්ඝකාලීන පර්යේෂණයන්හි නිරත වීම, අදාළ තාක්ෂණයන් පවරාදීම හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි ආදායම් මට්ටම් ඉහළ නැංවීම, ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාව හා තාක්ෂණය මත පදනම් වූ විසඳුම් ඉදිරිපත් කිරීම යනාදිය වේ.

2. ප්‍රගතිය

2.1 මානව සම්පත් සවිය

කාර්මික තාක්ෂණ ආයතනය වෙත පැවරී ඇති කාර්යයන් සපුරාලීමේදී පහතින් දක්වා ඇති මානව සම්පත් පදනම සමඟ එය ක්‍රියාත්මක වේ.



2.2 පර්යේෂණ යොමුව

බහු විෂයානුබද්ධ පර්යේෂණ ආයතනයක් වීම හේතුවෙන්, විවිධ පර්යේෂණ පිළිබඳව කාර්මික තාක්ෂණ ආයතනයේ අවධානය යොමු වී ඇත. ආහාර, ශාකසාර ඖෂධ ද්‍රව්‍ය, රසායනික තාක්ෂණය යනාදිය, එම පර්යේෂණ ක්ෂේත්‍රයන් අතරට ගැනේ. මෙම සියලු පර්යේෂණයන් කර්මාන්ත ක්ෂේත්‍රය හා සම්බන්ධව සිදු කෙරේ. පසුගිය වසර තුන ඇතුළත සම්පූර්ණ කරනු ලැබූ පර්යේෂණයන්හි තොරතුරු සහ 2017 වර්ෂයේ දැනට සිදු කෙරෙන පර්යේෂණ පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.



කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යාඥයින්ගේ සහ ඉංජිනේරුවන්ගේ දැනුම සහ ධාරිතා වර්ධනය අරමුණු කරගනිමින්, දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්ව ඇති ජර්නලයන්හි පර්යේෂණ පත්‍රිකා පළකිරීමට කාර්මික තාක්ෂණ ආයතනය විසින් අඛණ්ඩව කටයුතු කෙරිණි. පසුගිය වසර තුන තුළ පළ කරනු ලැබූ ප්‍රකාශනයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.



2.3 පර්යේෂණ වාණිජකරණය

රටෙහි ප්‍රමුඛතම රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනයක් වන කාර්මික තාක්ෂණ ආයතනය විසින් රාජ්‍ය අර්ධය, බලපත්‍රලාභීන් ලියාපදිංචි කිරීම, විශේෂ හිමිකම් යනාදී විවිධ යාන්ත්‍රණ හරහා සිය තාක්ෂණික නිෂ්පාදනයන් වාණිජකරණය කිරීමට අඛණ්ඩව පියවර ගන්නා ලදි. පසුගිය වසර තුන තුළ වාණිජකරණය කරනු ලැබූ තාක්ෂණයන් පහතින් දක්වා ඇත.



කාර්මික තාක්ෂණ ආයතනය විසින් සිදුකෙරෙන පර්යේෂණයන්හි ප්‍රතිඵලයක් ලෙස, පසුගිය වසර තුනක කාලය තුළ පහත සඳහන් කර ඇති පේටන්ට් අයදුම් කර බලපත්‍ර ලබා ගැනීමට හැකියාව ලැබී ඇත. විවිධ පර්යේෂණ ක්ෂේත්‍රයන්හි නව පර්යේෂණ හා සංවර්ධන ප්‍රයත්නයන් සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය සඳහා කාර්මික තාක්ෂණ ආයතනය විසින් ගනු ලබන අඛණ්ඩ ප්‍රයත්නයන් මෙමඟින් පෙන්නුම් කෙරේ.





2.4 විද්‍යාගාර පුළුල් කිරීම සහ ප්‍රතීතනය

- නවීන තාක්ෂණය ඇසුරෙන් උසස් පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුක්ත වීම සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් තාක්ෂණික සේවාවන් සපයා දීම අරමුණු කරගනිමින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ මාලඹේ හි නවීන පර්යේෂණ හා සංවර්ධන සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු කාර්මික තාක්ෂණ ආයතනය විසින් ආරම්භ කරන ලදි. ශාකසාර සහ ආහාර තාක්ෂණ අංශයන් සඳහා අතිනවීන විද්‍යාගාරයන් තනා නිම කිරීමට හැකි වූ අතර, මෙම විද්‍යාගාරයන් දැනටමත් නව කාර්යාල පරිශ්‍රයෙහි භාවිතයට ගෙන ඇත.
- විද්‍යාගාර ප්‍රතීතන ක්‍රියාවලිය පුළුල් කරමින්, විශාල පරාසයක් තුළ විහිදුණු ක්ෂේත්‍රයන්හි පරාමිතීන් 94 ක් සඳහා ප්‍රතීතනය ලබා ගැනීමට කාර්මික තාක්ෂණ ආයතනයට හැකියාව ලැබිණි. එම ක්ෂේත්‍ර වනුයේ පොහොර, ජලය සහ අපජලය යනාදියෙහි අඩංගු ලෝහ, ජලයෙහි සහ පළතුරු සහ එළවළු යනාදියෙහි අඩංගු වන කෘමිනාශක අවශේෂයන්, ශාක වර්ධන නියාමකයන්, ප්‍රතිජීවක අවශේෂයන්, මත්ස්‍යයන් තුළ අඩංගු හිස්ටිමීන් යනාදිය වේ. කාර්මික තාක්ෂණ ආයතනයෙහි ප්‍රතීතනය ලත් විද්‍යාගාරයන්හි තොරතුරු පහත සාරාංශ ගත කර ඇත.

ප්‍රතීතනය	විද්‍යාගාරය	ප්‍රතීතන ක්ෂේත්‍රය	පරාමිතීන් සංඛ්‍යාව
ISO 17025: 2005 QMS (ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය)	රසායනික සහ ක්ෂුද්‍රජීවී විද්‍යා විද්‍යාගාරය	ආහාර, පොහොර, ක්ෂුද්‍ර ජීවී විද්‍යාව, ජල සහ අපජල, රූපලාවන්‍ය ආලේපන	180
	කාර්මික මිණුම් විද්‍යාගාරය	උෂ්ණත්වය, ස්කන්ධය, පීඩනය, විදුලිය, පරිමාව, පරිමාණය	40
	ද්‍රව්‍ය විද්‍යාගාරය	පිඟන් මැටි, රබර්, සිමෙන්ති	22
	විද්‍යුත් තාක්ෂණ විද්‍යාගාරය	ශබ්ද සහ කම්පන	06
	අවශේෂ විශ්ලේෂණ විද්‍යාගාරය	කෘමිනාශක අවශේෂයන්, හිස්ටමීන්, ප්‍රතිජීවක අවශේෂ, සුඩාන් ඩයි බැර ලෝහ	65
ISO 9001: 2008 QMS (ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය)	ආහාර තාක්ෂණ අංශය, ඖෂධීය ශාක තාක්ෂණ අංශය, ද්‍රව්‍ය තාක්ෂණ අංශය, පාරිසරික තාක්ෂණ අංශය, තොරතුරු සේවා කේන්ද්‍රය		

2.5 තාක්ෂණික සේවා සැපයීම

පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා රජයේ අරමුදල් සැපයෙන මුත්, සිදුකෙරෙන ආයෝජනයන්ගෙන් සැලකිය යුතු කොටසක් සඳහා කර්මාන්ත සහ අනෙකුත් අදාළ පාර්ශවයන් වෙත තාක්ෂණික සේවා සැපයීම සඳහා උත්පාදනය කරගනු ලැබූ සිය අරමුදල් යෙදවීමට කාර්මික තාක්ෂණ ආයතනය විසින් පියවර ගනු ලැබේ. මෙම උත්පාදනය කරගනු ලබන සියලුම ඉපැයීම් පාහේ, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි විෂය පථය පුළුල් කිරීමටත් විශ්වසනීය පරීක්ෂා සේවාවන් සපයාදීමටත් ආයෝජනය කෙරේ. පසුගිය වසර තුනක කාලය තුළ කාර්මික තාක්ෂණ ආයතනය විසින් උපයාගනු ලැබූ ආදායම් හි සාරාංශයක් පහතින් දක්වා ඇත.





2.6 විද්‍යාව ප්‍රචලිත කිරීම

රටෙහි ප්‍රමුඛතම රාජ්‍ය පර්යේෂණ ආයතනයක් ලෙස ක්‍රියාකරමින් විවිධ යාන්ත්‍රණ හරහා විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදනයන් ප්‍රවර්ධන කිරීම සඳහාත්, කාර්මික තාක්ෂණ ආයතනය විසින් පියවර ගනු ලැබේ. විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකරකම්හි සාරාංශයක් පහතින් දක්වා ඇත.

අවධානය යොමු කෙරෙන ක්ෂේත්‍රය	ප්‍රචලිත කිරීමේ ක්‍රමය
වකුගඩු රෝග, කෘෂි රසායන භාවිතය සහ ඒ ආශ්‍රිත සෞඛ්‍ය ගැටලු	දැනුම්වත් කිරීමේ වැඩසටහන්
ගස්ලබු සහ අඹ සඳහා පසු අස්වනු කළමනාකරණ	"ගොවි මිතුරු" තොරතුරු බෙදා හැරීමේ වැඩසටහන්
ශ්‍රී ලාංකීය ඖෂධීය පැළෑටි වල එන්සයිම නිෂේධක සහ ප්‍රතිඔක්සිකාරක හැකියාවන්	ග්‍රන්ථයක්
මැටි ජල පෙරනය	ගුවන් විදුලි වැඩසටහන
ශ්‍රී ලංකාවේ පශු සම්පත් සඳහා වර්ධක හොමෝනය අහඹු ලෙස භාවිතා කිරීම සහ පාරිභෝගිකයින් වෙත ඉන් ප්‍රතිඵල වන සෞඛ්‍යමය බලපෑම	

පළතුරු විජලනය සහ ව්‍යාපාර සංවර්ධනය	රූපවාහිනී සාකච්ඡාව
ඉදිකරනු ලැබූ තෙත්බිම් තාක්ෂණය සහ ETS විද්‍යාගාරය පිළිබඳ ප්‍රදර්ශනය කර පෙන්වීම	
වස විසෙන් තොර රටක්	
නීත්‍යානුකූල නොවන අයුරින් වන ජීවීන් වෙළඳාම් කිරීම වැළැක්වීම සඳහා විද්‍යා හා තාක්ෂණය භාවිතය	වැඩමුළුව
විෂ සහිත අවශේෂයන් හා අදාළ සෞඛ්‍ය ගැටලු, කාර්මික තාක්ෂණ ආයතනය සතුව පවතින විශ්ලේෂණ හැකියාවන් සහ "වස විසෙන් තොර රටක් " යන තේමාව යටතේ කාර්මික තාක්ෂණ ආයතනය විසින් ඉටු කෙරෙන කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීම.	වැඩමුළුව
පරමාණුක අවශෝෂණ වර්ණාවලි දීප්තිමානය හරහා ජලයේ සහ පසෙහි බැර ලෝහ විශ්ලේෂණය	පුහුණු වැඩමුළුව

කාර්මික තාක්ෂණ ආයතනයේ ව්‍යවසායකත්ව වැඩමුළු

2.7 මූල්‍යමය ආයෝජන

කාර්මික තාක්ෂණ ආයතනයෙහි පර්යේෂණ වියදම් පිරිවැය වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් සපුරනු ලබයි. පසුගිය වසර තුන පුරා රජය විසින් සිදුකළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු පිළිබඳ සාරාංශය පහත දැක්වේ.



3. 2018 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- රට තුළ දැනුම මත පදනම් වූ ආර්ථිකයක් නිර්මාණය කිරීමේ අරමුණ සපුරාගනු පිණිස, ආහාර, ස්වභාවික නිෂ්පාදන සහ සාම්ප්‍රදායික දැනුම, රසායනික විශ්ලේෂණය සහ සුරක්ෂිතතාවය සහ ජෛව තාක්ෂණය යන අංශයන් පිළිබඳ විශිෂ්ටත්ව මධ්‍යස්ථානයන් ස්ථාපනය කිරීමට කාර්මික තාක්ෂණ ආයතනය අපේක්ෂා කරයි.
- විද්‍යා හා තාක්ෂණ පාසල ස්ථාපනය කිරීම.
- චීන ශ්‍රී ලාංකා ඒකාබද්ධ ජෛව තාක්ෂණ විද්‍යාගාරය සහ චීන ශ්‍රී ලාංකා තාක්ෂණ පැවරුම් මධ්‍යස්ථානය සමස්ථාපනය කිරීම.
- අන්තර්ජාතික කාලගුණ සහ පාරිසරික විද්‍යා මධ්‍යස්ථානය (ICCES), චීන විද්‍යා ඇකඩමිය සමඟ සහයෝගීතාවයෙන් ඒකාබද්ධ කාලගුණ පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.
- නවීන පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය තුළ බීජෞෂණ පහසුකම ස්ථාපනය කිරීම.
- කොළඹ පිහිටි පරිශ්‍රය තුළ ව්‍යාපාරික මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම.
- අති නවීන මානව සෛල රෝපණ විද්‍යාගාරයක්, නවීන ඖෂධ විද්‍යාත්මක පරීක්ෂා විද්‍යාගාරයක් සහ ඛනිජ තෙල් පරීක්ෂා විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම.

ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)

1. පසුබිම

ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) රටෙහි සංවර්ධන වැඩසටහන් සිදුකෙරෙන ප්‍රධාන ක්ෂේත්‍රයන් හා සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නිරතව සිටින අතර, පිරිවැය ඵලදායී ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය, සුරක්ෂිත පානීය ජලය, ජෛවස්කන්ධ බලශක්ති යෙදවුම්, බලශක්ති සහ පරිසරය, කෘෂිකර්මය සහ ආහාර සුරක්ෂිතතාවය යන අංශයන් ඒ යටතට ගැනේ. නර්ඩ් මධ්‍යස්ථානයේ පර්යේෂණ සොයා ගැනීම් සහ එමඟින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතීන් හරහා, ඉදිකිරීම් සඳහා වැයවන ඉහළ පිරිවැය, බලශක්ති අර්බුදය, ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම්, ප්‍රවාහනයේදී ආහාර අපතේ යාම සහ පාරිසරික ගැටලු යනාදිය සඳහා විසඳුම් ලබා දී ඇත.

2. ප්‍රගතිය

2.1. මානව සම්පත් සවිය

නර්ඩ් මධ්‍යස්ථානය වෙත පැවරී ඇති කාර්යයන් සපුරාලීමේදී, පහතින් සඳහන් කර ඇති මානව සම්පත භාවිතයෙන් එය ක්‍රියාත්මක වේ.



2.2. පර්යේෂණ යොමුව

ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කාර්යයෙහි නියුක්ත ආයතනයක් ලෙස, නර්ඩ් මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අවධානය සීමා වී ඇත්තේ, ඉංජිනේරුමය ක්ෂේත්‍රය කෙරෙහි වුවද කෘෂිකර්මාන්තය, නිවාස, ජෛව වෛද්‍ය විද්‍යාව යනාදී විවිධ අංශයන්හි පර්යේෂණයන්හිද නියුක්තව සිටී. පසුගිය වසර තුන ඇතුළත සම්පූර්ණ කරනු ලැබූ පර්යේෂණයන්හි තොරතුරු සහ 2017 වසර තුළ ක්‍රියාත්මක පර්යේෂණ පිළබඳ තොරතුරු පහතින් දක්වා ඇත.



2.3. පර්යේෂණ වාණිජකරණය

නර්ඩ් මධ්‍යස්ථානයේ තාක්ෂණයන්හි පර්යේෂණ වාණිජකරණය ප්‍රධාන වශයෙන් සිදු කෙරෙනුයේ බලපත්‍ර හරහාය. නර්ඩ් මධ්‍යස්ථානය විසින් ග්‍රාමීය ප්‍රදේශයන්හි භාවිතයට ගැනෙන ඒදඬු සඳහා විකල්පයක් ලෙස සිය අඩි පාලම් (Foot Bridge) තාක්ෂණය ප්‍රවර්ධනය සඳහා අමාත්‍යාංශය හා සහයෝගිතාවයෙන් දැනටමත් පියවර ගනු ලැබ ඇත. මේ සඳහා දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. පසුගිය වසර තුන ඇතුළත වාණිජකරණය කරනු ලැබූ තාක්ෂණයන් පහතින් දක්වා ඇත.



නර්ඩ් මධ්‍යස්ථානය විසින් සිදුකෙරෙන පර්යේෂණයන්හි ප්‍රතිඵලයක් ලෙස, සිවිල් ඉංජිනේරු විද්‍යාව හා සම්බන්ධ පේටන්ට් බලපත්‍ර දෙකක් සහ බලශක්ති සහ පරිසර ක්ෂේත්‍රයන්හි පේටන්ට් බලපත්‍ර දෙකක් සඳහා අයදුම් කොට එම බලපත්‍ර ලබා ගැනීමට, නර්ඩ් මධ්‍යස්ථානයට හැකියාව ලැබී ඇත. නර්ඩ් මධ්‍යස්ථානය විසින්, 2017 වසරේදී කෘෂිකර්මාන්ත සහ පසු අස්වනු ක්ෂේත්‍රයේ දේශීය පේටන්ට් බලපත්‍රයක් ලබා ගෙන ඇත.

නර්ඩ් මධ්‍යස්ථානයේ ඉංජිනේරුවන්ගේ හැකියාවන් සහ දැනුම වර්ධනය සඳහා දැව වහල රාමු සඳහා පිරිවැය ඵලදායී දැව පරාල හඳුන්වා දීම, තුනී මිශ්‍රණයක් භාවිතයෙන් ගඩොල් දුම් කවුළු විශ්ලේෂණය කිරීම සඳහා ආකෘතියක් වැඩි දියුණු කිරීම පිළිබඳ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීමට නර්ඩ් මධ්‍යස්ථානය සමත් වී ඇත. දේශීය ජ’ර්නලයන්හි පත්‍රිකා පළ කිරීම පිළිබඳ සාරාංශය පහත දක්වා ඇත.



2.4. තාක්ෂණික සේවා සැපයීම

රාජ්‍ය අරමුදල් සීමා සහිත වීම හේතුවෙන්, නව තාක්ෂණයන් වැඩිදියුණු කිරීම උදෙසා නර්ඩ් මධ්‍යස්ථානය මඟින් උත්පාදනය කරගනු ලබන අරමුදල් සැලකිය යුතු මට්ටමින් ආයෝජනය කිරීම සිදු කෙරේ. මෙම අරමුදල් උත්පාදනය කර ගැනෙනුයේ නර්ඩ් මධ්‍යස්ථානය විසින් සපයනු ලබන තාක්ෂණික සේවාවන් සහ උපදේශනයන් හරහාය.



2.5. විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රදර්ශනාත්මක වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු යනාදිය ඇතුළත් විවිධ ප්‍රචලිත කිරීමේ වැඩසටහන් හරහා තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමට නර්ඩ් මධ්‍යස්ථානය විසින් අඛණ්ඩව පියවර ගන්නා ලදි. මෙම කාලච්ඡේදය තුළදී නර්ඩ් මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලැබූ පර්යේෂණ ප්‍රවර්ධනයන් සහ විද්‍යාව ප්‍රචලිත කිරීම්හි සාරාංශය පහත පරිදි වේ.

අවධානය යොමු වූ ක්ෂේත්‍රය	ප්‍රචලිතකරණ ක්‍රමය
පිරිවැය ඵලදායී ඉදිකිරීම් තාක්ෂණය	අත්පොත
සෙවිලි උළු සහ ඇස්බැස්ටස් තහඩු නිෂ්පාදනය	කර්මාන්ත අංශයේ හමුවක්
ගුරු පුහුණුකරුවන් සඳහා තිරසර බලශක්ති යෙදවුම්	පුහුණු වැඩසටහනක්
නැගී එන තාක්ෂණය පිළිබඳ විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන	තරුණ නව නිපැයුම්කරුවන්, පාසල් සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක්

2.6. මූල්‍යමය ආයෝජන

රජය විසින් පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ සිදුකෙරෙන ආයෝජනයන් සංසන්දනාත්මකව පහළ අගයක් ගනී. මෙයට අමතරව, සාමාජය වෙත තත්ත්වයෙන් උසස් සහ තාක්ෂණිකව යාවත්කාලීන කරනු ලැබූ සේවාවන් සපයනු වස් පර්යේෂණ ආයතනයන්හි පර්යේෂණ හා සංවර්ධන හා අදාළ යටිතල පහසුකම් යාවත්කාලීන කිරීමේ අඛණ්ඩ අවශ්‍යතාවයක් පවතී. මෙම අවශ්‍යතාවය සලකා බලමින්, රාජ්‍ය අරමුදල්, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සහ පර්යේෂණ සහ සංවර්ධන යටිතලයන් සඳහා ආයෝජනය කිරීමට නර්ඩ් මධ්‍යස්ථානය විසින් ප්‍රමුඛතාවය ලබා දේ. මෙය පැහැදිලිව පහත ප්‍රස්තාරයේ දක්වා ඇත.



3. 2018 වර්ෂය සඳහා සැලසුම් කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම්

- නර්ඩ් තාක්ෂණය භාවිතයෙන් රාජ්‍ය ගොඩනැඟිලි ඉදිකිරීම
- අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා සහයෝගීතාවයෙන් අඩිපාලම් තැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- යාන්ත්‍ර ඉලෙක්ට්‍රෝනික විද්‍යාව මඟින් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භයෙහි මූලාකෘතිකරණය සහ පරීක්ෂණ පහසුකම් (SPTF) සංරචකය ක්‍රියාත්මක කිරීම
- ව්‍යාපාර ආරම්භයන් සඳහා පහසුකම් සපයනු වස් ව්‍යාපාර බීජෞෂණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම
- නව සහ සුදුසු තාක්ෂණයන් වැඩි දියුණු කිරීම

ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)

1. පසුබිම

මූලික පර්යේෂණ අංශය සඳහා වෙන්වූ රටෙහි ප්‍රමුඛතම ආයතනය වනුයේ ජාතික මූලික අධ්‍යයන ආයතනයයි. පූර්වයෙන් ක්‍රියාත්මක වූ 1981 අංක 55 දරණ මූලික අධ්‍යයන ආයතන පනත, 2014 අංක 25 දරණ පනත මඟින් සංශෝධනයට ලක්විය. එහි ප්‍රධාන අරමුණ වූයේ, මූලික අධ්‍යයනයන් හා සම්බන්ධ පර්යේෂණ සහ මූලික විමර්ශනයන් ආරම්භ කිරීම හා ප්‍රවර්ධනයත්, එකී අධ්‍යයනයන්ට අදාළව අවශ්‍යතාවයට අනුකූල වන සේ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික ආයතනයන් හා සහයෝගීතාවයන්ට එළඹීමත්ය.

2. ප්‍රගතිය

2.1 මානව සම්පත් සවිය

ආයතනය වෙත පැවරී ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී, ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් පහතින් දක්වා ඇති මානව සම්පත් පදනම ඇසුරෙන් ක්‍රියාත්මක වේ.



2.2 පර්යේෂණ යොමුව

ජාතික මූලික අධ්‍යයන ආයතනය ප්‍රධාන වශයෙන් තම ආයතනය වෙත පැවරී ඇති කාර්යයන් හා අනුකූලව මූලික පර්යේෂණයන්හි නිරතව සිටින අතර එම පර්යේෂණයන් වාණිජකරණය දක්වා අඛණ්ඩව මෙහෙයවීම සිදු කරයි. පසුගිය වසර තුන ඇතුළත ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘතීන්හි සාරාංශයක් පහතින් දක්වා ඇත.



ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණ ක්‍රියාවලියේදී ලද ප්‍රතිඵල ඇසුරෙන් ඉදිරිපත් කරන ලද පේටන්ට් බලපත්‍ර පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.



2.3 මූලික පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් ප්‍රවර්ධනය කිරීම

මෙම කාලච්ඡේදය තුළ, ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ මූලික පර්යේෂණයන්හි සහ ඒ හරහා ලද ප්‍රතිඵලයන්හි සාරාංශයක් පහත වගුවෙහි දක්වා ඇත.

පර්යේෂණ යොමුව	ප්‍රතිඵල
ජෛව ශක්ති සහ පාංශු පරිසර පද්ධති	ශ්‍රී ලංකාවේ ප්‍රථම ඩිජිටල් පාංශු සිතියම
ස්වභාවික නිෂ්පාදන	ශාක සහ දිලීර සම්භවයක් සහිත, ජෛව ක්‍රියාකාරී සංයෝග කිහිපයක් හඳුනාගැනීම.
පුනර්ජනනීය බලශක්ති	ඩයි සඳහා සංවේදී සූර්ය කෝෂවල කාර්යක්ෂමතාව ඉහළ නංවනු පිණිස, ස්තර තුනකින් යුක්ත TiO_2 ප්‍රකාශ ඇනෝඩයක් සැකසීම
නිනිති තාක්ෂණ සහ උසස් ද්‍රව්‍ය	ශ්‍රී ලාංකීය ස්වභාවික නිධි මිනිරන් භාවිතයෙන්, විද්‍යාගාර මට්ටමේ ඇනෝඩ ඉලෙක්ට්‍රෝඩ සහිත ලිතියම් අයන කෝෂ සැකසීම සහ පරීක්ෂා කිරීම
ද්‍රව්‍ය සැකසීම සහ උපක්‍රම වැඩි දියුණු කිරීම	• පිරිසිදු කරනු ලැබූ පොල් කටු භාවිතයෙන්, ඉහළ ඉලෙක්ට්‍රොනික සන්නායකතාවයක් සහිත, උසස් තත්ත්වයේ සක්‍රීය කාබන් සැකසීම සඳහා නව්‍ය සහ අඩු වියදම් ක්‍රමවේදයක් වැඩි දියුණු කිරීම. • බලශක්ති නිෂ්පාදනය සඳහා අඩු වියදම් සුපිරි ධාරිත්‍රක සහ සූර්ය කෝෂ පැනල වැඩි දියුණු කිරීම.

අවශ්‍යතා මත පදනම් වූ පර්යේෂණ ප්‍රවර්ධනය සහ සහතික කරනු පිණිස විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ, පර්යේෂණ මත පදනම් වූ උපාධි වැඩසටහන් සහ ආචාර්ය උපාධි වැඩසටහන් අධීක්ෂණය කිරීම ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් අඛණ්ඩව සිදුකෙරිණි. පසුගිය වසර තුන තුළ, ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින්, එලෙස අධීක්ෂණයට ලක් කළ උපාධි වැඩසටහන්හි සාරාංශයක් පහත දක්වා ඇත.



2.4 පර්යේෂණ වාණිජකරණය

කාර්මික ක්ෂේත්‍රයේ භාවිතය සඳහා ජෛව පටල ජෛව පොහොර සහ රයිසෝබියම් වාණිජකරණය කිරීමට ජාතික මූලික අධ්‍යයන ආයතනයට හැකියාව ලැබී ඇත. පසුගිය වසර තුන ඇතුළත 20,000 කට ආසන්න ගොවීන් සංඛ්‍යාවකට මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රතිලාභ අත්විණි.

ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ පර්යේෂණයන්හි ප්‍රතිඵලයක් ලෙස, පසුගිය වසර තුන තුළදී, දේශීය සහ ජාත්‍යන්තර ජ'ර්නලයන්හි ලිපි කිහිපයක් පළ කිරීමට හැකියාව උදා වූ අතර එලෙස පළ කළ ලිපි පහත දක්වා ඇත.



2.5 විද්‍යාව ප්‍රචලිත කිරීම

ජාතික මූලික අධ්‍යයන ආයතනය, විද්‍යාව ප්‍රචලිත කිරීමේ කාර්යයන් සඳහා සැලකිය යුතු අන්දමේ කාලයක් මිඩංගු කරන අතර දේශන, සම්මන්ත්‍රණ e- වැඩසටහන් යනාදිය මේ යටතේ ක්‍රියාත්මක කෙරේ. ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් විද්‍යාව ප්‍රචලිත කිරීම අරමුණු කරගනිමින් මෙම කාලච්ඡේදය තුළ පවත්වන ලද තාක්ෂණික සම්මන්ත්‍රණ සහ දේශන වල සාරාංශයක් පහතින් දක්වා ඇත.

අවධානය යොමුකෙරෙන ක්ෂේත්‍ර	ප්‍රචලිත කිරීමේ ක්‍රමය
වායුගෝලීය ක්ෂුද්‍ර ජීවීන් පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක යෙදීමේ විද්‍යාත්මක ක්‍රමවේදය	හඟුරන්කෙත අධ්‍යාපනික කලාපයේ විද්‍යා ගුරුවරු සඳහා දෙදින පුහුණු වැඩමුළුවක්
පාරිසරික දූෂණය පිළිබඳ අත්හදා බැලීම් පර්යේෂණ	ජාතික විශ්වවිද්‍යාලයන්හි උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි ශිෂ්‍යයින් පුහුණු කිරීම
ජාත්‍යන්තර මිහිතල විද්‍යා ඔලිම්පියාඩ් තරඟය- 2017 සඳහා ශිෂ්‍යයින් සූදානම් කරවීම	ශිෂ්‍යයින් පුහුණු කිරීම
බුද්ධිමය දේපළ හිමිකම්	දැනුම්වත් කිරීමේ වැඩසටහන්
නව කෝණයකින් සොබාදහම දෙස බැලීමට පාසල් ශිෂ්‍යයින් යොමු කිරීම	"සොබා දහමේ රහස් විද්‍යාව අනුගමනය කරයි" ජාතික තරඟාවලිය පැවැත්වීම

විද්‍යාත්මක සංකල්ප හඳුනාගැනීමට සහ ඒවායේ යෙදවුම් සඳහා, පාසල් සිසුන් තුළ පවතින කුතුහලය හා කැමැත්ත වර්ධනය කරවීම	''විද්‍යාව හරහා ලෝකය දැකීම'' පළාත් මට්ටමේ තරඟය පැවැත්වීම
තෝරාගත් ප්‍රමුඛ විද්‍යා ක්ෂේත්‍රයන් කිහිපයක් වෙත සිසුන් නිරාවරණය කරවීම ප්‍රධාන අරමුණ කරගනිමින්, බාල පරපුර වෙත විද්‍යාව ව්‍යාප්ත කිරීම	පාසල් විද්‍යා වැඩසටහන (SSP)
e-විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන	ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ක්‍රියාත්මක විවෘත විද්‍යා කවය (විදු නැණ හවුල සේවාව) – OSCEM මඟින් කෙටි පණිවිඩ (SMS) හරහා දිනපතා විද්‍යා පණිවිඩ සේවාවක් සැපයේ. මෙම නොමිලයේ සපයනු ලබන සේවාව, කෙටි පණිවිඩ, විද්‍යුත් තැපැල සහ සමාජ ජාලකරණ වෙබ් අඩවි හරහා, රජයේ නිවාඩු දිනයන් හැර අනෙකුත් සියලු සතියේ දිනයන්හි දී සපයනු ලැබේ. • විදු නැණ දසුන - විද්‍යා වීඩියෝ සඳහා You Tube නාලිකාව • සිංහල මාධ්‍ය විද්‍යා වෙබ් අඩවිය - විදු මං පෙත • විද්‍යා සිසුන් සඳහා ජංගම දුරකථන යෙදවුම්- සිංහල විද්‍යා ශබ්දමාලා • Blogger With Google + Vidu Nena Hawula Google + Profile

විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්

පසුගිය වසර තුන තුළ ජාතික මූලික අධ්‍යයන ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්හි සාරාංශයක් පහත දක්වා ඇත.



2.6 මූලමය ආයෝජන

ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කෙරෙන පර්යේෂණ හා සංවර්ධන මූලාරම්භයන් සඳහා වාර්ෂිකව රජයේ අරමුදල් ලබාදේ. පසුගිය වසර තුන ඇතුළත රජයේ ආයෝජනයන් පහත දක්වා ඇත.



3. 2018 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- පහත ක්ෂේත්‍රයන්හි පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්
  - අණුක ක්ෂුද්‍රජීවී විද්‍යාව සහ මානව රෝග
  - පුනර්ජනනීය බලශක්තිය සහ ස්වභාවික සම්පත්
  - ජෛව බලශක්ති සහ පාංශු පරිසර පද්ධති
  - පෝෂණ ජෛව රසායන විද්‍යාව
  - ද්‍රව්‍ය සැකසීම සහ උපක්‍රම වැඩිදියුණු කිරීම
  - ක්ෂුද්‍රජීව විද්‍යාත්මක ජෛව තාක්ෂණය - ජෛව පටල ජෛව පොහොර
  - නිනිති තාක්ෂණ සහ උසස් ද්‍රව්‍ය
  - නව්‍ය Quantum dot සංවේදී සූර්ය කෝෂ
  - TiO_2 නැනෝ ටියුබ් මත පදනම් වූ ප්‍රකාශ ඇනෝඩ පිළිබඳ පර්යේෂණ
  - සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය කිරීමේ අධ්‍යාපනික - පුහුණු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම
  - ''නැවත ආරෝපණය කළ හැකි බැටරි සඳහා ශ්‍රී ලංකා මිනිරන් වැඩිදියුණු කිරීම'' පිළිබඳ විශේෂ ව්‍යාපෘතිය
  - ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, විද්‍යා කෙටි පණිවිඩ සේවාව, විද්‍යා You Tube නාලිකා සේවාව, විද්‍යා ජංගම දුරකථන යෙදවුම් යනාදිය ඇතුළත් විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්

ජාතික විද්‍යා පදනම (NSF)

1. පසුබිම

ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (NARESA) සඳහා අනුප්‍රාප්තික ලෙස 1994 අංක 11, 2013 අංක 23 දරණ පනතින් සංශෝධනය කරන ලද විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් 1998 දී ජාතික විද්‍යා පදනම (NSF) ස්ථාපනය කරනු ලැබිණි. මෙහි මෙහෙවර වනුයේ මූල්‍යනය, දැනුම් නිර්මාණය, ධාරිතා ප්‍රවර්ධනය, සහයෝගීතාවයන්, තොරතුරු බෙදා හැරීම සහ විද්‍යාව ප්‍රචලිත කිරීම යනාදිය හරහා පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදනයන් සහ තාක්ෂණ පැවරුම් ආරම්භ කිරීම, ඒ සඳහා පහසුකම් සලසා දීම සහ සහාය ලබාදීමයි.

2. ප්‍රගතිය

2.1 මානව සම්පත් සවිය

සිය මෙහෙවර සපුරාලීමේදී, ජාතික විද්‍යා පදනම විසින් පහතින් දක්වා ඇති මානව සම්පත් පදනම ඇසුරෙන් ක්‍රියාත්මක වේ.



2.2 ප්‍රදාන සහ පර්යේෂණ යොමුව



පර්යේෂණ සහ සංවර්ධනයන් ප්‍රවර්ධනය සඳහා විවිධ ආකාරයේ ප්‍රදානයන් සැපයීම, ජාතික විද්‍යා පදනමෙහි ප්‍රධානතම කාර්යයයි. විවිධ ක්ෂේත්‍රයන් හා අදාළව පිරිනමා ඇති ප්‍රදානයන් පහත සාරාංශ ගත කර ඇත.
ජාතික තේමාගත පර්යේෂණ වැඩසටහන යටතේ ජාතික විද්‍යා පදනම විසින් අවශ්‍යතා මත පදනම් වූ විවිධ ව්‍යාපෘතීන් සඳහා මූල්‍යාධාර ලබාදීම සිදු කරන ලද අතර මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ වැදගත් මූලාරම්භයන් කිහිපයක් පහතින් දක්වා ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතාවයෙන්, සකස් කරනු ලැබූ වගා අස්වනු, වගා කර ඇති ප්‍රදේශ සහ නිෂ්පාදන පිළිබඳ කාලෝචිත සහ විශ්වාසනීය තොරතුරු සැපයීමේ වෙබ් මත පදනම් වූ වගා පුරෝකථන පද්ධතිය. මෙම වැඩසටහන උත්සවාකාරයෙන් දියත් කිරීම අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

ගොවීන් වෙත තොරතුරු බෙදා හැරීම සඳහා භාවිතා කළ හැකි ජංගම දුරකථන මත පදනම් වූ කෘෂිකාර්මික තොරතුරු පද්ධතිය.

යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකාර්මික පීඨය මඟින් ගෙවතු වගා ව්‍යාපෘතියක් පිළිබඳ ව්‍යාපෘතියක් ස්ථාපනය කරනු ලැබ ඇත. උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහක නැවත පදිංචි කරවනු ලැබූ පිරිස් සඳහා සිය ගෙවතු සංවර්ධනය කරගනු පිණිස සහායය ලබාදෙන ලදි.

ජාතික විද්‍යා පදනමෙන් ප්‍රදානයන් ලබාගත් පර්යේෂණයන් හට දේශීය සහ ජාත්‍යන්තර ජ'ර්නලයන්හි සිය පත්‍රිකා පළ කරගැනීමේ හැකියාව උදා වී ඇත. එලෙස ප්‍රකාශයට පත්කළ පත්‍රිකාවන්හි සාරාංශයක් පහත වගුව මඟින් දක්වා ඇත.



ජාතික විද්‍යා පදනමෙහි සංචාරක ප්‍රදානයන්හි සහායයෙන් පහත තාක්ෂණයන් වැඩිදියුණු කරනු ලැබිණි.

- මුහුණු හඳුනා ගැනීම: අධිකරණ වෛද්‍ය කටයුතු සඳහා ත්‍රිමාණ ග්‍රැෆික් තාක්ෂණය සහ පරිගණක මත පදනම්ව, මුහුණු ප්‍රතිනිර්මාණය කිරීම.
- වියළි රබර් විවෘත කෝෂ නිෂ්පාදන අඛණ්ඩව සිදු කිරීම සඳහා නියාමක පරිමාණයේ වාත්තු අච්චු යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ තැනීම.
- ස්වයංක්‍රීය ප්‍රකාශ පරීක්ෂාවන් සහිත පෑස්සුම් රොබෝ පද්ධති
- රැහැන් රහිත පෑඩ් මත පදනම් වූ වාහන බර මැනීමේ පද්ධති
- බහුකාරක මත පදනම් වූ බෙදාහැරීමේ ස්වයංක්‍රිය පද්ධතියක් භාවිතයෙන් දෝෂ අනාවරණය, වෙන්කර ගැනීම සහ පිළිසකර කිරීම.

2.3 විද්‍යාව ප්‍රචලිත කිරීම

ජාතික විද්‍යා පදනමෙහි අවධානය යොමු වී ඇති එක් ප්‍රධාන කාර්යයක් වනුයේ විද්‍යාව ප්‍රචලිත කිරීමයි. විවිධ මැදිහත් වීම් හරහා විවිධ මට්ටමින් විද්‍යාව ප්‍රචලිත කරවීමේ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවේ. විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්හි තොරතුරු පහතින් සාරාංශගත කොට ඇත.

ක්‍රියාකාරකම	ප්‍රගතිය
ලෝක විද්‍යා දින සැමරුම - පාසල් වැඩසටහන්	අන්තර් පාසල් විද්‍යා සමාජ තරඟ, විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟ (SRPC), ශ්‍රී ලංකා විද්‍යා සහ ඉංජිනේරු අලෙවි ප්‍රදර්ශනය, විශ්වවිද්‍යාල විද්‍යා සමාජ අතර ඩිජිටල් කතන්දර කීමේ තරඟය, පාසල් සිසුන් අතර විද්‍යාව ප්‍රවර්ධනය උදෙසා ගුරුවරුන් වෙත පිරිනැමෙන සම්මානය, විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා පිරිමනැමෙන මහාචාර්ය එම්.ටී.එම්.ජිෆ්රි අනුස්මරණ සම්මානය සහ හොඳම පාසල් විද්‍යා සමාජය යන තරඟාවලීන් පැවැත්වීම සහ ජයග්‍රාහකයින් සඳහා උපහාර පිදීම.
ජාතික විද්‍යා පදනමෙහි ජ'ර්නලය (JNSF) සහ ශ්‍රී ලංකා සමාජ විද්‍යා ජ'ර්නලය (SLJSS) නියමිත කාලයේදී ප්‍රකාශයට පත් කෙරිණි.	ප්‍රකාශනයන්
ජාත්‍යන්තර තරඟාවලි සඳහා සහායය	ඇමෙරිකා එක්සත් ජනපදයේ පෙනිසිල්වේනියාවේ, පිට්ස්බර්ග් හීදී පැවති ජාත්‍යන්තර ඉන්ටෙල් විද්‍යා හා ඉංජිනේරු අලෙවි ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ **දෙහිවල එස්.ද. එස්. ජයසිංහ මධ්‍ය විද්‍යාලයෙහි ඒ.ආර්. සංකල්ප පෙරේරා සහ පී. ෂෙහාන් කවිෂ්ක** යන සිසුන් විසින්, SRPC කාණ්ඩය යටතේ, ප්‍රථම වරට පිරිනමනු ලැබූ විශිෂ්ටතම සම්මානය හිමිකරගන්නා ලදි.
	ජර්මනියේ ස්ටුට්ගාඩ් නුවරදී පවත්වන ලද තරුණ විද්‍යාඥයින්ගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICRS) 2017 හිදී, රිදී පදක්කමක් දිනා ගැනීමට **රකිඳු රන්දිවි වික්‍රමරත්න** සිසුවාට හැකියාව ලැබිණි. තවද මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවර, රාජකීය යුධ පාසලේ පැවති ප්‍රථම ජාත්‍යන්තර RMC තරුණ විද්‍යාඥ සංගමයේ සම්මන්ත්‍රණය - 2017 හිදී රිදී පදක්කමක් ජයග්‍රහණය කිරීමට ඔහුට හැකියාව ලැබිණි.

2.4 අනෙකුත් සංවර්ධන මූලාරම්භයන්

මෙම කාලච්ඡේදය තුළදී ජාතික විද්‍යා පදනම විසින් ප්‍රතිපත්ති සම්පාදනය, දැනුම ප්‍රවර්ධනය ආදී ක්ෂේත්‍රයන්ට ආධාර වශයෙන් පහත කාර්යයන්හිද නියුක්ත වී ඇත.

- ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය - 2014 සම්පූර්ණ කිරීම
- දේශීය දැනුම පිළිබඳ බුද්ධිමය දේපළ හිමිකම් ක්ෂේත්‍රයේ විශේෂඥයින් සහ වෘත්තිකයන් සමඟ සාකච්ඡාමය සැසි තුනක් සංවිධානය කරන ලදි. මෙම සැසිවලදී, දේශීය දැනුම පිළිබඳ බුද්ධිමය දේපළ හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ගැටලු සහ ඌනතාවයන් හඳුනාගන්නා ලදි.
- ජාතික වශයෙන් වැදගත් ගැටලු සඳහා, විවිධ ප්‍රභව සහ ස්ථානයන්හි පවතින සුවිශාල දත්ත යොදා ගනිමින් සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්තිමය නිර්දේශයන් සොයාගනු පිණිස ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. මෙහි ආරම්භක අදියරයක් ලෙස සෞඛ්‍ය, ආපදා සහ පරිසර, අධ්‍යාපනය සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති කිහිපයක් හඳුනා ගන්නා ලදි.
- ප්‍රතිපත්ති නිර්දේශයන් සහිතව විදේශයන් වෙත සංක්‍රමණය වීම පිළිබඳ ප්‍රතිපත්තිමය සංක්ෂේපය ප්‍රකාශයට පත් කරනු ලැබිණි.
- GIZ හි තාක්ෂණික සහාය යටතේ, විශ්වවිද්‍යාල - ආයතන - කර්මාන්ත අන්තර් ක්‍රියා සඳහා මූලික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම සඳහා පියවර ගනු ලැබිණි.
- 2011 වසරේදී, ජාතික සංඛ්‍යාකරණ ව්‍යාපෘතිය (NDP) දියත් කරනු ලැබ ඇති අතර, මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වනුයේ, විශ්වවිද්‍යාලයන්හි සහ ප්‍රධාන පර්යේෂණ ආයතනයන්හි පවතින, දේශීයව උත්පාදනය කරගනු ලැබූ වටිනා විද්‍යා හා තාක්ෂණ ශාස්ත්‍රීය ග්‍රන්ථ සංඛ්‍යාංකකරණය කිරීම හරහා ආයතනික කෝෂ්ඨාගාර ජාලයක් ස්ථාපනය කිරීමයි. මෙම ව්‍යාපෘතිය දැනට ආයතන 17 ක් සමඟ සම්බන්ධව සිටින අතර 2017 වසරේදී තවත් ආයතන 15 ක් සම්බන්ධ කර ගැනීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී. http://dl.nsf.ac.lk/ohs
- එක්සත් රාජධානියේ විද්‍යාත්මක ප්‍රකාශන ජාත්‍යන්තර ජාලය (INASP) සහ Ubiquity Press හා සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකා ජර්නල්ස් ඔන්ලයින් (www.sljol.info) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම කාලච්ඡේදය තුළ ශ්‍රී ලංකා ජර්නල්ස් ඔන්ලයින් ව්‍යාපෘතිය සමඟ නව දේශීය ජර්නල අටක් එක් වී ඇති අතර දැනට එය මඟින් පර්යේෂණ ලිපි 8630 ක් පළ කරමින් විද්වත් ජර්නල 73 ක් ආවරණය කරයි.

2.5 මූල්‍යමය ආයෝජන

ජාතික විද්‍යා පදනම මඟින් අඛණ්ඩව පිරිනමනු ලබන විවිධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන් අනුකූලව භාණ්ඩාගාරය මඟින් වාර්ෂිකව අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම සිදුකරනු ලැබේ. එම ආයෝජනයන්ගේ සාරාංශයක් පහත දක්වා ඇත.



3. 2018 වර්ෂය සඳහා සැලසුම් කරනු ලැබ ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- පර්යේෂණ ප්‍රදාන, පර්යේෂණ ශිෂ්‍යත්ව, පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ විද්‍යාඥ ප්‍රදාන, සංචාරක ප්‍රදාන, තාක්ෂණ ප්‍රදාන සහ සම්මන්ත්‍රණ ප්‍රදාන පිරිනැමීම
- ජාතික විද්‍යා පදනමෙහි ජ'ර්නලය ප්‍රකාශයට පත්කිරීම (JNSF) - කලාප 04
- ශ්‍රී ලංකා සමාජ විද්‍යා ජ'ර්නලය ප්‍රකාශයට පත්කිරීම (SLISS) - කලාප 02
- ජාතික විද්‍යා සතිය සැමරීම, පාසල් විද්‍යා සමාජ වැඩසටහන, විදුරාව සඟරාව ප්‍රකාශයට පත් කිරීම යනාදිය ඇතුළත් විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්
- විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟාවලිය
- පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය 2016
- තිරසර සංවර්ධනය උදෙසා විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනතාව සතු විද්‍යාත්මක සාක්ෂරතාවය පිළිබඳ සමීක්ෂණය සහ සාමාන්‍ය පෙළ විභාගයේදි විද්‍යාව සහ ගණිතය විෂයයන් අසමත්වීම් වැඩිවීම පිළිබඳ අධ්‍යයනයක්
- ජාතික සංඛ්‍යාකරණ ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා ජ'ර්නල්ස් ඔන්ලයින් ව්‍යාපෘතිය අඛණ්ඩව ඉදිරියට රැගෙන යාම

ජාතික පර්යේෂණ සභාව (NRC)

1. පසුබිම

ජාතික පර්යේෂණ සභාව (NRC) 2007 වසරේ සිට පර්යේෂණ හා සංවර්ධනයන් ප්‍රවර්ධනය සඳහා වන විශේෂ නියෝජිතායතනයක් ලෙස ක්‍රියාත්මක වූ අතර මේ වන විට පාර්ලිමේන්තු පනතක් හරහා ව්‍යාවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපනය කරනු ලැබ ඇත. උපරිම ප්‍රතිලාභ ලබාගනු පිණිස රට තුළ, විචිත්‍රවත් ජාතික විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් බිහිකිරීම අරමුණු කරගනිමින්, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ ඒ සඳහා පහසුකම් සැපයීම සඳහා රජයට සහාය ලබාදීම ජාතික පර්යේෂණ සභාවෙහි කාර්යභාරයයි. ජාතික පර්යේෂණ සභාවේ සුවිශේෂී සංකල්පය වනුයේ ගෝලීය මට්ටමෙන් විද්‍යාවෙහි ප්‍රගමනය සඳහා අගනා දායකත්වයක් දක්වමින්, මෙරට වැදගත් වන අංශ පිළිබඳ පර්යේෂණ සිදුකිරීම සඳහා විද්‍යාඥයින් දිරිගැන්වීමයි.

2. ප්‍රගතිය

2.1. පර්යේෂණ යොමුව

ජාතික පර්යේෂණ සභාව විසින් ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රධාන (TO), රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතා වැඩසටහන (PPP) සහ අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන (ID) යන ප්‍රධාන කාණ්ඩ තුන යටතේ ප්‍රදානයන් පිරිනැමීම සිදුකෙරේ. ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන (TO) යටතේ, ජාතික ගැටලු විසඳාලීම අරමුණු කරගනිමින්, විවිධ විෂය ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන විද්‍යාඥයින් කණ්ඩායමක් එක්ව පොදු ඉලක්කයක්, විද්‍යාත්මක ප්‍රතිදානයන් හරහා සපුරාගැනීමට කටයුතු කරයි. ජාතික විශ්වවිද්‍යාලයන්හි, සහ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි විද්වතුන් සමඟ එක්ව, වාණිජමය ශක්‍යතාවයක් සහිත නවෝත්පාදනයන්, නිෂ්පාදන හෝ ක්‍රියාවලීන් ලෙස වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපාරික ප්‍රජාව වෙත රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන යටතේ ප්‍රදානයන් පිරිනමනු ලැබේ. අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන (ID) පිරිනැමෙනුයේ, නව දැනුම නිර්මාණය මෙන්ම ධාරිතා වර්ධනය අරමුණු කරගත්, නවෝත්පාදන මූලික හෝ ව්‍යවහාරික පර්යේෂණයන් වෙනුවෙන් තනි විද්‍යාඥයින් වෙතය. ජාතික පර්යේෂණ සභාව වෙතින් පිරිනැමෙන සියලු පර්යේෂණ ප්‍රදාන, ව්‍යවහාරික සහ ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ වෙත සහායය ලබාදීමක් ලෙස පිරිනැමෙන අතර ඒ හරහා වාණිජකරණ විභවතාවයන් ඉහළ නැංවීම අරමුණු කෙරේ. ඒ අනුව ජාතික පර්යේෂණ සභාව විසින් පසුගිය වසර තුන තුළ, TO ප්‍රදාන තුනක්, PPP ප්‍රදාන පහක්, සහ ID ප්‍රදාන 118 ක් විවිධ ක්ෂේත්‍රයන්

සම්බන්ධයෙන් පිරිනමනු ලැබ ඇත. එලෙස, ජාතික පර්යේෂණ සභාව විසින්, පසුගිය වර්ෂ තුන තුළ විවිධ ක්ෂේත්‍රයන් හා අදාළව පිරිනමනු ලැබූ පර්යේෂණ ප්‍රදානයන් පහත වගුවේ දක්වා ඇත.





ජාතික පර්යේෂණ සභාවේ PPP පර්යේෂණ ව්‍යාපෘතීන් හා එක්ව කටයුතු කරන පෞද්ගලික අංශයේ හවුල්කරුවන් වනුයේ, සී/ස CIC හෝල්ඩිංග්ස් පෞද්ගලික සමාගම, සී/ස ලිනා මනුෆැක්චරින් පෞද්ගලික සමාගම, සී/ස ඉලාස්ටොමෙරික් ඉංජිනියරින් පෞද්ගලික සමාගම, සී/ස හෙලික්ස් ඉංජිනියරින් පෞද්ගලික සමාගම සහ සී/ස එල්ලාවල හෝටිකල්චර් පෞද්ගලික සමාගම යන සමාගම්ය.

පරිසර හිතකාමී වගා තාක්ෂණයන්, වියළි කලාපයේ පානීය ජල ගැටලුව සඳහා තිරසාර විසඳුමක් සහ ජලපවිත්‍රකරණය සඳහා උසස් ද්‍රව්‍ය මත පදනම් වූ පෙරහන් වැඩිදියුණු කිරීම යනාදිය TO ප්‍රදානයන් යටතට ගැනේ.

PPP පර්යේෂණ මූලාරම්භයන්

TO පර්යේෂණ මූලාරම්භයන්

ID පර්යේෂණ මූලාරම්භයන්

ලොව පුරා තොරතුරු බෙදාදෙමින් දැනුම් නිර්මාණය සඳහා දායකත්වය ලබාදීමට හැකිවන පරිදි, සිය පර්යේෂණ සොයා ගැනීම් දේශීය සහ ජාත්‍යන්තර ජ'ර්නලයන්හි පළ කිරීම සඳහා ප්‍රදාන ලාභීන් දිරිගැන්වීම, ජාතික පර්යේෂණ සභාව විසින් අඛණ්ඩව සිදුකෙරේ. පසුගිය වසර තුන තුළ, ජාතික පර්යේෂණ සභාව විසින් මූල්‍යාධාර සපයාදුන් පර්යේෂකයින් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති පත්‍රිකා පහත සාරාංශගත කර ඇත.



රට තුළ පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය සහ දිරිගැන්වීම අරමුණු කර ගනිමින්, ජාතික පර්යේෂණ සභාව විසින්, සෑම වසරකම විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන උළෙල සංවිධානය කරනු ලබයි. ඒ අනුව 2014 වසර සඳහා විශිෂ්ටත්ව සහතික වෛද්‍ය විද්‍යාව, දන්ත විද්‍යාව, කෘෂි විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව යනාදී අංශයන්හි විද්‍යාඥයින් 223 දෙනෙකු සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් පිරිනමන ලදි.

2.2. පර්යේෂණ වාණිජකරණය

පර්යේෂණ වාණිජකරණය සහතික කරමින්, කෙටිකාල සීමාවක් තුළ පර්යේෂණ කිහිපයක් රුපියල් බවට පරිවර්තනය කිරීමට ජාතික පර්යේෂණ සභාවට හැකියාව ලැබිණි. ඒ අනුව, PPP කාණ්ඩය සහ ID ප්‍රදාන යටතේ පර්යේෂණ නිෂ්පාදන දෙකක්, 2016 වසරේදීත්, එක් නිෂ්පාදනයක් 2017 වසරේදීත් වාණිජකරණය සිදු කරන ලදි. මෙලෙස වාණිජකරණය කරනු ලැබුයේ කෘෂිකර්මාන්තය, වෛද්‍ය විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි නිෂ්පාදනයන්ය.

ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදානයන්හි ප්‍රතිඵලයක් ලෙස විවිධ ක්ෂේත්‍රයන් යටතේ පහත දක්වා ඇති පේටන්ට් බලපත්‍ර ලබාගන්නා ලදි.





2.3. විද්‍යාව ප්‍රචලිත කිරීම

පර්යේෂණ සොයා ගැනීම් හුවමාරුව සහ නව්‍ය විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන මූලාරම්භයන් පිළිබඳ සමාජය දැනුම්වත් කිරීම අරමුණු කරගනිමින්, විද්‍යාව ප්‍රචලිත කිරීමේ විවිධ වැඩසටහන්, වසර ගණනාවක සිට, ජාතික පර්යේෂණ සභාව විසින් ක්‍රියාත්මක කෙරේ. මෙම කාලච්ඡේදය තුළ ක්‍රියාත්මක කරනු ලැබූ විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර පහත වගුව මඟින් සාරාංශගත කර ඇත.

පර්යේෂණ යොමුව	ප්‍රචලිත කිරීමේ ක්‍රමය
දෙළුම් වගා අස්වැන්නේ ගුණාත්මකභාවය සහ ප්‍රමාණාත්මකභාවය ඉහළ නංවනු පිණිස මනා කළමනාකරණ සහ වගා පිළිවෙත්	සුහසාධන කාර්යයන් ලෙස දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
ජෛව පටල ජෛව පොහොර: වඩා හරිත ශ්‍රී ලංකාවක් උදෙසා (නුවරඑළියේ එළවළු වගාව පිළිබඳ විශේෂ යොමුවක් සහිත)	
පොලිතීන්හි තිරසාර කළමනාකරණය	
ඩ්‍රෝන යන්ත්‍ර පිළිබඳ සම්මන්ත්‍රණය	NRC ප්‍රදාන යටතේ එක් ඩ්‍රෝන යන්ත්‍රයක් වැඩිදියුණු කර ඇත

2.4. මූල්‍යමය ප්‍රගතිය

ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරන සියළු පර්යේෂණ ප්‍රදාන සඳහා රජයේ අරමුදල් මඟින් අරමුදල් සපයන අතර එම ආයෝජන වල සාරාංශයක් පහත දැක්වේ.



3. 2018 වසර සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන (TO)
- පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන (PPP)
- අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන (IDG)
- විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන (PASP)
- සුබසාධන/ මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC)

1. පසුබිම

2013 අංක 23 දරණ පනතින් සංශෝධනය කරන ලද, 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනත මඟින් ස්ථාපනය කරනු ලැබූ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC) විසින් 1998 අගෝස්තු මස සිට සිය මෙහෙයුම් ආරම්භ කරනු ලැබිණි. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය සහ උපදේශාත්මක සේවා සැපයීමේ ප්‍රමුඛතම ආයතනය ලෙස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම නම් කොට ඇත.

2. ප්‍රගතිය

2.1 ප්‍රතිපත්ති සම්පාදනය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම විසින් අමාත්‍යාංශය හා සහයෝගීතාවයෙන් පුළුල් උපදේශන ක්‍රියාවලියක් හරහා ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව (NRDF) වැඩි දියුණු කරනු ලැබිණි. රටෙහි පර්යේෂණ සහ සංවර්ධන ප්‍රමුඛතාවන් ක්‍රියාත්මක කිරීමේදී ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස, මෙම ජාතික පර්යේෂණ සංවර්ධන රාමුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියලු පර්යේෂණ ආයතන වෙත ඒ ඒ ආයතන වෙත නියෝගාත්මකව පැවරී ඇති කාර්යයන් හා අනුකූලව ජාතික පර්යේෂණ සංවර්ධන රාමුව මඟින් හඳුනාගනු ලැබ ඇති පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශනයන් ලබාදෙන ලදි.

ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වගකීම දරණ ආයතනය ලෙස, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම විසින්, ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව මඟින් යෝජනා කරනු ලැබ ඇති පහත සඳහන් ප්‍රධාන ප්‍රතිපත්තීන් තුන සම්පාදනය සඳහා පියවර ගන්නා ලදි.

- දැනුම් සේවාවන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය
- මූලික විද්‍යා පර්යේෂණ ප්‍රතිපත්තිය
- ජාතික ප්‍රවේණි විද්‍යා මධ්‍යස්ථානය සහ ජාතික ප්‍රවේණි විද්‍යාත්මක කෝෂ්ඨාගාරය වෙත ප්‍රවේශ වීමේ ප්‍රතිපත්තිය

මෙයට අමතරව, අමාත්‍යාංශය හා සහයෝගීතාවයෙන් තාක්ෂණික කමිටුවක් හරහා ජාතික අවශ්‍යතාවයක් ලෙස ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කරනු ලැබිණි. මෙම තාක්ෂණික කමිටුව මඟින් වැඩි දියුණු කරනු ලැබූ ප්‍රතිපත්ති කෙටුම්පත පාර්ශවකරුවන්ගේ උපදේශන ක්‍රියාවලියක් හරහා සම්පූර්ණ කරනු ලැබූ අතර, අමාත්‍යමණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිණි. මේ සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අමාත්‍ය මණ්ඩල එකඟතාව ලබාදී ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපායයන් සහ ක්‍රියාකාරී සැලැස්මක් සහිතව නැවතත් අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කිරීම සඳහා උපදෙස් ලැබී ඇත. දැනට, ක්‍රමෝපායයන් සම්පාදනය සිදුකිරීමට පියවර ගනු ලැබ ඇත.

අතිගරු ජනාධිපතිතුමා වෙත ජාතික පර්යේෂණ සංවර්ධන රාමු යෝජනාවලිය ලබාදීම

ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සාකච්ඡා සඳහා වූ පාර්ශවයන් අතර සම්මන්ත්‍රණය

2.2 පර්යේෂණ ප්‍රවර්ධන යොමුව

- **විද්‍යා හා තාක්ෂණ ද්විවාර්ෂික සම්මන්ත්‍රණය**

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පැන නැගී ඇති වැදගත් ගැටලු පිළිබඳ අවධානය යොමු කෙරෙන ද්විවාර්ෂක විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය (BICOST) පැවැත්වීමට, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම වෙත නියෝගාත්මකව පැවරී ඇති කාර්යයකි. ඒ අනුව, ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයින්, ඉංජිනේරුවන්, පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් සහ රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුන්හි නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් අට වෙනි වරට විද්‍යා හා තාක්ෂණ ද්විවාර්ෂික සම්මන්ත්‍රණය (BICOST-VIII) 2016 නොවැම්බර් මසදී පවත්වන ලදි. ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපාය සම්පාදනය කිරීම කෙරෙහි මෙම සම්මන්ත්‍රණයෙහිදී ප්‍රධාන අවධානය යොමු විණි.

- **තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ (YSF) පර්යේෂණ සම්මන්ත්‍රණය**

තරුණ විද්‍යාඥයින් පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුක්ත වීම ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ පර්යේෂණ සොයා ගැනීම් ප්‍රජාවන් සමඟ බෙදා හදා ගැනීමේ ප්‍රධාන පරමාර්ථය සහිතව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම විසින් තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ පර්යේෂණ සම්මන්ත්‍රණය වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ. හය වන තරුණ විද්‍යාඥයිනගේ සංසදයේ පර්යේෂණ සම්මන්ත්‍රණය, 2017 ජනවාරි මසදී, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජෛවතාක්ෂණ මධ්‍යස්ථානයේදී, පවත්වනු ලැබූ අතර, එහිදී පර්යේෂණ පත්‍රිකා 35 ක් ඉදිරිපත් කරනු ලැබ, ප්‍රකාශයට පත් කෙරිණි.

- **ජාතික උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය**

ප්‍රථම වරට පවත්වනු ලැබූ ජාතික උපාධි අපේක්ෂක සම්මන්ත්‍රණය, 2017 අගෝස්තු මසදී පවත්වනු ලැබූ අතර, මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණ වූයේ, ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව (NRDF) මඟින් හඳුනාගනු ලැබ ඇති ප්‍රධාන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ, උපාධි අපේක්ෂකයින් සහ විශ්වවිද්‍යාලයන්හි ඔවුන්ගේ අධීක්ෂකයින් අතර ප්‍රවර්ධනය කිරීමයි. මෙහිදී පර්යේෂණ පත්‍රිකා 37 ක් ඉදිරිපත් කරනු ලැබ ප්‍රකාශයට පත් කරන ලදි.

2.3 ආයතනික සමාලෝචන

විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනයට ලක් කිරීම, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම වෙත නියෝගාත්මකව පැවරී ඇති කාර්යයකි. මෙම සමාලෝචනයන් සිදුකිරීමේ අරමුණ වනුයේ, රජයේ සහ අනෙකුත් පාර්ශවයන්හි අවශ්‍යතාවයන් හා අපේක්ෂාවන්, හැකි උපරිම අයුරින් සපුරාලීම සහතික කරනු පිණිස, එක් එක් ආයතන විසින් පවත්වනු ලබන විද්‍යාත්මක වැඩසටහන්හි තත්ත්වය, පිරිවැය ඵලදායීතාවය, අදාලත්වය සහ විද්‍යාත්මක වැඩසටහන්හි බලපෑම පිළිබඳ ඇගයීමක් සිදු කිරීමයි. ඉහත කාලච්ඡේදය සඳහා ආයතනික සමාලෝචනයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

සමාලෝචන තත්ත්වය		
සම්පූර්ණ කරනු ලැබ පළමු කෙටුම්පත (NASTEC) වෙත ඉදිරිපත් කර ඇත	**සම්පූර්ණ කරනු ලැබ පළමු කෙටුම්පත අපේක්ෂාවෙන් පසුවේ**	**දැනට සිදුකෙරේ**
පළතුරු පර්යේෂණ සංවර්ධන ආයතනය (FRDI)	ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය (FCRDI)	සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනය (RRDI)
ශාක ජාන විද්‍යා සම්පත් මධ්‍යස්ථානය (PGRC)		ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (NRMC)
පසු-අස්වනු තාක්ෂණ ආයතනය (IPHT)		

2.4 වෙනත් සංවර්ධන මූලාරම්භයන්

- විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව - 2015 සම්පූර්ණ කරනු ලැබිණි.
- විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපන කාර්යමණ්ඩල සාමාජිකයින්, විද්‍යාඥයින් සහ පර්යේෂණ නිළධාරීන් සඳහා ''ජයග්‍රාහී පර්යේෂණ යෝජනාවක් සැකසීම'', ''විද්‍යාඥයින් සඳහා කාර්යය හා ජීවන සමතුලිතතාවය: සාර්ථකත්වයේ මඟ'' යනාදී තේමා යටතේ විවිධ වැඩමුළු සංවිධානය කර පවත්වන ලදි.
- නොබැඳි ජාතීන්ගේ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය (NAM S&T) යටතේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගීවීමට නිළධාරීන් කිහිපදෙනෙකු වෙත සහායය ලබා දෙන ලදි. මෙම වැඩසටහන් සඳහා නර්ඩ් මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය සහ කාර්මික තාක්ෂණ ආයතනය යන ආයතනයන් වෙතින් නිළධාරීහු සහභාගී වූහ. සූර්ය බලශක්තිය, නියං තත්ත්ව කළමනාකරණය සහ කාන්තාරකරණය පාලනය සහ කාර්මික ජෛවතාක්ෂණය යන අංශයන් හා අදාළව මෙම සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්විණි.

2.5 මූල්‍යමය ආයෝජන

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම පූර්ණ ලෙස රාජ්‍ය අරමුදල් යටතේ ක්‍රියාත්මක ආයතනයක් වන අතර, වාර්ෂිකව අවම අයවැය ප්‍රතිපාදනයක් පමණක් වෙන් කෙරේ. පසුගිය වර්ෂ තුන ඇතුළත අයවැය වෙන් කිරීම් සහ වියදම්හි සාරාංශයක් පහත දක්වා ඇත.



3. 2018 වසර සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන කාර්යයන්

- නව වන ශ්‍රී ලංකා ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය (BICOST-IX) පැවැත්වීම
- තරුණ විද්‍යාඥයිනගේ සංසදයේ පර්යේෂණ සම්මන්ත්‍රණය සහ උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීම
- වාර්ෂික විද්‍යා හා තාක්ෂණ ජාතික සමාලෝචනය
- ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් වැඩිදියුණු කිරීම
- ක්‍රමෝපායයන් සහ ක්‍රියාකාරී සැලසුම් සහිතව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පූර්ණ කර අවසන් කිරීම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

1. පසුබිම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය යනු ජාතික ආර්ථිකයේ සියලුම අංශයන්හි ජාතික ප්‍රමිතීන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සහ තත්ත්ව කළමනාකරණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති ජාතික ප්‍රමිති ආයතනයයි.

2. ප්‍රගතිය

2.1 මානව සම්පත් සවිය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් තත්ත්ව ප්‍රමිතීන් සහ පද්ධති සහ නිෂ්පාදන සහතිකකරණයන් සැකසීමේදී පහත දක්වා ඇති මානව සම්පත් පදනම යටතේ ක්‍රියාත්මක වේ.



2.2 පද්ධති සහ නිෂ්පාදන සහතිකකරණය

කර්මාන්ත අංශයේ සහ රටෙහි ජාතික ඉල්ලුම පදනම් කරගනිමින් පද්ධතීන් සහ නිෂ්පාදන සඳහා සහතිකකරණයන් ලබාදීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් අඛණ්ඩව පියවර ගනු ලැබිණ. පසුගිය වසර තුන තුළ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් විවිධ ක්ෂේත්‍රයන්හි සිදුකරනු ලැබූ නිෂ්පාදන සහතිකකරණයන්හි සාරාංශයක් පහත දක්වා ඇත.



ශ්‍රී ලාංකීය කර්මාන්ත සඳහා ගෝලීය තරඟකාරීත්වය ලබාදීම සහතික කරමින්, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුකූල පද්ධති සහතිකකරණයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ලබාදේ. පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලැබූ පද්ධති සහතිකකරණයන්හි සාරාංශය පහත දැක්වේ.



2.3 ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම

රටෙහි නිෂ්පාදන හා සේවාවන් සඳහා ජාතික ප්‍රමිතීන් නිකුත්කිරීමේ වගකීම දරණ එකම ආයතනය වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින්, නිෂ්පාදනයන්හි සහ සේවාවන්හි තත්ත්වය සහතික කෙරෙන SLS සහතිකය ලබාදෙන නිෂ්පාදන හා සේවාවන් සංඛ්‍යාව ඉහළ නැංවීමට අඛණ්ඩව කටයුතු කෙරේ. පසුගිය වසර තුන තුළ වැඩිදියුණු කරනු ලැබූ සහ සංශෝධනය කරන ලද නව ප්‍රමිතීන්හි සාරාංශයක් පහත දැක්වේ.

නව ප්‍රමිතීන් සම්පාදනය



සංශෝධිත ප්‍රමිතීන්



2.4 තාක්ෂණික සේවා සැපයීම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් තාක්ෂණික සේවා ගණනාවක් හරහා සැලකිය යුතු අන්දමේ ආදායම් ප්‍රමාණයක්, උත්පාදනය කරගැනේ.





2.5 මූල්‍යමය ආයෝජනය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය යනු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ස්වයං මූල්‍ය ආයතනයකි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රමිති වැඩිදියුණු කිරීම සහ සහතිකකරණය පිළිබඳ සිදුකරන ලද මූල්‍යමය ආයෝජනයන් පහතින් දක්වා ඇත.



3. 2018 වසර සඳහා සැලසුම් කරනු ලැබ ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- ප්‍රමිති සම්පාදනය සහ ප්‍රවර්ධනය
- ආහාර සුරක්ෂිතතාවය, GHG, පරිසර සලකුණු කිරීම් යනාදී ක්ෂේත්‍රයන්හි නව නිෂ්පාදන සහ පද්ධති සහතිකකරණය
- තාක්ෂණික, පුහුණු, කාර්මික මිණුම් සහ ක්‍රමාංකන සේවාවන් සැපයීම
- ජාතික තත්ත්ව සම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- කලාපීය/ ජාත්‍යන්තර ප්‍රමිතිකරණ ක්‍රියාකාරකම්
- මාලබේ අති නවීන විද්‍යාගාර පහසුකම ඉදිකිරීම

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)

1. පසුබිම

2005 අංක 32 දරණ ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලය, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරියයි. 2005 අංක 32 දරණ ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩල පනත යටතේ පත්වීම් ලද සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත සභාවක් මඟින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පාලනය වේ. දේශීය සහ අපනයන වෙළඳපල සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේදී, අනුකූලතා තක්සේරු සඳහා පහසුකම් සපයනු පිණිස අවශ්‍ය ප්‍රතීතන සේවාවන් සැපයීමේ සහ ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සතුවේ. මේ සඳහා කර්මාන්ත සහ ව්‍යාපාරික ප්‍රජාව පාරිභෝගික ජනතාව සහ ශ්‍රී ලංකා රජය වෙත විවිධාකාර සේවාවන් සපයන විද්‍යාගාරයන් සහතිකකරණ සහ පරීක්ෂණ මණ්ඩල ප්‍රතීතනය කිරීම මේ යටතට ගැනේ. 2006 ජනවාරි මස සිට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් සිය මෙහෙයුම් ආරම්භ කරනු ලැබිණි.

2. ප්‍රගතිය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ මානව සම්පත් සවිය නිළධාරීන් නව දෙනෙකුට සීමා වී ඇත. කෙසේ වුවද, කර්මාන්ත සහ පාරිභෝගිකයින්ට අවශ්‍ය සේවාවන් සපයාදීම මනාව පුහුණුව ලත් ප්‍රතීතන නිළධාරීන්ගේ සේවය බාහිරව ලබාගැනීම හරහා සිදුවේ. මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් විශේෂඥයින්ගෙන් සැදුම්ලත් සංචිතයක සේවාව ලබාගනී.

2.1 ප්‍රතීතනය

තත්ත්වයෙන් උසස් සේවාවක් සපයාදීම සහතික කරනු පිණිස, විවිධ ක්ෂේත්‍රයන් හා අදාළව ප්‍රතීතන පද්ධතීන් හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් අඛණ්ඩව සිදුකෙරේ. ප්‍රතීතන ක්‍රියාවලිය අනිවාර්ය නොවන සහ දීර්ඝ ක්‍රියාවලියක් වන බැවින්, පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට ප්‍රතීතන සේවාවන් හඳුන්වාදිය හැකිවූයේ සීමා සහිතවය. මෙම ක්ෂේත්‍රයන්ට (GHG) හරිතාගාර වායු විමෝචනය පිළිබඳ වූ වලංගුතාවය/ සත්‍යාක්ෂණ පද්ධතිය, බලශක්ති කළමනාකරණ පද්ධති, යහපත් විද්‍යාගාර පිළිවෙත් සහ හරිත ගොඩනැගිලි සහතිකකරණ යනාදිය ඇතුළත් වේ.

2.2 තාක්ෂණික සේවා සැපයීම

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින්, එම ආයතනයට පැවරී ඇති කාර්යයන් හා අනුකූලව, විද්‍යාගාරයන් ප්‍රතීතනය සඳහා තාක්ෂණික සේවාවන් සහ අනෙකුත් සේවාවන් සපයාදෙනු ලබන අතර උපයාගත් ආදායම හරහා සිය මූල්‍යමය ස්ථාවරභාවය පවත්වා ගනී. පසුගිය වසර තුන තුළ සපයා දෙනු ලැබූ තාක්ෂණික සේවාවන් සහ උපයාගත් ආදායම් පහතින් දක්වා ඇත.





මෙම අදාළ කාලවකවානුව තුළ ලබාදුන් ප්‍රතීතනයන් සහ සිදුකල අවේක්ෂණයන් පහත සාරාංශගත කර ඇත.

ප්‍රතීතන ක්ෂේත්‍රය	ලද අයදුම්පත් සංඛ්‍යාව	ලබාදුන් ප්‍රතීතනයන් (නව සහ අලුත් කිරීම්)	පවත්වන ලද අවේක්ෂණයන්
පරීක්ෂා විද්‍යාගාරයන්	26	38	24
ක්‍රමාංකන විද්‍යාගාරයන්	01	01	02
වෛද්‍ය විද්‍යාගාරයන්	05	02	16
සහතිකකරණ මණ්ඩල			
- පද්ධති	03	03	10
- නිෂ්පාදන	02	01	-
- පුද්ගල	-	-	01
- GHG V/ VBs	-	-	02
පරීක්ෂණ මණ්ඩල	02	01	01
GLP	01	-	-

2.3 විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රතීතනය, නව්‍ය සහ අනිවාර්ය නොවන මූලාරම්භයක් වීම හේතුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් විවිධ මට්ටම් අනුව, විවිධාකාරයෙන් ප්‍රතීතන සහ අනුකූලතා තක්සේරු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කෙරේ. පසුගිය වසර තුන තුළ එලෙස සිදුකළ කාර්යයන්හි සාරාංශයක් පහත දක්වා ඇත.

විද්‍යාව ප්‍රචලිත කිරීම



2.4 මූල්‍යමය ආයෝජන

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සඳහා භාණ්ඩාගාරයෙන් ඉතා අවම අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කෙරේ. ක්‍රියාකාරකම් බහුතරයක් උපයනු ලබන ආදායමෙන් සිදුකෙරේ. පසුගිය වසර තුන තුළ, වාර්ෂිකව රුපියල් මිලියන දෙකක මුදලක් ප්‍රාග්ධන වියදම් ලෙස ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත වෙන්කර දෙනු ලැබූ අතර, එම සමස්ත වෙන්කිරීම් ප්‍රමාණයම ප්‍රතීතනය සහ වෙනත් අදාළ ආයෝජනයන් සඳහා යොදාගැනේ.



3. 2018 වසර සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෛද්‍ය රසායනාගාර සඳහා නව අනුකූලතා තක්සේරු වැඩසටහන් පැවැත්වීම.
- වාහන දුම් පරීක්ෂාව සහ පිරිස් සහතිකකරණ මණ්ඩල සඳහා ප්‍රතීතන වැඩසටහන පුළුල් කිරීම
- පුහුණු ආයතන, PT සේවා සපයන්නන් සහ යහපත් විද්‍යාගාර පිළිවෙත් සඳහා නව ප්‍රතීතන වැඩසටහනක් පැවැත්වීම.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)

1. පසුබිම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC) 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත මඟින් ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. ශ්‍රී ලංකීය නව නිපැයුම් හා ඒවායේ නිෂ්පාදනය, සහ ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ නිර්මාණශීලිත්වය ප්‍රවර්ධනය සහ දිරිගැන්වීමත්, "නව නිපැයුම් සහ නවෝත්පාදනයන් හරහා සෞභාග්‍යය" යන දැක්ම යටතේ ක්‍රියාත්මක වීමත් යන පුළුල් අභිමතාර්ථයන් සපුරාගැනීමේ අභිලාෂයෙන් මෙම කොමිසම ස්ථාපනය කරනු ලැබ ඇත.

2. ප්‍රගතිය

2.1 මානව සම්පත් සවිය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් නව නිපැයුම් හා නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම උදෙසා පහත දක්වා ඇති මානව සම්පත පදනම් කර ගනිමින්, ක්‍රියාත්මක වේ.



2.2 නවෝත්පාදන සහ නව නිපැයුම් ප්‍රවර්ධනය

නව නිපැයුම් සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීමේ වගකීම දරණ ආයතනය ලෙස ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් වර්ෂය මුළුල්ලේ විවිධ මූලාරම්භයන් ගණනාවක් නියුක්ත විණි. මෙම කාලච්ඡේදය තුළ එලෙස නියුක්ත වූ මූලාරම්භයන්හි සාරාංශයක් පහතින් දැක්වේ.

2.2.1 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ප්‍රකාශයට පත්කිරීම

සිය ඉතිහාසයේ ප්‍රථම වරට, ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් උදෙසා ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනයක්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ ප්‍රකාශයට පත්කිරීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකි වී ඇත. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස්වරයා වූ විශිෂ්ට ශ්‍රී ලාංකික ඉංජිනේරුවෙකු, මෙන්ම නව නිපැයුම්කරුවකු වූ ආචාර්ය ඒ.එන්.එස් කුලසිංහ මැතිතුමාගේ ජන්ම දිනය වන ඔක්තෝම්බර් 26 දින, ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

2.2.2 නව නිපැයුම්කරුවන් සඳහා හැඳුනුම්පත් (ID) නිකුත් කිරීම

ගරු විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යතුමන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ, ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් වෙත හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකිවිණි. මෙම වැඩසටහන් පසුගිය වසරේදී ක්‍රියාත්මක කරනු ලැබූ අතර, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ සංකේතයක් ලෙස 2016 ජාතික නව නිපැයුම්කරුවන්ගේ

දිනයේදී ප්‍රථම හැඳුනුම්පත් නිකුත් කරන ලදි. මෙම කාලච්ඡේදය තුළ, කාණ්ඩ පහක් යටතේ නව නිපැයුම්කරුවන් සඳහා හැඳුනුම්පත් 126 ක් නිකුත් කරනු ලැබ ඇත.

2.2.3 සහසක් නිමැවුම් - 2016

සහසක් නිමැවුම් යනු ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ නව නිපැයුම් උදෙසා සංවිධානය කෙරෙනු ලබන ජාතික ප්‍රදර්ශනයකි. සම්මාන ප්‍රදානය සඳහා නව නිපැයුම්කරුවන් තරඟකාරී ක්‍රියාවලියක් හරහා තෝරා ගැනේ. 2016 වසරේ සැප්තැම්බර් මස පවතවනු ලැබූ සහසක් නිමැවුම් - 2016 සඳහා පළාත් මට්ටමින් නව නිපැයුම් 299 ක් සහ ජාතික මට්ටමින් නව නිපැයුම් 71 ක් ඉදිරිපත් කෙරිණි.

සහසක් නිමැවුම් - 2016

2.2.4 ඉනෝවා මයින්ඩ්ස් 2017 (Innova Minds 2017)

ඉනෝවා මයින්ඩ්ස් යනු, පාසල් මට්ටමින් නව නිපැයුම් සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය අරමුණු කරගනිමින් ශිෂ්‍ය නව නිපැයුම්කරුවන් උදෙසා පවත්වනු ලැබූ රූපවාහිනී රියැලිටි වැඩසටහනකි. මෙම වැඩසටහන 2017 පෙබරවාරි මස සිට මැයි මස දක්වා ජාතික රූපවාහිනිය හරහා විකාශනය කෙරිණි. දිවයින පුරා විසිරී සිටින ශිෂ්‍ය නව නිපැයුම්කරුවන් වෙතින් ලද අයැදුම්පත් 76 ක් අතුරින්, 21 දෙනෙකු තෝරාගනු ලැබිණි. අර්ධ අවසාන වටය සඳහා ශිෂ්‍ය නව නිපැයුම්කරුවන් හත් දෙනෙකු තෝරාගනු ලැබූ අතර අවසාන වටය සඳහා තෝරාගනු ලැබූ සිසුන් හට ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා සහභාගීවීමේ අවස්ථා හිමි කරදෙනු ලැබිණි.

2.2.5 සහසක් නිමැවුම් - 2017

පූර්වයෙන් පවත්වනු ලැබූ සහසක් නිමැවුම් ප්‍රදර්ශනයන්හිදී මෙන්ම, මෙම ප්‍රදර්ශනයේදී ද, පළාත් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා නව නිපැයුම් තෝරා ගැනීම කාණ්ඩ හතරක් යටතේ සිදු කෙරිණි. විවෘත, විශ්වවිද්‍යාල සහ තෘතීය අධ්‍යාපනික ආයතන, වාණිජමය නව නිපැයුම් සහ පාසල් යනු එම කාණ්ඩ හතරය. මෙම ප්‍රධාන කාණ්ඩ හතර යටතේ පළාත් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා තෝරාගනු ලැබූ නව නිපැයුම් සංඛ්‍යාව පහත වගුවෙන් දක්වා ඇත. මෙයට අමතරව ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLASS) මඟින් සංවිධානය කරනු ලබන නව නිපැයුම් ප්‍රදර්ශනය, කෘෂි පීඨයේ උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය -2016 (FAURS) ශ්‍රී ලංකා යුධ හමුදාව මඟින් සංවිධානය කරනු ලැබූ නව නිපැයුම් ප්‍රදර්ශනයන්හිදී තෝරාගත් නව නිපැයුම්කරුවන් හට සහ ඉනෝවා මයින්ඩ් රියැලිටි රූපවාහිනී වැඩසටහන මඟින් තෝරාගනු ලැබූ නව නිපැයුම්කරුවන් හට සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා සහභාගීවීමේ අවස්ථාව ලබා දෙන ලදි. මෙම සියලු නව නිපැයුම් ජාතික මට්ටමේ විනිශ්චයකරුවන්ගේ සංචිතයක් විසින් ඇගයීමට ලක්කරනු ලැබිණි. 2017 සැප්තැම්බර් මස අවසන් සතියේදී සහසක් නිමැවුම් - 2017 සාර්ථකව නිමාවට පත්විය.

කාණ්ඩය	තොරාගනු ලැබූ මුළු නව නිපැයුම් සංඛ්‍යාව
විවෘත	95
විශ්වවිද්‍යාල සහ තෘතීය අධ්‍යාපන ආයතන	41
වාණිජමය නව නිපැයුම්	14
පාසල්	248



2.2.6 ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය

සහසක් නිමැවුම් තරගාවලියේදී සම්මාන හිමිකර ගැනීමට සමත් වූ නව නිපැයුම්කරුවන් හට, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි මූල්‍යමය සහායය යටතේ ජාත්‍යන්තර ප්‍රදර්ශනයන් සඳහා සහභාගී වීමේ අවස්ථාව හිමි වේ. එවැනි මූලාරම්භයන්හි සාරාංශයක් පහතින් දක්වා ඇත.

ප්‍රදර්ශනයේ නම	පැවැත්වුණු රට	සහභාගී වූවන්	හිමිකරගත් සම්මාන
2016 සැප්තැම්බර් 06 සිට 08 දක්වා පැවැත්වුණු තෙවැනි ජාත්‍යන්තර තරුණ නව නිපැයුම්කරුවන්ගේ සම්මාන	ඉන්දුනීසියාවේ ජකර්තා නුවර	''ඉනෝවා මයින්ඩ්ස් - 2016'' තරඟයේ අවසන් වටය සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍ය නව නිපැයුම්කරුවන් සිව් දෙනෙකු	
2016 සැප්තැම්බර් 09 සිට 11 දක්වා පැවැත්වුණු ඉන්දියානු ජාත්‍යන්තර නවෝත්පාදන වෙළඳ ප්‍රදර්ශනය	ඉන්දියාවේ බැංගලෝර් නුවර	ජනාධිපති / ජාතික සම්මාන හිමිකරගත් නව නිපැයුම්කරුවන් පස් දෙනෙකු	එක් රිදී පදක්කමක් සහ ලෝකඩ පදක්කම් දෙකක්
2016 නොවැම්බර් මසදී පැවැත්වූ නව වන ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනය	චීනයේ කුන්ෂාන් නුවර	ජනාධිපති සම්මාන හිමිකරගත් නව නිපැයුම්කරුවන් දෙදෙනෙකු	රන් පදක්කමක් සහ රිදී පදක්කමක්
2016 දෙසැම්බර් 01 සිට 04 දක්වා, පැවැත්වුණු සියෝල් ජාත්‍යන්තර නව නිපැයුම් වෙළඳ ප්‍රදර්ශනය	දකුණු කොරියාවේ සියෝල් නුවර	රන් සම්මාන හිමිකරගත් විශ්වවිද්‍යාල ශිෂ්‍ය නව නිපැයුම්කරුවන් තිදෙනෙකු	ලෝකඩ පදක්කම් දෙකක් සහ එක් විශේෂ සම්මාන සහතිකයක්

2016 දෙසැම්බර් 09 සිට 11 දක්වා පැවැත්වුණු කැඹිසියුන්ග් ජාත්‍යන්තර සහ නිර්මාණ ප්‍රදර්ශනය - 2016	තායිවානයේ කැඹිසියුන්ග් නුවර	2016 සහසක් නිමැවුම් ප්‍රදර්ශනයේදී රන් සම්මාන හිමිකරගත් තරුණ නව නිපැයුම්කරුවන් දෙදෙනෙකු	රන් පදක්කමක් සහ රිදී පදක්කමක්
2017 පෙබරවාරි මසදී පැවැත්වුණු 2017 බැංකොක් ජාත්‍යන්තර බුද්ධිමය දේපළ, නව නිපැයුම්, නවෝත්පාදන සහ තාක්ෂණ ප්‍රදර්ශනය	තායිලන්තයේ බැංකොක් නුවර	2016 සහසක් නිමැවුම් ප්‍රදර්ශනයේදී රන් සම්මාන හිමිකරගත් තරුණ නව නිපැයුම්කරුවන් සිව් දෙනෙකු	රන් සම්මානය සහ රිදී සම්මාන තුනක් සමඟ පිලිපීන රන් සම්මානය
2017 අප්‍රේල් මස පැවැත්වුණු ජාත්‍යන්තර නවෝත්පාදන ප්‍රදර්ශනය	ජිනීවා	2016 සහසක් නිමැවුම් ප්‍රදර්ශනයේදී, ප්‍රථම සහ දෙවන ස්ථාන හිමිකරගත් ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් හත් දෙනෙකු	ජූරියේ විශේෂ ඇගයීම් දෙකක් සමඟ රන් පදක්කම් තුනක්, රිදී පදක්කම් දෙකක් සහ ලෝකඩ පදක්කම් දෙකක්
2017 වසරේදී පැවැත්වුණු 28 වෙනි ජාත්‍යන්තර නව නිපැයුම්, නවෝත්පාදන සහ තාක්ෂණ ප්‍රදර්ශනය	මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවර	2016 සහසක් නිමැවුම් ප්‍රදර්ශනයේදී රන් සම්මාන හිමිකරගත් තරුණ නව නිපැයුම්කරුවන් සිව් දෙනෙකු	රන් පදක්කමක් සමඟ කනිෂ්ඨ නව නිපැයුම්කරු සම්මානය සහ රිදී පදක්කම් දෙකක්
2017 ජපාන නව නිපැයුම් සහ නිර්මාණ ප්‍රදර්ශනය	ජපානයේ ටෝකියෝ නුවර	Palmyrah Ingenuity - 2017 සඳහා විශිෂ්ට සම්මානය හිමිකරගත් නව නිපැයුම්කරු	රිදී පදක්කම
2017 අගෝස්තු 08 සිට 10 දක්වා පැවැත්වුණු කොරියානු ජාත්‍යන්තර යොවුන් ඔලිම්පියාඩ් තරඟය	කොරියාවේ ග්යෙන්ජු නුවර	"ඉනෝවා මයින්ඩ්ස් - 2017" තරඟයේ අවසන් වටය සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍ය නව නිපැයුම්කරුවන් 12 දෙනෙකු	රන් පදක්කමක්, රිදී පදක්කමක්, හොඳම නව නිපැයුම් සඳහා හිමිවන FIRI සම්මානය සහ මැද පාසල් කාණ්ඩයේ විශේෂ සම්මාන තුනක්

2.2.7 ජාත්‍යන්තර පිළිගැනීම

ලෝකයේ කීර්තිමත් ජාත්‍යන්තර නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධන සංවිධාන දෙකක සාමාජිකත්වය ලබාගැනීම හරහා සිය ජාත්‍යන්තර සහයෝගීතාවයන් ශක්තිමත් කර ගැනීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව උදාවිණි. එම සංවිධාන වනුයේ,

1. නව නිපැයුම්කරුවන්ගේ සංගම්හි ජාත්‍යන්තර එකමුතුව (IFIA)
2. ලෝකයේ නවෝත්පාදන සහ බුද්ධිමය දේපළ සංගම් (NIIPA)

Certificate of Membership
This is to certify that
Sri Lanka Inventors Commission
is the member of
World Invention Intellectual Property Associations
for the period of
July 2016 - June 2017
President
Hsieh, Hsin - Ming
World Invention Intellectual Property Associations

IFIA
Membership Certificate
It is hereby certified that
Sri Lanka Inventors Commission
from Sri Lanka
Dr. C. Mahesh Edirisinghe

2.2.8. තාක්ෂණ සහ නවෝත්පාදන සහායක මධ්‍යස්ථානය (TISC)

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් තාක්ෂණ සහ නවෝත්පාදන සහායක මධ්‍යස්ථාන හරහා, සහසක් නිමැවුම් ජාතික නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා සහභාගී වන නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් හිමිකම් සුරක්ෂිත කරනු පිණිස දේශීය පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කිරීමට සහායය ලබාදීමේ කාර්යයෙහි නිරතව සිටී. 2017 අගෝස්තු මස අවසානය දක්වා කොමිසම හරහා දේශීය පේටන්ට් බලපත්‍ර 30ක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලැබ ඇත. වෛද්‍ය, මහජන ආරක්ෂණ සහ සුබසාධන, ඉංජිනේරු, ප්‍රවාහන යන ක්ෂේත්‍රයන්හි නව නිපැයුම් පහක් වාණිජකරණය සිදුකෙරිණි.

2.2.9. නව නිපැයුම්කරුවන්ගේ අරමුදල

''Invent 2016'' වැඩසටහන යටතේ නව නිපැයුම්කරුවන්ගේ අරමුදලින් අරමුදල් ප්‍රදානය සඳහා නව නිපැයුම්කරුවන් තිදෙනෙකු තෝරාගනු ලැබ ඇත. ''Invent 2017'' වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවනු ලැබූ අතර තෝරාගැනීමේ ක්‍රියාවලිය දැනට සිදු කෙරෙමින් පවතී.

2.3 මූල්‍යමය ආයෝජනය

නව නිපැයුම් සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධන උදෙසා රජය විසින් පසුගිය වසර තුන තුළ සිදුකරනු ලැබූ මූල්‍ය අයෝජනයන් පහත දක්වා ඇත.



3. 2018 වසර සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- ජාත්‍යන්තර ප්‍රදර්ශනයක් දක්වා ''සහසක් නිමැවුම් ජාතික ප්‍රදර්ශනය'' උසස් කිරීම
- නව නිපැයුම්කරුවන් සඳහා සහායක බීජෞෂණ මධ්‍යස්ථාන සේවා
- නවෝත්පාදන කඩිනම් කිරීමේ මූල්‍යාධාර ලබාදීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

සී/ස ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතන (පෞද්.) සමාගම (SLINTEC)

1. පසුබිම

සී/ස ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතන (ස්ලින්ටෙක්) පෞද්ගලික සමාගම යනු, ශ්‍රී ලංකා රජය සහ MAS, බ්‍රැන්ඩික්ස්, හේලීස්, ඩයලොග් ඇක්සියාටා, ලෝඩ් ස්ටාර් සහ ලන්කෙම් යන ප්‍රමුඛ පෙළේ පෞද්ගලික අංශයේ සමාගම් හයක් සමඟ ඇති කරගනු ලැබූ රාජ්‍ය - පෞද්ගලික සහයෝගිතාවය තුළින් ස්ථාපිත පෞද්ගලික සමාගමකි. මෙහි 50% ක කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකා රජයද ඉතිරි 50% ක කොටස්, පෞද්ගලික අංශයේ සමාගම් හය විසින්ද දරනු ලැබේ. ශ්‍රී ලංකාවේ නිනිති තාක්ෂණ සහ උසස් තාක්ෂණ ක්ෂේත්‍රය හා නිනිති තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා පර්යේෂණ හා සංවර්ධන කේන්ද්‍රස්ථානය වන විද්‍යා උද්‍යානය වැඩි දියුණු කිරීමේ කාර්යය, ස්ලින්ටෙක් වෙත පැවරී ඇත. ස්ලින්ටෙක් විසින්, දේශීය නිෂ්පාදනයන් ලෝක වෙළඳපළෙහිදී වඩා තරඟකාරී තත්ත්වයකට පත් කරවීම සඳහා නිනිති තාක්ෂණය සහ උසස් තාක්ෂණය යොදා ගැනීමටත්, ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සඳහා වටිනාකම් එක් කිරීමටත් අවධානය යොමුකොට ඇත.

2. ප්‍රගතිය

2.1 මානව සම්පත් සවිය

ඉහත කාර්යයන් සපුරාලීමේ අරමුණින්, පහත මානව සම්පත් පදනම භාවිතයෙන් ස්ලින්ටෙක් ආයතනය ක්‍රියාත්මක වේ.



2.2 පර්යේෂණ යොමුව

ආරම්භයේ සිටම ජාත්‍යන්තර මට්ටමේ නවෝත්පාදන වේදිකාවක් නිර්මාණය කිරීමට ස්ලින්ටෙක් විසින් මහත් පරිශ්‍රමයක් දරණ ලද අතර ඒ හරහා ශ්‍රී ලංකා පර්යේෂණ සහ සංවර්ධන කර්මාන්ත ක්ෂේත්‍රයේ

වෙනස්කම් ඇති කිරීම සහ ජාතික ආර්ථික සංවර්ධනය සඳහා සැලකිය යුතු අන්දමේ දායකත්වයක් ලබාදීමත් අරමුණු කර ගැණිනි. ස්ලින්ටෙක් විසින් සිදුකෙරෙන පර්යේෂණ බොහෝමයක් ව්‍යාවහාරික සහ කොන්ත්‍රාත් පර්යේෂණ වන අතර රටෙහි ඛනිජ සම්පත් හා අදාළ පර්යේෂණයන් මූලික පර්යේෂණ මට්ටමට සීමා වී ඇත. ස්ලින්ටෙක් විසින් පසුගිය වසර තුන තුළ විවිධ ක්ෂේත්‍රයන්හි සිදුකළ පර්යේෂණයන් පහත දක්වා ඇත.





2.3 පර්යේෂණ වාණිජකරණය

සෑම පර්යේෂණ ක්ෂේත්‍රයක් හා අදාළවම පර්යේෂණ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම, ස්ලින්ටෙක් විසින් නිරතුරුව සිදුකරනු ලබන්නකි. ඒ අනුව, පර්යේෂණ වාණිජකරණය කිරීමටත්, වැඩිදුර පර්යේෂණ ක්ෂේත්‍රයන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ කොන්ත්‍රාත්තු ආරම්භ කිරීමටත් ස්ලින්ටෙක් ආයතනයට හැකියාව ලැබී ඇත. පසුගිය වසර තුන ඇතුළත සිදුකරනු ලැබූ පර්යේෂණ වාණිජකරණය පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.



සිදුකරනු ලැබූ පර්යේෂණයන්හි ප්‍රතිඵලයක් ලෙස, ඉතා කෙටි කාලසීමාවක් තුළදී ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට ස්ලින්ටෙක් ආයතනයට හැකියව ලැබී ඇත. අයදුම් කරනු ලැබූ සහ ලබාගත් පේටන්ට් බලපත්‍රයන්හි සාරාංශයක් පහතින් දක්වා ඇත.





පසුගිය වසර තුන තුළ, රබර් සහ රෙදිපිළි කර්මාන්ත ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර දෙකක් ලබා ගැනීමට ස්ලින්ටෙක් ආයතනයට හැකියාව ලැබී ඇත.

පර්යේෂණ සංස්කෘතිය සහ ස්ලින්ටෙක් පර්යේෂකයින්ගේ ධාරිතාවයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දේශීය සහ ජාත්‍යන්තර ජර්නලයන්හි පත්‍රිකා පළ කිරීම සඳහා ඔවුන්ව දිරිගැන්වීමට, ස්ලින්ටෙක් ආයතනය විසින් අඛණ්ඩව පියවර ගැනේ. පසුගිය වසර තුන තුළ, ස්ලින්ටෙක් විසින් ජාත්‍යන්තරව විනිශ්චය කෙරෙන

ජර්නලයන්හි සිය පත්‍රිකා සියල්ල පළ කිරීමට පියවර ගෙන ඇත. මෙම ප්‍රතිකා සියල්ලම නිනිති තාක්ෂණය පදනම් කරගත් ප්‍රකාශනයන් හා අදාළව සිදු කෙරිණි. පසුගිය වසර තුන තුළ පළකරනු ලැබූ ප්‍රකාශයන්හි සාරාංශයක් පහතින් දැක්වේ.



2.4 වෙනත් පර්යේෂණ සංවර්ධන මූලාරම්භයන්

- ඉතා දැඩි අවශ්‍යතාවයක්ව පැවති තාක්ෂණ බීජෞෂණ මධ්‍යසථානයක් ස්ථාපනය කරගැනීමට, 2016 අගෝස්තු මසදී, ස්ලින්ටෙක් ආයතනයට හැකියාව ලැබිණි. තාක්ෂණ බීජෞෂණ මධ්‍යස්ථානය තුළ දැනටමත් සිය පර්යේෂණ විද්‍යාගාරය සඳහා ඉඩකඩ කුලී පදනම මත වෙන්කරගත් එක් ආයතනයක් ක්‍රියාත්මක වන අතර ස්ලින්ටෙක්හි පොහොර නිෂ්පාදන පහසුකම සහ මිනිරන් බලාගාරයද එය තුළ ක්‍රියාත්මක වේ.
- ජල වගාව සහ තෙතමනය සහිත වායු පරිසරයකදි සිදු කරනු ලැබූ බෝග වගාව පිළිබඳ වීන කෘෂිකාර්මික විශේෂඥයින් සමඟ සහයෝගීතාවයෙන් ඉදිකරනු ලැබූ අති නවීන හරිතාගාරය 2017 මැයි මසදී විවෘත කරන ලදි.
- වාණිජමය වශයෙන් ලබාගත හැකි සංරචකයන් මත පදනම් වූ අඩුවියදම් ජල පෙරනයන් වැඩිදියුණු කොට උග්‍ර වකුගඩු රෝගය පවතින ප්‍රදේශයන් වෙත කඩිනමින් බෙදා දීම සඳහා, කර්මාන්ත ක්ෂේත්‍රයේ හවුල්කරුවෙකු අපේක්ෂාවෙන් පසුවේ.
- නිනිති තාක්ෂණ සහ විද්‍යා උද්‍යානයේ දෙවැනි ෂඩාස්‍රයේ අදියර 1 b හි ඉදිකිරීම් කටයුතු දැනට සිදුකෙරෙමින් පවති.

තාක්ෂණ බීජෞෂණ

හරිතාගාරය


යෝජිත අදයර 1 b

- පෞද්ගලික දායකයින් වෙතින් ලබාගත් රුපියල් මිලියන 33 ක් මඟින් අනුරක්ෂණ භාරකාර අරමුදලක් පිහිටුවා ඇත. රුපියල් මිලියන 25 ක් ප්ලැටිනම් අනුග්‍රාහකයෙකු වෙතින්ද, රුපියල් මිලියන පහක් රිදී අනුග්‍රාහකයෙකු වෙතින්ද ''Bride for Science'' වැඩසටහන සඳහා රුපියල් මිලියනයක් බැගින් දායකයින් තිදෙනෙකු වෙතින්ද මේ සඳහා අනුග්‍රාහකත්වය ලැබිණි. තවත් අනුග්‍රාහකයෙකු විසින් භාරකාර අරමුදල සඳහා රුපියල් මිලියන 15 ක් ලබාදී ඇත.
- පාඨමාලා සහ පර්යේෂණ මත පදනම්ව දර්ශනපති සඳහ ආචාර්ය උපාධීන් පිරිනැමීම සඳහා ස්ලින්ටෙක් ඇකඩමිය වෙත ලියාපදිංචිය ප්‍රදානය කොට ඇත. ස්ලින්ටෙක්හි පවතින අති නවීන උපකරණ

භාවිතයෙන්, විද්‍යාත්මක පර්යේෂණයන්හි ජාතික ධාරිතාවය ඉහළම ජාත්‍යන්තර තත්ත්වය කරා රැගෙන යාමට, ආයතනයට මෙම මූලාරම්භය හරහා හැකියාව ලැබෙනු ඇත.

- අපනයන සංවර්ධන මණ්ඩලය හා සහයෝගීතාවයෙන්, අපනයන ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් සඳහා විද්‍යා සායන පැවැත්වේ.

2.5 තාක්ෂණික සේවා සැපයීම





2.6 මූල්‍යමය ආයෝජන

රාජ්‍ය - පෞද්ගලික සමාගමක් ලෙස, ස්ලින්ටෙක්හි පුනරාවර්තන වියදම් රජය මඟින් මූල්‍යනය කෙරේ. පසුගිය වසර තුන තුළ, ස්ලින්ටෙක්හි ක්‍රියාකාරකම් සඳහා රජය විසින් සිදුකළ මූල්‍යමය ආයෝජනයන්හි සාරාංශයක් පහත දක්වා ඇත.



3. 2018 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකරකම්

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සහයෝගීතාවයෙන්, නැනෝ පොහොර පිළිබඳ ගොවීන් යොදාගනිමින් පරීක්ෂාවන් සිදුකිරීම
- උසස් හරිතාගාර පරිසරයක් සොයාගනිමින්, චීන හවුල්කරුවන් සමඟ සහයෝගීතාවයෙන් , දිග වගාව තෙතමනය සහිත වායු පරිසරයකදී සිදුකරන බෝග වගාව සහ බීජ පැළ නැවත සිටුවීම යනාදිය ඇතුළත් කෘෂිකාර්මික තාක්ෂණයන් වැඩිදියුණු කිරීම
- පෝෂණීය ආහාර අතිරේක/ ස්වභාවික ඖෂධ සඳහා නැනෝ පරිමාණ ආවරණ යොදාගනිමින් ඉලක්කගත ඖෂධ ලබාදීම.
- මඤ්ඤොක්කා ඇසුරෙන් නිස්සාරණය කරගත් සංයෝගයන්හි පිළිකා නාශක ගුණාංගයන් පිළිබඳ සිදුකෙරෙන අධ්‍යයනයන් වැඩිදියුණු කිරීම සඳහා ලබාදීමේ ක්‍රමවේදයන් පරිවර්තනය කිරීම
- ග්‍රැෆීන් බවට පත්වීම අවම කරමින් ග්‍රැෆීන් ඔක්සයිඩ නිෂ්පාදනය කිරීමේ නියාමන මට්ටමේ නිෂ්පාදනය කිරීමේ කාර්යය වැඩිදියුණු කිරීම
- ඉල්මනයිට් සහිත ලෝහ පසෙන් ටයිටේනියම් ලබාගැනීම සඳහා වැඩිදියුණු කරන ලද හිමිකම් ක්‍රියාවලිය ඇගයීමට ලක්කිරීම
- මොනසයිට් ඇසුරින් දුර්ලභ පස්වර්ග සහ තෝරියම් නිස්සාරණය කිරීමේ සහ එහි ඵලදාව ප්‍රමාණාත්මකව නිශ්චය කිරීමේ පර්යේෂණ සිදුකෙරෙනු ඇත. නිස්සාරණය කරගත් තෝරියම් ඔක්සයිඞ්ද න්‍යෂ්ටික ඉන්ධන මට්ටමේ පිරිවිතරයක් ලබා ගැනීම සඳහා පවිත්‍රකරණය කෙරෙනු ඇත.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හවුල්කරුවකුගේ සහයෝගීතාවයෙන් මුරුන්කන් මැටි නිනිති මැටි (මොන්ට්මොරිලොනයිට්) බවට පවිත්‍රකිරීම සඳහා නියාමක බලාගාරයක් ඉදිකිරීම.
- පරිසර විද්‍යාත්මකව තිරසර වල්නාශක සංස්ලේෂණය කිරීම සහ එහි අතුරුඵලයක් ලෙස ඖෂධ නිෂ්පාදනයක් ලබාගැනීම සඳහා නව ක්‍රියාවලියක් වැඩිදියුණු කිරීම
- ශ්‍රී ලංකාවේ ප්‍රථම ක්‍රියාකාරී ඖෂධ විද්‍යාත්මක අමුද්‍රව්‍ය නිෂ්පාදන බලාගාරයක් ආරම්භ කිරීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදකයින් සඳහා ක්‍රියාකාරී ඖෂධ විද්‍යාත්මක අමුද්‍රව්‍ය ලබාදීම.
- ස්ලින්ටෙක් මුද්‍රිත සහ නම්‍යශීලී ඉලෙක්ට්‍රොනික විද්‍යා පර්යේෂණාගාරය
- එප්පාවල පාෂාණ පොස්පේට් (ERP) දිය කීරීම සඳහා ජෛව සංස්ලේෂක මාර්ග
- පිළිකා නාශක ගුණාංග පිළිබඳ අධ්‍යයනය කිරීම සහ සඵලතා මට්ටම සහ විෂ සහිතභාවය පිළිබඳ ප්‍රමාණාත්මක නිශ්චය කිරීම සඳහා නිනිති වෛද්‍ය විද්‍යාත්මකව ලිනමරින් සම්පාදනය කිරීමේ පර්යේෂණ වැඩසටහන

ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

1. පසුබිම

1965 පෙබරවාරි මසදී පවත්වනු ලැබූ කර්මාන්ත ප්‍රදර්ශනයේදී ආකර්ශනය දිනාගත් එක් අංගයක් ලෙස කොළඹ 07, ස්ටැන්ලි විජේසුන්දර මාවතේ ස්ථාපනය කොට ඇති ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය ආරම්භ කෙරිණි. කළුලැල්ලක් පමණක් භාවිතයෙන් පැහැදිලි කිරීම දුෂ්කර, තාරකා විද්‍යාත්මක සංසිද්ධීන් පැහැදිලි කිරීමේ ඉතාම ඵලදායී ක්‍රමවේදයක් ග්‍රහලෝකාගාරය මඟින් සලසා දේ. ග්‍රහලෝකාගාර දර්ශන, ජංගම ග්‍රහලෝකාගාර ඉදිරිපත් කිරීම්, රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු වැනි එළිමහන් වැඩසටහන්, සහ ඇස්ට්‍රො IT ඒකකය හරහා විශ්වය පිළිබඳ ගැඹුරු දැනුමක් ප්‍රේක්ෂකයන් වෙත ලබාදීමට මෙය ඉවහල් වේ. ග්‍රහලෝකාගාර දර්ශන පාසල් සිසුන්ට මෙන්ම මහජනතාවටද විවෘතව ඇත. එය වනාහී එකම වහළක් යට, සුවපහසුව හිඳිමින් විශ්වයේ අසිරිය විඳගැනීමේ අවස්ථාව යමෙකුට උදාකරදෙන අපූර්ව ස්ථානයකි. වත්මන වන විට නව 4D පූර්ණ අර්ධගෝලාකාර ප්‍රක්ෂේපන යන්ත්‍ර පද්ධතිය හරහා ග්‍රහලෝකාගාර දර්ශන වඩා විශිෂ්ට අයුරින් ඉදිරිපත් කිරීමේ හැකියාව උදාවී ඇත. අර්ධ ගෝලාකාර තිරය මත පෘථිවිය කේන්ද්‍රගතව, අභ්‍යවකාශයේ තාරකා විද්‍යාත්මක තොරතුරු ගණිතමය වශයෙන් ඉතා නිරවද්‍යතාවයෙන් යුතුව ඉදිරිපත් කිරීමේ හැකියාව සහිතව නිපදවන ලද තාරකා විද්‍යා අනුකාරක මෘදුකාංග වලින් මෙම නව පද්ධතිය සමන්විතය.

2. ප්‍රගතිය

2.1. මානව සම්පත් සවිය



2.2. විද්‍යාව ප්‍රචලිත කිරීම

තාරකා විද්‍යාව ප්‍රචලිත කරවීමේ ප්‍රධාන අරමුණු ඇතිව, ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය විසින්, 2017 වර්ෂය තුළදී, විවිධ ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කරනු ලැබිණි. ඒ සඳහා ග්‍රහලෝකාගාර දර්ශන, රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු, ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ සහ ප්‍රාථමික සහ ද්විතීයික මට්ටමේ තාරකා විද්‍යා පංති පවත්වනු

ලැබිණි. තාරකා විද්‍යාව ප්‍රවර්ධනය උදෙසා ග්‍රහලෝකාගාරය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ක්‍රියාකාරකම්හි සාරාංශයක් පහතින් දක්වා ඇත.



ඉහත වැඩසටහන් හරහා ලැබුණු දිරිගැන්වීම හේතුවෙන්, ග්‍රහලෝකාගාරය වෙත වාර්ෂිකව පැමිණෙන නරඹන්නන්ගේ සංඛ්‍යාව ඉහළ ගොස් ඇති අතර ඒ අනුව උපයාගත් ආදායමද ඉහළ ගොස් ඇත. විවිධ කාණ්ඩ යටතේ කාණ්ඩගත කළ නරඹන්නන්ගේ සහ පසුගිය වසර තුන තුළ උපයාගත් ආදායමෙහි සාරාංශයක් පහත දක්වා ඇත.





මෙයට අමතරව, තාරකා විද්‍යාත්මකව ඔලිම්පියාඩ් තරඟ සඳහා සිසුන් පුහුණු කිරීමද ග්‍රහලෝකාගාරය විසින් සිදුකරනු ලබයි. පසුගිය වසර තුන තුළ, එලෙස ඔලිම්පියාඩ් තරඟය සඳහා සිසුන් 236 දෙනෙකු සූදානම් කළ අතර සිසුන්හට රන් පදක්කම් තුනක්ද, රිදී පදක්කම් හතරක්ද, සහ ලෝකඩ පදක්කම් 27ද දිනාගැනීමට හැකියාව ලැබී ඇත. මෙයට අමතරව කුසලතා සම්මානද සිසුන් විසින් හිමිකර ගෙන ඇත.

ළමුන් සඳහා තාරකා විද්‍යා පාඨමාලා

3. 2018 වර්ෂය සඳහා සැලසුම් කරනු ලැබ ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

- පූර්ණ අර්ධගෝල තිරය මත ප්‍රදර්ශනය කරනු ලබන තාරකා විද්‍යාත්මක චිත්‍රපට, සෞරග්‍රහ මණ්ඩල හඳුන්වාදීම ඇතුළත් ග්‍රහලෝකාගාර දර්ශන
- ජංගම ග්‍රහලෝකාගාරය සහ රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු
- සූර්යග්‍රහණ, චන්ද්‍රග්‍රහණ, වල්ගාතරු, ග්‍රහතාරකා සංක්‍රාන්ති, හිරුළප සහ උල්කා වර්ෂා වැනි ස්වභාවික සංසිද්ධීන් පිළිබඳ විශේෂ කඳවුරු
- විශ්වවිද්‍යාල සහ පාසල්හි පවත්වනු ලබන විද්‍යා වැඩමුළු සහ ප්‍රදර්ශන
- Astro Kids වැඩසටහන - ක්‍රියාකාරකම් මත පදනම් වූ පාඨමාලා
- 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පාසල් සිසුන් සඳහා Astro IT පාඨමාලා
- තාරකා විද්‍යා ක්‍රියාකාරීත්ව උද්‍යානයක් සඳහා භූමි සංවර්ධනය සහ එම උද්‍යානය ස්ථාපනය කිරීම
- ගවේෂණාගාරයක් ස්ථාපනය කිරීම

MINISTRY OF SCIENCE, TECHNOLOGY AND RESEARCH

FINANCIAL SUMMARY

CAPITAL AND RECURRENT EXPENDITURE
Upto end of October 2017

Institute	Recurrent			Capital		
	Allocation	Expenditure	% achieved	Allocation	Expenditure	% achieved
Ministry –Administration and Establishment	171.22	141.10	82	7.40	5.76	78
Ministry – Minister's Office	40.55	32.24	80	43.60	42.36	97
Ministry – State Minister's Office	28.62	18.44	64	45.88	40.16	88
Ministry- S & T Development programmes and Special Budget	476.42	374.55	79	2,747.60	725.39	26
Arthur C. Clarke Institute for Modern Technologies	130.00	100.78	78	100.00	14.52	15
Industrial Technology Institute	240.00	200.00	83	200.00	0.00	0
National Institute of Fundamental Studies	188.00	137.59	73	99.00	36.98	37
National Engineering Research and Development Centre	288.00	202.36	70	57.00	39.60	69
National Research Council	22.00	15.32	70	200.00	160.54	80
National Science and Technology Commission	30.00	18.67	62	13.75	3.05	22
National Science Foundation	136.00	94.74	70	260.00	228.00	88
Sri Lanka Accreditation Board for Conformity Assessment	20.00	12.19	61	2.00	0.85	43
Sri Lanka Inventors Commission	53.00	33.67	64	100.00	50.13	50
Sri Lanka Planetarium	19.15	13.73	72	54.00	26.23	49
Sub Total	**1,842.96**	**1,395.38**	**76**	**3,930.23**	**1,373.58**	**35**
Sri Lanka Standards Institution *	639.55	410.49	64	325.80	90.42	28
Total	**2,482.51**	**1,805.87**	**73**	**4,256.03**	**1,464.00**	**34**

*Sri Lanka Standards Institution is a self financed Organization and hence the financial details are given separately.



3 වන මහල, සෙත්සිරිපාය, 1 වන අදියර, බත්තරමුල්ල
3rd Floor, Sethsiripaya, 1st Stage, Battaramulla
3 வது மாடி, செத்சிரிபாய, முதலாம் பிரிவு, பத்தரமுல்லை